# 6 ශ්‍රේණිය

# ඉස්ලාම්

## ගුරු මාර්ගෝපදේශය

(2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)





ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

Web: www.nie.lk

Email: info@nie.lk

## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2015 වර්ෂයේ දී හය වන සහ දහ වන ශ්‍රේණි සඳහා හඳුන්වා දීම කළ යුතු ව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනා ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැඟීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම් වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පංති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාර වනු ඇත. සිසුන්ගේ නිපුණතාවන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමඟ සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමය.

මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයන් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන් හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන , පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශය ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශය හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුවද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමඟ ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**

**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**

**ජාතික අධ්‍යාපන ආයතනය.**

## විෂයමාලා කමිටුව

| | | |
|---|---|---|
| **උපදේශකත්වය හා අනුමැතිය** | : | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **විෂය සම්බන්ධීකරණය** | : | කථිකාචාර්ය, ජේ.එම්. ජෙසාර් මහතා<br>ව්‍යාපෘති නායක |
| **විෂය කමිටුව** | : | **ආචාර්ය එම්. ඒ. එම්. ෂුක්රි**<br>අධ්‍යක්ෂ, ජාමියා නලීමියා,<br>බේරුවල.<br>**අශ්ශෙක් ඒ. සී. අගාර් මොහොමඩ්**<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ, ජමියා නලීමියා,<br>බේරුවල<br>**මවුලවි, ඒ. එල්.එම්. අලියාර්**<br>නියෝජිතයා, සමස්ත ලංකා ජමියතුල් උලමා.<br>**මවුලවි, එම්. ටී. ඉක්බාල්**<br>ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය,<br>කොළඹ. |
| **ලේඛක මණ්ඩලය** | : | **අශ්ශෙක් ජේ. එම්. ජෙසාර්**<br>ජාතික අධ්‍යාපන ආයතනය.<br>**එම්. එච්. එම්. නාලිර්**<br>විශ්‍රාමලත් ගුරු.<br>**අශ්ශෙක් එම්. එස්. එම්. බුහාරි**<br>ගුරු උපදේශක, මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය.<br>**එස්. එම්. ආර්. සූදින්**<br>විශ්‍රාමලත් ප්‍රධාන ව්‍යාපෘති නිලධාරි. ජා.අ.ආ.<br>**අශ්ශෙක් එම්. එම්. පස්ලුර් රහ්මාන්**<br>උපගුරු, අලිගාර් මුස්ලිම් මහා විද්‍යාලය, කල්-එළිය.<br>**අශ්ශෙක් එස්. ඒ. එම්. රිස්වි**<br>උපගුරු, අල්-හුදා මුස්ලිම් මහා විද්‍යාලය, රිදීගම.<br>**අශ්ශෙක් එම්. එෆ්. එම්. පාහිම්**<br>ගුරු උපදේශක, මිනුවන්ගොඩ අධ්‍යාපන කලාප කාර්යාලය<br>**අශ්ශෙක් එම්. ඒ. ජෙම්සිත්**<br>උපගුරු, අල්හිදායා මහා විද්‍යාලය, කොළඹ 10.<br>**අශ්ශෙක් එම්. එස්. එම්. අනස්**<br>උපගුරු, අලුත්ගම්වීදිය ජාතික පාසල, දර්ගා නගරය. |
| **සෝදුපත් කියවීම** | : | **එම්.ආර්. නිස්තාර්**<br>උපගුරු, අල්හිදායා මහා විද්‍යාලය, කොළඹ 10. |
| **පරිගණක වදන් සැකසුම** | : | **මංගලිකා විජේරත්න මහත්මිය**<br>කළමනාකරණ සහකාර 1<br>ජාතික අධ්‍යාපන ආයතනය |

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

ඉස්ලාම් ඉගැන්වීම්වලට අනුකූල ව සාර්ථක ජීවිතයක් පවත්වා ගැනීමට සුදුසු වන පරිදි, අත්‍යවශ්‍ය නිපුණතා පාදක කොට ගෙන, පාසල් අධ්‍යාපනය හරහා එකී නිපුණතා සංවර්ධනය කර ගැනීම උදෙසා මඟපෙන්වීමට මෙම ගුරු මාර්ගෝපදේශය සකස් කර ඇත.

දැනුමින් පමණක් පෝෂිත ව, දැනුම් කේන්ද්‍රීය විභාග ක්‍රමයක් යටතේ ඉහළ සාමාර්ථයක් ලැබුව ද එය ප්‍රමාණවත් නො වේ. සාර්ථක අධ්‍යාපන ක්‍රමයක දී හිස මෙන් ම හද හා අත ද පෝෂණය වීම අත්‍යවශ්‍ය වේ. මෙම අරමුණු ද සාක්ෂාත් කර ගැනීම ගුරු මාර්ගෝපදේශය සම්පාදනයේ දී අපේක්ෂා කර ඇත.

පාඩමට ප්‍රවේශය වඩාත් වැදගත් වන බැවින් ප්‍රබෝධාත්මක ආරම්භයක් ලබා දීම වැදගත් වේ. පාඩමේ සංවර්ධනයට අදාළ කරගත හැකි යෙදවුම්, ගුණාත්මක යෙදවුම් යන්නෙන් අදහස් කෙරේ. ඒ සඳහා

- පාඩමට අදාළ ව සංයුක්ත තැටි, පරිගණකය, බහු ප්‍රක්ෂේපණ යන්ත්‍රය (Multi Media)
- පෙළ පොත, ලියන පුවරුව, කඩදාසි, විවිධ වර්ණ ඇතුළත් තීන්ත පෑන්, චලන රූප, කාන්දම් රඳවනය, පැනල් පුවරුව
- ගුරු මාර්ගෝපදේශය සමඟ ඇති සංයුක්ත තැටියේ ඇතුළත් තොරතුරු
- අදාළ කරගත හැකි වෙනත් සම්පත්

කණ්ඩායම් ක්‍රියාකාරකමක දී ශිෂ්‍ය කණ්ඩායමක සිටිය යුතු ප්‍රශස්ත සංඛ්‍යාව 07ක් ලෙස සැලකෙන බැවින් ඊට ගැළපෙන පරිදි සංවිධානය වීම වැදගත් ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී වඩාත් සුදුසු ස්ථානය තෝරා ගැනීමට ගුරුවරයා උනන්දු විය යුතු ය. පාඩමට (ක්‍රියාකාරකමට) පිවිසීමේ දී ප්‍රබෝධාත්මක ආරම්භය, පෙර අත්දැකීම් හා පාඩම පිළිබඳ කුතුහලය යන කරුණු ගැන සැලකිලිමත් වෙමින් ප්‍රදේශයේ සංස්කෘතික පසුබිම කෙරෙහි ද අවධානය යොමු විය යුතු ය.

මෙහි ඇතුළත් පාඩම්වලට යෝජිත ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය භාවිත කිරීම අනිවාර්යය නොවන අතර විකල්ප ඉගෙනුම් ක්‍රම, සුදුසු පරිදි භාවිත කළ හැකි ය. එහෙත් නිපුණතාව හා නිපුණතා මට්ටමෙන් බැහැර නොවිය යුතු ය. ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රියාවලියේ දී යහපත් ආගමික ආකල්ප වර්ධනය කෙරෙහි ද ප්‍රායෝගික අවස්ථා යොදා ගැනීම කෙරෙහි ද වැඩි අවධානයක් යොමු කරන්න.

පාඩම ආරම්භයේ සිට අවසානය දක්වා තක්සේරුව සිදු කළ යුතු අතර හැකියා නො හැකියා අනුව ප්‍රතිපෝෂණය හා ඉදිරි පෝෂණය ලබා දිය යුතු ය. කණ්ඩායම් ගවේෂණ ක්‍රියාවලියෙන් අනාවරණය කර ගන්නා ඉගෙනුම් පල අභ්‍යාස පොත්වල කෙටියෙන් සටහන් කර ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න. බොහෝ විට කාල සටහන් සැකසීමේ දී එකවිට කාලච්ඡේද දෙකක් එකවර නොලැබෙනු ඇත. එබැවින් අදාළ පාඩම කළමනාකරණය කර ගැනීම ඔබ සතු වගකීමකි. අදාළ පාඩමට අපේක්ෂිත ඇගයුම, තක්සේරුව හා ඇගයීම් නිර්ණායක අනුව ඇගයීම් සකස් කර ගන්න. ඔබ විසින් සිසුන්ට ලබා දෙන ලද අභ්‍යාසවල නිරවද්‍යතාව පරීක්ෂා කොට සටහන් තබන්න.

සෑම පාඩම් සටහනක් අවසානයේ ම යොදා ඇති ගෙදර පරිසරයෙන් යන කොටස දෙමාපිය වැඩිහිටි සහභාගිත්වය යටතේ සිදු කරන්නට යෝජිත ය. ඒ සඳහා අදාළ උපදෙස්, විදුහල්පති විසින් පාසල් සංවර්ධන සමිතියේ දී ද, විෂය භාර ගුරු භවතා විසින් පන්ති කවවල දී ද දෙමාපියන්ට හා වැඩිහිටියන්ට ලබා දීමට කටයුතු කළ යුතු ය.

**අශ්ශේක් ජේ. එම්. ජෙසාර්,**
ව්‍යාපෘති නායක

| පටුන | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | i |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | ii |
| විෂයමාලා කමිටුව | iii |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | iv |
| විෂය නිර්දේශයයේ අන්තර්ගතය | vii |
| ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1 |

# විෂය නිර්දේශය

## 1.0 විෂය හැඳින්වීම

ශරීරය, දැනුම, ආත්මය යන ත්‍රිවිධ අංශයෙන් මානවයා යුක්ත ය. ඔහු පරිපූරණත්වය ලබා ගැනීමට නම් මේවා මනා සංකලනයකින් තම ජීවිතයට උකහාගත යුතුයි.

වර්තමාන ලෝකය විද්‍යාත්මක හා තාක්ෂණික දැනුමෙන් පුපුරා යන තත්වයක පවතී. නමුත්, මානව ජීවිතය අධ්‍යාත්මික හරයන් නොසලකා හැරීම නිසා ආත්මය පරිහානියට පත්වෙමින් තිබේ. මෙම ආත්මීය බිඳ වැටීම හරහා කනස්සල්ල, මානසික පීඩනය ඇති වී තිබේ. මින් මතුව ඇති හානිදායක තත්වය නම් මිනිස් ජීවිතය නොවටිනා භාණ්ඩයක් බවට පත් වීමයි. බුද්ධිය පසෙක තබා හැඟීම්වලට යටත්වීම නිසා ප්‍රචණ්ඩත්වය, අනෙකා නොසලකා හැරීම්, ආදිය සිදුවෙමින් පවතී. මෙම තත්වයෙන් මානවයා මුදවා ගැනීම සඳහා අධ්‍යාත්මික දැනුමෙහි අවශ්‍යතාවය පිළිබඳව විද්වතුන් හා අධ්‍යාපනඥයින් අවධාරණය කරමින් සිටී. මෙම අවශ්‍යතාවය පූර්ණය කිරීමෙහි වගකීම ආගමික විෂයයන් වෙත භාර කර තිබේ.

මෙම තත්වය තුළ අප රටේ මිනිසුන්ගේ පුද්ගලික, පවුල්, සමූහ ජීවිතය ගොඩ නැගීම සඳහා ආගම් හා ඊට අදාළ දෑ සම්බන්ධයෙන් අවධානය යොමුවෙමින් පවතී.

වේගයෙන් වෙනස්වෙමින් පවතින ලොවෙහි ගිලිහීයමින් පවතින මානව වටිනාකම් රැක ගැනීම සඳහා ආගමික දැනුම හා අධ්‍යාත්මික පුහුණුව ලබාදීමේ හදිසි අවශ්‍යතාවය මතුව ඇත. මේ අනුව, ඉස්ලාම් විෂයයෙහි විෂය නිර්දේශය ශිෂ්‍යයාගේ දැනුම, හැකියාව, කුසලතාව, ආකල්ප වර්ධනය කර එම ලබා ගන්නා දැනුම තම ජීවිතයට උකහා ගන්නා ආකාරයට සකස් විය යුතුය යැයි අපේක්ෂිත ය.

ඉස්ලාමය ස්ථිරය. කාලයට අනුව වෙනස් නොවන්නකි. කෙසේවුවත් ෂරීයාවේ අවශ්‍යතාවය හා එහි වටිනාකම ශිෂ්‍ය හදවත් තුළ ස්ථාපිත කිරීමෙන් යහපත් වෙනසක් අපේක්ෂා කළ හැකියි. මෙම අපේක්ෂාව සඵල කරගැනීමේ ආකාරයෙන් මෙම විෂය නිර්දේශය සැකසී ඇත.

එහෙයින්, ඉතා උසස් අරමුණක් අපේක්ෂාවෙන් සකසා ඇති මෙම නව විෂය නිර්දේශය අප ගුරුවරුන් ඉතා ඕනෑකමින් අධ්‍යයනය කර ඉගැන්වීම්වල නිරත වෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 2. ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතු ය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහය හා ක්‍රියාවලිය තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා  වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

1. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පය මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම.
2. වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.
3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග වර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන්  සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.
4. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.
5. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.
6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන  සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.
7. සීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණදීමේ හැකියාව වර්ධනය කිරීම.
8. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමිකර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

## 2.2 මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

1. **සන්නිවේදන නිපුණතා**
   සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.
   **සාක්ෂරතාව :** සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම
   **සංඛ්‍යා පිළිබඳ දැනුම :** භාණ්ඩ, අවකාශය සහ කාලය, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය
   **රූපක භාවිතය :** රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති හා වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම
   **තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය :** පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද, සේවා පරිශ්‍රයන් තුළදී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගි කර ගැනීම.

2. **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**
   - නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලි හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
   - ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
   - චිත්තවේගී බුද්ධිය

3. **පරිසරයට අදාළ නිපුණතා**
   මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.
   **සමාජ පරිසරය :** ජාතික උරුමය පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම් ඉගෙනීම.
   **ජෛව පරිසරය :** සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා ඉගෙනීම.
   **භෞතික පරිසරය :** අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම.

4. **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

ආර්ථික සංවර්ධනයට දායක වීම. තම වෘත්තීය ලැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම. හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම. යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

5. **ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

6. **ක්‍රීඩාව හා විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

7. **ඉගෙනීමට ඉගෙනුම් පිළිබඳ නිපුණතා**

සීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම.

ඉහත ජාතික අරමුණු හා මූලික නිපුණතා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවෙන් උපුටා ගැනිණ.

## 3.0 විෂයයේ අරමුණු

**(1) අර්කානුල් ඊමාන්**

ඊමානයට අදාළ කරුණු අවබෝධ කරගෙන ඒ අනුව ජීවිතය සකසා ගැනීම.

**(2) අර්කානුල් ඉස්ලාම්**

ඉස්ලාමයේ මූලික වගකීම්, වැදගත්කම, ඒවා ඉටු කරන ආකාරය වටහාගෙන ඒ අනුව කටයුතු කරයි.

**(3) අල්අහ්ලාක් වත්තස්කියා**

ඉස්ලාමය පවසන්නාවූ ආචාර ධර්මයන් වටහාගෙන තම ජීවිතය මෙන්ම සමාජ ජීවිතයේ ද අනුගමනය කර අන් අයට ආදර්ශමවත් වෙයි.

**(4) අල්-කුර්ආන් වස්සුන්නා**

ඉස්ලාමීය මුලාශ්‍ර වටහාගෙන ඒවායේ උපදේශයන් තම ජීවිතයට අදාළ කර ගැනීම.

**(5) අස්සීරාහ් වත්තාරිහ්**

නබි (සල්) තුමාගේ ද කුලෆාඋර් රාෂිදීන්වරුන්ගේ ද ජීවන ක්‍රමය වටහාගැනීමත් තව ද ලාංකීය මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය හා ඔවුන්ගේ ජාතික දායකත්වය සවිස්තරාත්මකව දැනගෙන අන් අයට ද කියාදීම.

**(6) අල්මුආමලාත්**

ආර්ථිකය සම්බන්ධ ඉස්ලාමීය මගපෙන්වීම ද පවුල් ජීවිතය සම්බන්ධ ඉස්ලාමීය අදහස් අවබෝධ කරගෙන ඒවා තම ජීවිතයට අදාළ කර ගැනීම.

| නිපුණතාවය | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| 1.0<br>අර්කානුල් ඊමාන්, ඊමානය පිළිබඳව අවබෝධ කරගෙන ජීවිතය ක්‍රමවත් කර ගනී. | 1.1<br>ඊමානයේ කරුණු වටහාගෙන ඒ අනුව ජීවත් වීම. | • ඊමානය පිළිබඳ හැඳින්වීම<br>• ආමන්තුබිල්ලාහ්<br>• තව්හීද්, රිසාලත්, මආද් පද විවරණය | • මිනිසා අල්ලාහ්ගේ නියෝජිතයා බව දන පවසයි.<br>• මැවීම් තුළින් හෙළිවන අල්ලාහුතආලාගේ ගුණාංගයන් ප්‍රශංසාත්මක ව පවසයි.<br>• මිනිසා ඉටු කළ යුතු සේවාවන් හා යුතුකම් තම ජීවිතය තුළ පිළිපදියි.<br>• මිනිසා නොවන මැවීම්වලිනුත් අල්ලාහුතආලාගේ බලමහිමය වටහා ගනියි.<br>• තව්හීද්, රිසාලත්, මආද් පදයන්හි අඩංගු කරුණු වගුගත කරයි. | 04 |
| | 1.2<br>අල්ලාහුතආලා මැවුම්කරු යන්න වටහාගෙන ඔහුගේ නියමයන්ට අනුකූලව | • අල්ලාහ් - මැවුම්කරු<br>• අල්ලාහ්ගේ මැවීම්<br>- මලාඉකාවරු<br>- ජින්වරු<br>- මිනිසුන්<br>- සතුන්<br>- භෞතික වස්තූන් | • අල්ලාහ්ගේ බලය කියාපායි.<br>• මැවීම්හි ඇති යහපත් දෑ ලැයිස්තුගත කරන්න.<br>• මැවීම් අවධානය කිරීම මඟින් ඊමාන් ස්ථිර කර ජීවත්වී පෙන්වයි.<br>• භෞතික වස්තු වර්ග කර පවසයි.<br>• භෞතික වස්තුව අල්ලාහ්ගේ දායාද බව කියාපායි.<br>• භෞතික වස්තූන්ගේ යහපත දන ලියා පෙන්වයි.<br>• භෞතික වස්තුව ක්‍රමවත් ව ආරක්ෂා කර ගනියි. | 02 |

| නිපුණතාවය | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| 2.0<br><br>ඉස්ලාමයේ මූලික වගකීම්, වැදගත්කම, ඒවා ඉටු කරන ආකාරය අවබෝධ කරගෙන කටයුතු කරයි. | 2.1<br><br>සලාතයේ පෙර සූදානම අවබෝධ කරගෙන ඒ අනුව කටයුතු කරයි | • ඉස්ලාමය පිළිබඳ හැඳින්වීම<br>• ඉස්ලාම් යනු කුමක් ද යන්න පැහැදිලි කිරීම<br>• ඉස්ලාමයේ වගකීම් -හදීස් මූලාශ්‍ර | • ඉස්ලාම් යන පදයෙහි අර්ථය පවසයි.<br>• විශ්වයෙහි ඇති සියල්ලම කැමැත්තෙන් හෝ අකමැත්තෙන් අල්ලාහ්ට යටත් වේ යන්න පැහැදිලි කරයි.<br>• අල්ලාහ්ට යටත් වීම මඟින් ශාන්තියත් සාමයත් ඇති වේ යන්න පිළිගෙන ක්‍රියාකරයි.<br>• ඉස්ලාමයේ ප්‍රධාන වගකීම් පවසයි.<br>• ඉස්ලාමීය වගකීම් සඳහා හදීස් මූලාශ්‍රයන් ගෙන හැර දක්වයි.<br>• පංච මහා වගකීම්වල සබඳතාව තාර්කිකව ගෙනහැර දක්වයි.<br>• ඉස්ලාමීය වගකීම් හැකිතාක් දුරට ඉටු කරයි. | 04 |
| | 2.2<br>සලාතය කෙරෙහි පෙර සූදානම දැන ඒවා ඉටු කරයි. | • අත්තහාරා පිළිබඳ හැඳින්වීම<br>• පිරිසිදුකම පිළිබඳ පැහැදිලි කිරීම<br>• එහි වැදගත්කම<br>• ජලයේ වර්ගයන්<br>• පිරිසිදු කරගන්නා ක්‍රම | • ඉස්ලාම් පිරිසිදුකමට ලබා දී ඇති වැදගත්කම පැහැදිලිව පවසයි.<br>• වුළූහි ෆර්ලු, සුන්නත් ලයිස්තුගත කරයි.<br>• වුළූඃ සමඟින් සිටියි.<br>• වුළූඃ කර පෙන්වයි.<br>• නජීසයේ වර්ග හඳුනාගෙන පවසයි.<br>• ද්‍රව වර්ග, තහූර් තාහිර්, නජීස් ලෙස වර්ග කර පෙන්වයි.<br>• සෑම විටම ශරීරය, ඇඳුම, ස්ථානය යනාදියෙහි පිරිසිදුකම රැක ගනිමින් ක්‍රියා කරයි. | 02 |

| නිපුණතාවය | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| | 2.5<br><br>සලාතයේ නියමයන් අවබෝධ කරගෙන ඒ අනුව කටයුතු කරයී<br><br>. | • සලාතය<br>– හැඳින්වීම<br>– වැදගත්කම<br>– ඉටු කරන ආකාරය<br>– ෂර්තයන්<br>– ෆර්ලු<br>– සුන්නත්<br>– මුබ්තිලාත් | • සලාතය ඉස්ලාමයේ ප්‍රධාන වගකීම්වලින් එකක් යන්න, දූන පවසයි.<br>• සලාතයේ වැදගත්කම පිළිබඳවත් විශේෂත්වයන් පිළිබඳවත් විස්තරාත්මකව පවසයි.<br>• දිනපතා සලාතය කැමැත්තෙන් ඉටු කරයි.<br>• සලාතයේ වැදගත්කම හා විශේෂත්වය පිළිබඳ ව අන් අයට පවසයි. සලාතය ඉටු කිරීමට කැඳවයි. | 02 |
| | 2.6<br><br>උපවාසය පිළිබඳ අවබෝධය ලබා උපවාසශීලය ආරක්ෂා කරයි | • උපවාසය<br>- හැඳින්වීම | • උපවාසයේ වැදගත්කම දූන පවසයි.<br>• රමළානයේ විශේෂත්වය පිළිබඳ ව මූලාශ්‍ර සහිතව සවිස්තරාත්මකව පවසයි.<br>• උපවාසයේ අරමුණු වටහා ගෙන අවධානයෙන් උපවාසයේ නියැළී පාපයෙන් වැළකී ජීවත් වෙයි.<br>• රමළාන් මස සිදු කරනු ලබන ක්‍රියාවන්ට විශේෂයක් ඇතැයි දූනගෙන අන්අයටත් පවසයි.<br>• දුගීන්ගේ කුසගින්න, පිපාසය වටහා ගෙන ඔවුන්ට උපකාර කරයි. | 02 |

| නිපුණතාවය | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල පරිච්ඡේදය |
| --- | --- | --- | --- | --- |
| 3.0<br><br>අල්-අඛ්ලාක්වත් තස්කියා පිළිබඳ ව අවබෝධ කොට ගෙන ආධ්‍යාත්මික යහගුණයන් පවත්වා ගනියි. | 3.1<br>දෙමව්පියන්ට ගරු කරයි. | • දෙමව්පියන්<br>- උසස් බව<br>- උපකාර කිරීම<br>- ප්‍රාර්ථනා කිරීම | • දෙමාපියන්ට ගරු කිරීමේ අවශ්‍යතාව පිළිබඳ ව විස්තර කරයි.<br>• දෙමාපියන්ගේ ගරුත්වයට හානි කරන අංග දැන ගෙන ඒවායින් වැළකී ක්‍රියා කරයි.<br>• දෙමාපියන් උදෙසා සැමවිටම උපකාර කරමින් ක්‍රියා කරයි.<br>• දෙමාපියන් උදෙසා සැමවිටම ප්‍රාර්ථනා කරයි. | 02 |
| | 3.2<br>ගුරුවරුන්ගේ උසස් බව වටහාගෙන ඔවුන්ට ගෞරව කරයි. | • ගුරුවරු<br>- උසස් බව<br>- ගෞරව කිරීම<br>- ප්‍රාර්ථනා කිරීම | • ගුරුවරුන්ගේ තත්ත්වය, ගරුත්වය යනාදිය පිළිබඳ ව දැන විස්තර කරයි.<br>• සැමවිටම ගුරුවරුන්ට ගරු කොට ඔවුන් උදෙසා ප්‍රාර්ථනා කරයි.<br>• ගුරුවරු සමඟ විනීතව හැසිරෙයි. | 02 |
| | 3.3<br>මනා දිව පාලනයෙන් යුතුව කටයුතු කරයි | • දිව පාලනය කර ගැනීම<br>- ගෞරවයෙන් කථා කිරීම<br>- ස්තුති කිරීම<br>- සුභ පැතීම | • දිව රැකගැනීම මඟින් ලැබෙන යහපත දැන පවසයි.<br>• කථා කරන විට පිළිපැදිය යුතු කොන්දේසි හඳුනාගෙන පවසයි.<br>• මිනිසුන්ගේ සිත ආකර්ශනය වන ලස්සන වචනයෙන් දෙලොවේ ම යහපත ලබාගත හැකි බව පිළිගෙන ඒවා ක්‍රියාත්මක කරයි.<br>• සන්නිවේදනයේ දී සිත ආකර්ශනය වන පරිදි සෙනෙහෙබර වචන භාවිත කරයි. | 02 |
| | 3.4 නිවසට හා පිරිසක් අතරට ඇතුළුවීමේදී අවසර පතයි. | • අවසර ලබා ගැනීම<br>- වැදගත්කම<br>- නිවසට ඇතුළුවීමේදී<br>- පිරිසක් අතරට ඇතුළු වීමේදී | • නිවසකටත් සභාවකටත් ඇතුළු වීමට පෙර අවසර ලබා ගැනීමේ වැදගත්කම ගෙන හැර කියා පායි.<br>• නිවස තුළත් සභාව තුළත් පිළිපැදිය යුතු පිළිවෙත් ලැයිස්තුගත කරයි.<br>• නිවස තුළත් සභාව තුළත් ඉස්ලාමීය පිළිවෙත් පිළිපදිමින් ක්‍රියා කිරීමෙහි වැදගත්කම දැන ක්‍රියා කරයි. | 02 |

| නිපුණතාවය | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| | | • අන් අයගේ අවශ්‍යතා සඳහා ප්‍රමුඛස්ථානය ලබා දීම | • අන්‍යයන්ට උපකාර කළ හැකි ක්‍රම හැඳින පවසයි.<br>• අන්‍යයන්ගේ අවශ්‍යතාවයට මූලිකත්වය ලබා දීමේ අවශ්‍යතාවය පිළිගෙන ක්‍රියා කරයි.<br>• අන්‍යයන්ට උපකාර කිරීම උසස් ධර්මයක් බව විස්තර කරයි.<br>• අන්‍යයන්ට උපකාර කිරීම මඟින් ලැබෙන ප්‍රයෝජන දැන උපකාර කරයි. | 02 |
| 4.0<br>**මහාතිරුෂ් ෂරීආ**<br>ඉස්ලාමීය මූලාශ්‍රයන් පැහැදිලි ව වටහාගෙන ඒ අනුව ජීවිතය සකසා ගනියි. | 4.1<br>අල් කුර්ආනය විධිමත්ව වටහාගෙන ඒ අනුව කටයුතු කරයි | • අල්-කුර්ආන්<br>• හැඳින්වීම<br>• අල්-කුර්ආනය විධිමත්ව වටහා ගන්නා විධි ක්‍රම | • අල්-කුර්ආනය අවසාන පොදු ධර්මයකි' යන්න පැහැදිලි කරයි.<br>• අල්-කුර්ආනය කෙරෙහි තමන්ට වගකීම් ඇත යන්න පිළිගෙන ක්‍රියා කරයි.<br>• අල්-කුර්ආනයෙහි සියලු ම කරුණු අන්තර්ගතය යන්න පිළිගෙන පැහැදිලි කරයි.<br>• අල්-කුර්ආනය පාරායනය කර, වටහාගෙන, ජීවිතයෙහි ක්‍රියාවට නංවයි. | 06 |
| | 4.2<br>අල්-කුර්ආනයේ තිබෙන සූරාවන් නිවැරදි උච්ඡාරණයෙන් යුතුව පාරායණය කරයිග | • සූරා<br>• පැහැදිලිව පාරායණය කිරීම<br>• කටපාඩම් කිරීම<br>• අර්ථයන් ප්‍රකාශ කිරීම | • අල්-කුර්ආනය උතුම් වූ දේව ග්‍රන්ථයක් යන්න පැහැදිලි කරයි.<br>• අල්-කුර්ආනය පරිහරණය කරන විට පිරිසිදුකම රැකගනියි.<br>• අල්-කුර්ආනය පාරායනය කරන ක්‍රමය දැන පාරායනය කරයි.<br>• අල්-කුර්ආනය පාරායනය කිරීමෙහි වැදගත්කම දැන කට පාඩම් කර පාරායනය කරයි.<br>• අල්-කුර්ආනයෙහි උතුම් බව රැකගනිමින් පරිහරණය කිරීම ඉබාදත් යන්න දැන ක්‍රියා කරයි. | 02 |

| නිපුණතාවය | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| | 4.3<br><br>අල්-කුර්ආනයේ තිබෙන සූරාවන් නිවැරදි උච්ඡාරණයෙන් යුතුව පාරායණය කරයි. | ○ සූරා ඉඛ්ලාස් | • සූරතුල් ඉඛ්ලාස්හි පද විවරණය පවසයි.<br>• සූරතුල් ඉඛ්ලාස්හි වැදගත්කම දැන පවසයි.<br>• ඒකත්වය පිළිබඳ ප්‍රතිපත්තිවලට අදාළ දැනමුතුකම් මෙමඟින් දැන පවසයි.<br>• සූරතුල් ඉඛ්ලාස්හි දැන මුතුකම් අන් අයට ගෙන හැර පවසයි.<br>• සූරතුල් ඉඛ්ලාස් වටහා ගෙන පාරායනය කරයි. | 02 |
| | | ○ සූරා ෆලක්<br>○ සූරා නාස් | • සූරතුල් ෆලක්, නාස් සූරාවන්ගේ වැදගත්කම අවබෝධ කර ගනී .<br>• ඒවායේ අර්ථය පවසයි.<br>• අල්ලාහ්ගේ ආරක්ෂාව පතා මෙම සූරාවන් පාරායනා කරයි.<br>• මෙම සූරාවන්හි අඩංගු කරුණු තමන්ද අවබෝධ කර අන් අයටද පහදයි. | 02 |
| | | ○ සූරා ෆීල් | • සූරතුල් ෆීල් හි අර්ථය පවසයි.<br>• සූරතුල් ෆීල් හි පහළවූ හේතු පහදයි.<br>• සූරතුල් ෆීල් ලබා දෙන ඉගැන්වීම් පහදයි.<br>• සූරතුල් ෆීල් මඟින් හෙළිවන ඓතිහාසික තොරතුරු රැස් කර අන්අයට පවසයි. | 02 |

| නිපුණතාවය | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| | 4.4<br>හදීස් නීති මූලාශ්‍රයක් යන්න පහදය | • හදීස්<br>○ හැඳින්වීම | • හදීස් නීති මූලාශ්‍රයක් යන්න පහදයි.<br>• හදීස් වර්ග වගුගත කරයි.<br>• අල් කුර්ආනය පැහැදිලි ව තේරුම් කර ගැනීම සඳහා හදීස් අවශ්‍ය බව පහදයි.<br>• අල් කුර්ආනය හා අල් හදීස් අතර තිබෙන වෙනස පැහැදිලි කරයි. | 06 |
| | | • හදීසයන්<br>○ අධ්‍යාපනය<br>○ වළක්වා ගැනීම් සම්බන්ධ හදීසයන් | • හදීස් මඟින් පෙන්වා දී ඇති කළ යුතු හා වළක්වා ඇති දේවල් පිළිබඳව අවබෝධයක් ලබා ගෙන කටයුතු කරයි.<br>• අසත්‍ය කතා කිරීම මුනාෆික්ගේ ලක්ෂණයක් යැයි දැන ඉන් ඉවත් වෙයි.<br>• කවටනම් පටබැඳීම තහනම් ක්‍රියාවක් බව දැන ඉන් ඉවත්ව කටයුතු කරයි. | |
| | 5.1<br>මුහම්මද් (සල්)තුමාගේ උපත, තරුණ විය පිළිබඳ අවබෝධය ලබා එය පැහැදිලි කරයි. | • මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා<br>○ උපත හා තරුණ විය | • මුහම්මද් (සල්) තුමා උපත ලද අරාබි සමූහය පිළිබඳ පහදයි.<br>• නබි (සල්) තුමා මුහුණදුන් දුෂ්කරතා පහදයි.<br>• යොවුන්වියේ දී එතුමා තුළ තිබූ යහගුණාංග ආදර්ශට ගනියි.<br>• එතුමාගේ යොවුන්වියට අදාළ වූ වැඩිහිටියන් පිළිබඳ තොරතුරු වගු ගත කරයි.<br>• මුහම්මද් (සල්) තුමාගේ යොවුන්විය ගත වූ ආකාරය පහදන්න. | |
| | | ○ මක්කා ජීවිතය<br>○ ආදර්ශයන් | • මුහම්මද් (සල්) තුමාගේ හිරා ගුහා ගමන හා එහි ප්‍රතිඵලයන් පහදයි.<br>• මුහම්මද් (සල්) තුමාගේ ප්‍රචාරය හා එහිදී එතුමා මුහුණදුන් අභියෝග පහදයි.<br>• මුහම්මද් නබි (සල්) තුමා ආදරණීය පුතෙකු, පියෙකු, සැමියෙකු, ගුරුවරයෙකු, යහ මග පෙන්වන්නෙකු පව ඊට අදාළ අවස්ථාවක් උපයෝගි කරගෙන පහදයි.<br>• එතුමාව සෑම අංශයකම ආදර්ශයක් ලෙස ගෙන කටයුතු කරයි. | |

| නිපුණතාවය | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල පරිච්ඡේදය |
| --- | --- | --- | --- | --- |
| | 5.4<br>උම්මහාතුල් මු:මිනීන්වරියන්ගේ ජීවන ක්‍රමය දැනගෙන පවසයි. | • උම්මුහාතුල් මු:මිනීන්වරු<br>○ කදීජා (රළි) තුමිය | • නබි (සල්) තුමා හා කදීජා (රළි) තුමියගේ විවාහය සිදුවූ පසුබිම පහදයි.<br>• ඔවුන්ට ලැබුණු දරුවන්ගේ නම් ලැයිස්තු ගත කරයි.<br>• කදීජා (රළි) තුමිය ඉස්ලාමයට කළ සේවාව අළලා කථාවක් ඉදිරිපත් කරයි.<br>• ඇය ඉස්ලාමයට කළ සේවාවන් ආදර්ශයට ගනියි. | 02 |
| | | ○ ආයිෂා (රළි) තුමිය | • නබි (සල්) තුමා හා අබූබක්කර් (රළි) තුමාගේ පවුල අතර තිබූ සමීපත්වය පහදයි.<br>• ආයිෂා (රළි) තුමියගේ ගුණාංග ලැයිස්තු ගත කරයි.<br>• ආයිෂා (රළි) තුමිය ඉස්ලාමය වෙනුවෙන් කළ සේවාවන් හා කදීජා (රළි) තුමිය කළ සේවාවන් සසඳයි.<br>• ආයිෂා (රළි) තුමියගේ ආදර්ශයන් තම ජීවිතයේ දී අනුගමනය කරයි. | 02 |
| | 5.5<br>සහාබිවරුන්ගේ ජීවිතයෙන් ආදර්ශයන් වටහාගෙන පිළිපදියි. | ○ සෛද් ඉබ්නු තාබිත් (රළි) තුමා | • සෛද් ඉබ්නු තාබිත් (රළි) තුමාගේ ඉගෙනීම් හැකියාව පහදයි.<br>• සෛද් ඉබ්නු තාබිත් (රළි) තුමාගේ සේවාව අගයයි<br>• කුර්ආනය ග්‍රන්ථාරූඪ කිරීමේ සේවය අගයයිග | 02 |
| | 5.6<br>නබි ආදම් (අලෛ) තුමාගේ ඉතිහාස කතාව පවසයි. | ○ ආදම් (අලෛ) තුමා | • ආදම් (අලෛ) තුමාව මවන ලද සිදුවීම පවසයි.<br>• ආදම්, හව්වා යන දෙදෙනා වැරැදි කළ සිදුවීම කතාවක් ලෙස ගෙන හැර පවසයි.<br>• එතුමා අල්ලාහ්ගෙන් පව් කමාව අයැදිය ක්‍රමය ගෙන හැර දක්වයි.<br>• ආදම් (අලෛ) තුමාව මැවීමට පෙර අල්ලාහ් හා මලායිකාවරු අතර සිදුවූ දෙබස අල්-කුර්ආන් වැකි මගින් ලබා ගෙන ලියා පෙන්වයි. | 02 |

| නිපුණතාවය | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| 6.0<br>ආර්ථිකය සම්බන්ධ ඉස්ලාමීය උපදෙස් හා පවුල් ජීවිතය සම්බන්ධ ඉස්ලාමීය අදහස් වටහාගෙන ඒවා ජීවිතය තුළ ක්‍රමවත්ව පිළිපදියි. | 6.1<br>අසල්වාසීන්ගේ සබඳතාව රැකගනිමින් ක්‍රියා කරයි. | • අසල්වාසීන්ගේ අයිතිවාසිකම් . | • අසල්වැසියන් කවුද යන්න අර්ථකථනය කරයි.<br>• අසල්වාසීන්ගේ විශේෂතාවය දැන ගරු කරයි.<br>• අසල්වාසීන්ගේ අයිතිවාසිකම් ගරු කොට ක්‍රියා කරයි.<br>• අසල්වාසීන් සමඟ හොඳ සම්බන්ධතාවයක් පවත්වා ගෙන ඔවුන්ගේ ගෞරවය ආරක්ෂා කරයි. | 02 |
| 7.0<br>සියලුම අංශ සම්බන්ධයෙන් ඉස්ලාමයට ආවේණික දැක්මක් ඇත යන්න වටහා ගෙන ඒ පදනමින් සියල්ලම අරමුණු කර ගෙන ක්‍රියා කරයි. | 7.1<br>පරිසරය රැකගැනීමේ ක්‍රියාවලියෙහි නියැලෙයි. | ○ පරිසරය රැකගැනම | • පරිසරය ආරක්ෂා කළ යුතුය යන්නට හේතු දැනගෙන පවසයි.<br>• පරිසරය රැකගත හැකි ක්‍රමෝපායන් සොයා බලා පවසයි.<br>• පරිසරයේ පිරිසිදුකම රැකගැනීම ෆර්ලු කිෆායා යැයි පිළිගෙන ක්‍රියා කරයි.<br>• පරිසරය රැකගැනීමේ ක්‍රියාවලියෙහි නියැලෙයි. | 04 |
| | 7.2<br>ජීවීන් වෙත සෙනෙහස දක්වමු. | ○ ජීවීන්ව ආරක්ෂා කිරීම | • ජීවීන් අපගේ පරිසරයට අත්‍යවශ්‍යය අංග යැයි දැනගෙන පවසයි.<br>• සූරතුන් නහ්ල් හි සඳහන් වන ජීවීන්ගේ ප්‍රයෝජන පවසන වාක්‍ය එක් රැස් කරයි.<br>• ජීවීන් අප වැන්නවුන්ය. ඔවුන් වෙත සෙනෙහස දැක්විය යුතුය යන්න පිළිගනියි.<br>• ජීවීන්ව ආරක්ෂා කර හදා වඩා ගනියි. | 03 |

## 1.7 ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය

අධ්‍යාපනයේදී ආගම විෂය මූලික ස්ථානයක් උසුලයි මෙම විෂය ශිෂ්‍යයා ඉමහත් කැමැත්තක් දක්වන ආකාරයට ද විෂය කරුණු සිත තුළ තැන්පත් කිරීමට ද ඉගෙන ගත් දෑ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි ආකාරයේ දැනුමක් ලබා දීමට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය සමත්විය යුතුයි. එමගින් ශිෂ්‍යයාගේ ගද්‍යමය, චින්තනමය, සන්නිවේදන, සමාජ හැකියා වර්ධනය කළ යුතු ය.

ආගමික විෂයය ඉගැන්වීම තුළින් කරුණු මතක තබා ගැනීම හෝ දැනුම පමණක් ලබාදී විභාගය සමත් කිරීම ප්‍රමාණවත් නොවේ එම දැනුම ශිෂ්‍යයා තුළ පැහැදිලි වෙනසක් ඇති කළ යුතුය . ඒ සඳහා අවශ්‍යය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය දැන සිටීම ගුරුවරයාගේ වගකීම වේ.

මෙහිදී වයස අත්දැකීම් පරිසරය කැපවීම ආදිය ගැන සැලකිලිමත්වීම අගනේය

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය ශිෂ්‍යයා මූලික කරගෙන සිදුවිය යුතු බව අවධාරණය කර තිබේ. මෙම ක්‍රමවේදය තුළින් ශිෂ්‍යයාගේ දක්ෂතා හා හැකියා වර්ධනය කළ යුතුයි මෙහිදී ගුරුවරයා තම ශිෂ්‍යයාගේ රුචි-අරුචිකම් දක්ෂතා දුර්වලතා ආදිය තේරුම් ගෙන අවශ්‍යය අවස්ථාවල ප්‍රශංසාද අවවාදයන් ද ලබා දිය යුතු ය.

ඉගෙනුම්-ඉගැන්විම් ක්‍රමවේද කීපයක්

- සාකච්ඡා
- කණ්ඩායම් ක්‍රියාකාරකම්
- සහභාගීත්ව ක්‍රමය
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම්
- තොරතුරු රැස් කිරීමේ ක්‍රමය
- කථාවක් ආශ්‍රයෙන් පැහැදිලි කිරීමේ ක්‍රමය
- චින්තනය අවදි කිරීමේ ක්‍රමය
- දේශන ක්‍රමවේදය

මෙම ක්‍රමයන්ට අනුකූලව පාඩමට හා අවස්ථාවට ගැලපෙන ආකාරයෙන් තෝරා ගැනීම් කළ හැකි ය.

ශිෂ්‍යයාට ඉගෙනුම් උපකරණ වශයෙන් ඉස්ලාමීය සඟරා, පුවත්පත්, ආශ්‍රිත ග්‍රන්ථ, චිත්‍ර ආදිය භාවිතා කළ හැකි ය. තවද විෂය රසවත්ව ඉගැන්වීම සඳහා අන්තර්ජාලය ආදියද භාවිතා කළ හැකි ය.

තවද පාසලේ පැවැත්වෙන ආගමික, සංස්කෘතික වැඩසටහන් ආදියෙන් වඩාත් සුදුසු ඒවාට සිසුන් යොමු කළ හැකි ය.

සිසුන් ඉස්ලාම් විෂය කැමැත්තෙන් ඉගෙන එහි ආදර්ශයන්ට අනුව ජීවත්වෙමින් යහපත් පුරවැසියෙකුවීමේ කාර්යභාරය ඉගැනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය මගින් ගුරුවරුන් ඉටු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 10.1.8 පාසල් ප්‍රතිපත්තිය හා වැඩපිළිවෙල

අප රටේ අධ්‍යාපන ක්‍රමවේදය දැනුම පුළුල් කිරීම හැකියාව වර්ධනය කිරීම ආකල්ප වර්ධනය කිරීම අරමුණු කරගනිමින් නිර්මාණය වී ඇත

ඉස්ලාමය ජීවන ක්‍රමයක් වන හෙයින් ඒ අනුව පාසල් පරිසරය තුළ ආකල්පමය වෙනස්කම් නිවැරදිව ක්‍රියා කිරීමේ දැනුම හා ඒ සඳහා පුහුණුව ලබා දිය යුතු යැයි අපේක්ෂිතය. ඒ සඳහා පහත දැක්වෙන ක්‍රම අනුගමනය කළ හැකිය

- ආගමික ආචාරධර්මයන් ඉස්මතු වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- අධ්‍යාපන චාරිකා ආදිය මගින් ආගමික හා සංස්කෘතික වටිනාකම්වලින් යුත් දෑ නැරඹීමට යෑම.
- නව වසරේ පළමු මස වන මුහර්රම් මස පිළිගැනීම, රමලාන් මස පිළිගැනීම මීලා-දුන්නබි උත්සවය ආදිය නිමිති කොට සිසු දක්ෂතා මතුවන වැඩසටහන් නිර්මාණය කිරීම.
- නිර්මාණශීලී හැකියාවන් සහිත සිසුන්ගේ එම හැකියාවන් ඔප් නැංවීම සඳහා සමිති පැවැත්වීම හා ඔවුන්ගේ දායකත්වය උපරිමයෙන් ලබා ගැනීම.
- පාසල් පරිසරය පිරිසිදුව තබා ගැනීම අලංකාර කිරීම නඩත්තු කිරීම ආදිය සඳහා ශිෂ්‍යයන් කණ්ඩායම් වශයෙන් යෙදවීම.
- ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වැදගත් දිනයන් ඉස්ලාමීය දෘෂ්ටිකෝණයට අනුව සැමරීමට කටයුතු කිරීම.
- ඉස්ලාමයේ භාවිතයන් යථාර්ථවාදීව පැහැදිලි කිරීම හා ඒ අනුව කටයුතු කිරීමට පෙළඹවීම.

මෙම කාර්යයන් සාර්ථක කර ගැනීම සඳහා පාසලේ විදුහල්පති ගුරුවරු සිසුන් හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සහාය දිය යුතුය. එමෙන්ම මේ සඳහා අවශ්‍යය භෞතික හා මානව සම්පත් තිබීමද වැදගත් ය.

තවද ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය සාර්ථක කර ගැනීමට අවශ්‍ය දැනුම ලබා දීම සඳහා දේශන හා වැඩමුළු ගුරුවරුන් වෙනුවෙන් සංවිධානය කිරීමෙන් උසස් ප්‍රතිඵලයක් අත්කර ගත හැකි ය.

එමෙන්ම ඉස්ලාම් විෂයය වෙනුවෙන් වෙන්වී ඇති කාල පරිච්ඡේද ප්‍රමාණය සැලකිල්ලට ගෙන ශිෂ්‍යයාට උපරිම ප්‍රයෝජනයක් ලැබෙන ආකාරයට ගුරුවරයා පාඩම සකසා ගත යුතු ය. මෙම විෂයය වෙනුවෙන් ඉස්ලාම් විෂයය පුහුණු ගුරුවරු ඉස්ලාමීය ෂරීආ අධ්‍යාපන ආයතන මගින් සුදුසුකම්ලත් අය හෝ ඉස්ලාම් සංස්කෘතිය තම උපාධිය වෙනුවෙන් එක් විෂයයක් ලෙස හැදෑරූ උපාධිධාරීන් තෝරා ගැනීමෙන් වඩා ඵලදායී ප්‍රතිඵලයක් ලබා ගත හැකි ය.

මෙම විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීම මගින් ඉස්ලාමීය දැනුම, පැහැදිලි චින්තනය, ආචාර ධාර්මිකව ජීවත්වීම, අවංක ගුණගරුක බවින් යුත් සමාජ ජීවියෙක් බිහි කිරීමට අපේක්ෂිත ය.

## 1.9. ඇගයීම හා තක්සේරු කිරීම

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාදාමයන් මඟින් ශිෂයාගේ විෂය දැනුම පරීක්ෂා කිරීමේ ක්‍රමවේදය වශයෙන් ඇගයීම හා තක්සේරුකරණය යොදා ගැනේ මෙය සෑම ඒකකයක් අවසානයේදී ම සිදු කළ යුතු එක් ක්‍රියාදාමයකි

ඉස්ලාම් පාඩම මඟින් ශිෂ්‍යයාගේ හැසිරීමේ, ආගමික වතාවත්වල නිරතවීමේ, සමාජය සමඟ හැසිරෙන ආකාරයේ සිදුව ඇති වෙනස්වීම් අගයනු ලැබේ මෙය පංති කාමරය තුළ හා ඉන් පරිබාහිරව සාධන මට්ටමට ළඟා වී ඇත්දැයි විධිමත් හෝ අවිධිමත් ආකාරයෙන් ඇගයීමට ලක් කළ හැකි ය.

පාඩම ඇරඹීමට පෙර ඇගයීමක් සිදුකිරීමෙන් දුර්වල සිසුන් හඳුනාගෙන ඒ සඳහා විශේෂ ඉගැන්වීම් ක්‍රමයක් වහාම ආරම්භ කිරීමෙන් ප්‍රතිඵල අත්කර ගත හැකි ය. ඇගයීම් උපකරණය එකම අයුරින් භාවිතා නොවනු ඇත. පාඩම සම්බන්ධ ඇගයීම් ඉගෙනුම්-ඉගැනුම් ක්‍රියාවලිය මාස අවසානයේ, වාර අවසානයේ වර්ෂාවසනයේ වාචික හෝ ලිඛිත එසේ නොමැති වුවහොත් ක්‍රියාකාරකම් වශයෙන් සිදු කළ හැක. මේ සඳහා සුදුසු ආකාරයට නියැදි හා ක්‍රමවේදයන් පූර්වයයෙන්ම සකසා තිබීම අත්‍යාවශ්‍යයයි

මීට අමතරව සූරා, හදීස්, දුආ ආදිය නිවැරදිව උච්ඡාරණය කරන්නේ ද කට පාඩම් කරන්නේ ද ඒවා පාරායණය කළ යුතු අවස්ථාවල පාරායණය කරන්නේ ද? යන්නද ඇගයීමට ලක් කල යුතු ය. මේ සඳහා අවශ්‍ය ඇගයීම් උපකරණ සැකසීමට ගුරුවරයාට හැකිවිය යුතුය

ඉස්ලාම් විෂයයෙහි ආකල්ප සම්බන්ධ ඇගයීම් කිරීම අවශ්‍ය ය. විෂය නිර්දේශයට ඇතුළත් අල්-කුර්ආන් සූරාවන්, අවස්ථානෝචිත දුආ ප්‍රාර්ථනාවන් ඇගයීමට ලක් කිරීමේදී අරාබි අක්ෂරයන් උච්ඡාරණය කරන ආකාරය, වනපොත් කර තිබීම ආදිය නිරීක්ෂණය කළ යුතුය

කෙසේ වූවද ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඇගයුම් හා තක්සේරුකරණය ඉතා වැදගත් ය. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථක අසාර්ථක බව මනින මිණුම් දණ්ඩ එය වනු ඇත.

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

# ඉස්ලාම්

## ගුරු මාර්ගෝපදේශය

## 6 ශ්‍රේණිය

(2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)


ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk

විද්‍යුත් තැපැල : info@nie.lk

**ඉස්ලාම්**

**6 ශ්‍රේණිය**

**ගුරු මාර්ගෝපදේශය**

**ප්‍රථම මුද්‍රණය 2015**

**© ජාතික අධ්‍යාපන ආයතනය**

ISBN: **......................**

**ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**ශ්‍රී ලංකාව.**

**වෙබ් අඩවිය** : www.nie.lk
**විද්‍යුත් තැපෑල** : info@nie.lk

**මුද්‍රණය :**

**මුද්‍රණාලය**
**ජාතික අධ්‍යාපන ආයතනය**

**නිපුණතාව** 1.0 : ඊමාන් පිළිබඳ කරුණු දැනගෙන එම පදනම මත ජීවිතය හැඩගස්වාගනියි.

**නිපුණතා මට්ටම** 1.1 : ඊමාන්හි මූලික කරුණු දැන පවසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 1

**ඉගෙනුම් පල** :

- යහපත් මුඃමින්වරයෙකු ලෙස ජීවත්වීමට අවශ්‍ය මූලිකාංග දැනගෙන ක්‍රියා කරයි.
- ඊමානයේ කරුණු හය විශ්වාස කර ප්‍රකාශ කරයි.
- ඊමානයේ කරුණු එකිනෙකට සම්බන්ධ වන ආකාරය කියාපායි.
- තෞහීද්, රිසාලත්, මආද් ආදියහි අඩංගුවන දෑ වගුගත කරයි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 1** :

- එක් මිනිසෙකු ජඃෆර් සාදික් (රහ්) වෙත පැමිණෙන්නේය. අල්ලාහ් පිළිබඳව ඔහුගෙන් විමසන්නේය.

  ජඃෆර් සාදික් (රහ්) : ඔබ මුහුදේ ගමන් කර තිබේ ද ?

  මිනිසා : ඔව්.

  ජඃෆර් සාදික් (රහ්) : ගැඹුරු මුහුදේ ගමන් කරන විට සුළිකුණාටුවට හසුවී තිබෙනවා ද?

  මිනිසා : ඔව්.

  ජඃෆර් සාදික් (රහ්) : එවිට නැවියන් ඔබව බේරාගනී, නැතිනම් බේරීමට කුමන හෝ ක්‍රමයක් තිබේ යන විශ්වාසය බිඳවැටී නැද්ද?

  මිනිසා : ඔව්.

  ජඃෆර් සාදික් (රහ්) : එවිට කවුරුන් හෝ බේරා ගනීවියැයි සිතී නැද්ද?

  මිනිසා : ඔව්.

  ජඃෆර් සාදික් (රහ්) : ඔහු තමා අල්ලාහ් !

  (ඉස්ලාමිය අකීදාවිල් අල්ලාහ්)

  ඉහත සඳහන් දෙබස ස්ව කැමැත්තෙන්ම ඉදිරිපත්වන සිසුන් ලවා කියවීමට සලස්වන්න.

- පහත සඳහන් කරුණු ඇතුළත් කර ගනිමින් සාකච්ඡාවක යෙදෙන්න.
  - ඊමාන් කළ යුතු කරුණු හයක් ඇත. ඉන් පළමුවැන්න අල්ලාහ් විශ්වාස කිරීමයි. ඊමාන් කළ යුතු කරුණු හය එකිනෙකට සම්බන්ධ වේ. ඊමානය සම්පූර්ණවීමට මෙම කරුණු හය විශ්වාස කළ යුතුය.

**පියවර 2** :

- සිසුන්ව කණ්ඩායම්වලට බෙදන්න.
- සෑම කණ්ඩායමකටම ගවේෂණ උපදෙස් පත්‍රිකා ලබා දෙන්න.
- අදහස් ප්‍රකාශනයට ඉඩ ලබා දෙන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කොට ස්ථිර කරන්න.
- පන්තිය තුළ කණ්ඩායම් වාර්තා ඉදිරිපත් කිරීමට සූදානම්වන ලෙස දන්වන්න.

පියවර 3 :
- එක් එක් කණ්ඩායමට තමන් ලියන ලද වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- වැදගත් කරුණු අනෙක් කණ්ඩායම් වලින් ලබා ගැනීමට මෙහෙයවන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු වන පරිදි සාකච්ඡාවේ යෙදෙන්න.
  - ඊමාන් කළ යුතු කරුණු 6 කි.
    - අල්ලාහ්ව විශ්වාස කිරීම
    - ඔහුගේ මලාඉකාවරු විශ්වාස කිරීම
    - ඔහුගේ ආගම් විශ්වාස කිරීම
    - ඔහුගේ රසූල්වරු විශ්වාස කිරීම
    - අවසාන දිනය විශ්වාස කිරීම
    - කලා කද්රය විශ්වාස කිරීම ආදියයි.

- මින් අල්ලාහ්ව විශ්වාස කිරීම සියල්ලෙන් ම මූලික වේ
- සෑම මැවීමකට ම වඩා අපව උසස් මැවීමක් කළේ අල්ලාහ් ය
- අල්ලාහ්ව දෑඩි විශ්වාස කිරීම අපේ යුතුකම වේ
- සිතෙහි පවතින දෑඩි ඊමානය ක්‍රියාවෙන් පිළිඹිඹු වේ
- ඊමාන් කළ යුතු අංගයන්ගෙන් එකක් හෝ ප්‍රතික්ෂේප කරන්නේ නම් ඊමානය අසම්පූර්ණ ය.

أمنت بالله وملائكته وكتبه ورسله واليوم الآخر والقدر خيره وشره

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව :**

**කණ්ඩායම 1 හා 2** :

යන අරාබි වාක්‍යය අරාබි අක්ෂර කලාව උපයෝගි කර ලියන්න.

**කණ්ඩායම 3 හා 4** : أمنت بالله وملائكته وكتبه ورسله واليوم الآخر والقدر خيره وشره

යන අරාබි වාක්‍ය පරිවර්තනය කර ලියා ප්‍රදර්ශනය කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

යනුවෙන් ඇරඹෙන අරාබි වාක්‍ය

දෙමාපිය සහායෙන් අරාබි අක්ෂර කලාව උපයෝගි කර ලියා, ප්‍රදර්ශනය කරවන්න.

**නිපුණතාව 1.0 :** ඊමාන් පිළිබඳ කරුණු දැනගෙන එම පදනම මත ජීවිතය හැඩ ගස්වා ගනියි.

**නිපුණතා මට්ටම 1.2.1:** අල්ලාහ් මැවුම්කරු බව සවිස්තරාත්මකව පවසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 1

**ඉගෙනුම් පල :**

- මිනිසා අල්ලාහ්ගේ නියෝජිතයා බව දැන පවසයි.
- මැවීම් තුළින් හෙළිවන අල්ලාහුතආලාගේ ගුණාංගයන් ප්‍රශංසාත්මක ව පවසයි.
- මිනිසා ඉටු කළ යුතු සේවාවන් හා යුතුකම් තම ජීවිතය තුළ පිළිපදියි.
- මිනිසා නොවන මැවීම්වලිනුත් අල්ලාහුතආලාගේ බලමහිමය වටහා ගනියි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 1 :**

- ඇමුණුම 1 හි සඳහන් ඓතිහාසික සිදුවීම කියවා පෙන්වන්න.
- අල්ලාහුතආලාගේ ශක්තිය පිළිබඳ කෙටි විස්තරයක් ලබාදෙන්න.
- පහත සඳහන් කරුණු ඇතුළත් කර ගනිමින් සාකච්ඡාවක යෙදෙන්න.
    - මේ ලෝකය මවා පරිපාලනය කිරීමේ ශක්තිය අල්ලාහුතආලාට පමණක් ඇත.
    - ඔහු මේ ලෝකය තුළ මිනිසාවත් සියලු ජීවීන්වත් මැවුවේය.
    - ඔහු මිනිසා සියලු මැවීම්වලට වඩා උසස් තත්වයෙන් මැවුවේය.
    - මිනිසාට විචාර බුද්ධිය ලබා දී ලෝකයේ අනෙක් මැවීම්වලින් මිනිසාව ශ්‍රේෂ්ඨත්වයට පත් කළේ ය.
    - එම නිසා මෙලොවේදී මිනිසා අල්ලාහුතආලාගේ විධානයන්ට අනුව තම ජීවිතය හැඩගස්වා ගැනීම අනිවාර්යය වේ.
    - එය මිනිසාගේ මෙලොව හා පරලොව ජයග්‍රහණයන්ට හේතුවේ.

**පියවර 2 :**

- සිසුන්ව කණ්ඩායම්වලට බෙදන්න.
- සෑම කණ්ඩායමකටම ගවේෂණ උපදෙස් පත්‍රිකා ලබා දෙන්න.
- අදහස් ප්‍රකාශනයට ඉඩ ලබා දෙන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කොට ස්ථිර කරන්න.
- පන්තිය තුළ කණ්ඩායම් වාර්තා ඉදිරිපත් කිරීමට සූදානම්වන ලෙස දන්වන්න.

**පියවර 3 :**

- එක් එක් කණ්ඩායමට තමන් ලියන ලද වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- වැදගත් කරුණු අනෙක් කණ්ඩායම් වලින් ලබා ගැනීමට මෙහෙයවන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු වන පරිදි සාකච්ඡාවේ යෙදෙන්න.
    - සියලු මැවීම්වල නිර්මාතෘ අල්ලාහ් වේ. ඒවා සියල්ලෙහිම හොඳ සැලැස්මක් හා සූක්ෂමබවක් දක්නට ලැබේ.
    - ස්ථානය, පරිසරය, වයස ආදියට අනුව සියලුම මැවීම් මවා ඇත.
    - මෙවැනි මැවීම් අතුරින් මිනිසා ශ්‍රේෂ්ඨතම මැවීමක් ලෙස සලකනු ලබන්නේය.

- එහෙයින් අල්-කුර්ආනය මිනිසාව ''අල්ලාහ්ගේ නියෝජිතයා'' ලෙස සඳහන් කරනු ලබයි.
- අල්ලාහ්ගේ නියෝජිතයා ලෙස මිනිසා මෙලොවදී ඉටු කළ යුතු සේවයන්, වගකීම් හා යුතුකම් දක්නට ලැබේ.
- ඒවා අල්කුර්ආන්, අල්හදීස් මඟින් පැහැදිලි කරයි.
- මෙලොව සක්‍රීය කිරීම තම වගකීම්වලින් එකක් ලෙස ඉටුකරන මිනිසාට මෙලොව සියලු ජීවීන්ව තම අවශ්‍යතාව උදෙසා ක්‍රමවත්ව ප්‍රයෝජනයට ගැනීමට ඉඩප්‍රස්ථාව සලසා ඇත.
- මිනිසා අල්ලාහ්ගේ නියෝජිතයා ලෙස තම වගකීම් ඉටුකරන විට මෙලොව, පරලොව ජය අත්කර ගනී.

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

ඇමුණුම 1

මුහම්මද් සල්ලාහු අලෛහිවසල්ලම්තුමාණෝ අන්සාරීවරයෙකුගේ වත්තකට ඇතුල් වූහ. එම ස්ථානයේ ඔටුවෙකු ගැට ගසා තිබුණි. එම ඔටුවා එතුමාව දුටු විගස වේදනාව පිරි හඬින් කෑගැසුවේය. නෙත් දෙකෙන් කඳුළු සැලුණි. එතුමාණෝ එම ඔටුවා අසලට ගොස් කරුණාවෙන් ඌගේ හිසත් නළලත් තම දෑතින් පිරිමැද්දාහ. විගසින් ඌ නිහඬ වුණේය. ''මෙම ඔටුවාගේ හිමිකරු කවුරුන් ද? මෙම ඔටුවා කාගේ ද?'' කියා එතුමා විමසුවේ ය. එවිට, අන්සාරි තරුණයෙකු ''අල්ලාහ්ගේ දූතයාණෙනි! මෙම ඔටුවා මගේය'' යනුවෙන් පැවසුවේය. එවිට, නුඹගේ භාරයේ සිටින මෙම කතා කළ නොහැකි ජීවියා පිළිබඳ නුඹ අල්ලාහ්ට බිය නොවුණි ද? මෙම ඔටුවා කඳුලින් හා වේදනාවෙන්, නුඹ ඌව කුසගින්නේ රඳවා දිගින් දිගටම වැඩ කරවා ගන්නා බව මට පැමිණිලි කරමින් සිටියේ ය.'' කියා නබිතුමාණෝ පැවසූහ.

**කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව :**

**කණ්ඩායම 1** : මෙලොව අල්ලාහ්ගේ නියෝජිතයා ලෙස මවන ලද මිනිසා ඉටු කළ යුතු සේවාවන් ලැයිස්තුවක් ලියා පෙන්වන්න.

**කණ්ඩායම 2** : මිනිසා ඉටු කළ යුතු සේවාවන් අතපසු කරන්නේ නම් මෙලොව ඇතිවන බලපෑම් වගුගත කරන්න.

**කණ්ඩායම 3** : මිනිසාට අනෙක් ජීවීන් මඟින් ලැබෙන යහපත ලියන්න.

**කණ්ඩායම 4** : මිනිසා මෙලොව ජීවිතයෙහි ඉටු කළ යුතු සේවාවන් සම්බන්ධව ප්‍රකාශ වන හදීස් දෙකක් ලියන්න.

**ගෙදර පරිසරයෙන්** :

තම අවට පරිසරයේ ජීවත් වන ජීවීන් දෙදෙනෙකුව නම් කර ඊට අදාළ කුර්ආන් වැකි ලියා ප්‍රදර්ශනය කිරීමට සලස්වන්න.

**නිපුණතාව 1.0** : ඊමානය පිළිබඳ කරුණු දැනගෙන ඒ අනුව තම ජීවිතය හැඩ ගස්වා ගනියි.

**නිපුණතා මට්ටම** 1.2.2 : අල්ලාහ් මැවුම්කරු බව විස්තර කර පවසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 1

**ඉගෙනුම් පල** :
- අල්ලාහ්ගේ බලය කියාපායි.
- මැවීම්හි ඇති යහපත් දෑ ලැයිස්තුගත කරන්න.
- මැවීම් අවධානය කිරීම මඟින් ඊමාන් ස්ථිර කර ජීවත්වී පෙන්වයි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 1** :
- ඇමුණුම 1 හි සඳහන් ඔටුවා පිළිබඳ තොරතුරු කියවා පෙන්වන්න.
- අල්ලාහ්ගේ මැවීමේ හැකියාව පිළිබඳ කෙටියෙන් ඉදිරිපත් කරන්න.
- පරිසරයේ සිටින සමහර ජීවීන් (ජලය, කුරුල්ලන්, සතුන්) ආදියෙහි මහිමය හා මැවීමෙහි සූක්ෂම බව පිළිබඳ ව විමසන්න.
- පහත සඳහන් කරුණු ඇතුළත් කර ගනිමින් සාකච්ඡාවක යෙදෙන්න.
    - අල්ලාහ් අපගේ පංචේන්ද්‍රිය සීමාවෙන් එපිට සිටී. මෙලොව මවා පරිපාලනය කිරීමේ හැකියාව ඇත්තේ ඔහුටම ය. ඔහු සියල්ල ආදර්ශයන් රහිතව මැව්වේ ය.
    - අල්කුර්ආන්, හදීස් පැහැදිලි කිරීම් මඟින් ද ඔහුගේ මැවීම්වල සූක්ෂම බැවින් ද ඔහුව වටහා ගත හැක. මෙම මැවීම් තුළින් ඔහුගේ මැවීමෙහි විශ්මයජනක බව ද වටහා ගත හැක.

**පියවර 2** :
- සිසුන්ව කණ්ඩායම් හතරකට බෙදන්න. සෑම කණ්ඩායමකටම කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකා ලබා දෙන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරිත්වය නිරික්ෂණය කොට ස්ථිර කරන්න.

**පියවර 3** :
- එක් එක් කණ්ඩායමට තමන් ලියන ලද වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- වැදගත් වැඩිදුර කරුණු අනෙක් කණ්ඩායම් වලින් ලබාගන්න.
- පහත කරුණු ඇතුළත් වන පරිදි සාකච්ඡා කරන්න.
- සියලු මැවීම්වල නිර්මාතෘ අල්ලාහ් වේ. ඒවා සියල්ලෙහිම ශ්‍රේෂ්ඨ සැලැස්මක් හා සූක්ෂමබවක් දක්නට ලැබේ.
- සෑම මැවීමකම ස්ථානය, පරිසරය, ඍතු අනුව පවා ඇත.
- මිනිසා අනිකුත් මැවීම්වලට වඩා අල්ලාගේ ශ්‍රේෂ්ඨ මැවීමක් ලෙස සලකනු ලබයි.
- සෑම මැවීමකින් ම මිනිසාට ඉගෙන ගැනීමට බොහෝ දේ ඇත.
- මැවීම් කෙරෙහි අවධානය යොමු කරන විට අපට අල්ලාහ්ගේ හැකියාව හා ශක්තිය වැටහේ.

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**තොරතුරු ගොනුව**

**ඔටුවා**

ඔටුවා කාන්තාරයේ නැව ය. උගේ බර 250 -680 කිලෝ ග්රෑම් වේ. ඌ අවුරුදු 50 ක් පමණ ජීවත් වේ. ඌ එකවර ලීටර 150කට වඩා ජලය පානය කොට එක්රැස් කර ගනියි. ඔටුවාගේ රෝම, සම යනාදිය දැඩි උෂ්ණත්වය ඔරොත්තු දෙන ශක්තිය සහිතය. දූවිලි නොවැටෙන සේ ඌගේ දෑස් දෙකෙහි ඊට ඉහළින් යොදය සහිත යමක් දක්නට ලැබේ. පාද පවා පළල් ස්වරූපයක් ගනී. එහෙයින්, කාන්තාර වැල්ලෙහි නොගිලී වේගයෙන් ගමන් කරන්නේය. එමනිසා, අල්කුර්ආන් ඔටුවාගේ ආශ්චර්යය පිළිබඳව අවධානය යොමු කරන මෙන් සූරතුල් ගාෂියාවෙහි සඳහන් කර ඇත.

**කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව :**

**කණ්ඩායම 1** : අල්ලාහ්ගේ නිර්මාණයක් වූ ඉබ්බා තුළ පවතින සියුම් මැවීම විමසන්න.

**කණ්ඩායම 2** : අල්ලාහ්ගේ නිර්මාණයක් වූ කොට්ටෝරුවා තුළ පවතින සියුම් මැවීම විමසන්න.

**කණ්ඩායම 3** : අල්ලාහ්ගේ නිර්මාණයක් වූ බත්කූරා තුළ පවතින සියුම් මැවීම විමසන්න.

**කණ්ඩායම 3** : අල්ලාහ්ගේ නිර්මාණයක් වූ හාවා තුළ පවතින සියුම් මැවීම විමසන්න.

**ගෙදර පරිසරයෙන් :**

පරිසරයේ දක්නට ලැබෙන ජීවීන්වලින් එකක් තෝරා ඒ පිළිබඳ ව අල්කුර්ආනයේ සඳහන් වූ වාක්‍ය 2 ක් පරිවර්තනය සමග ලිවීමට යොමු කරන්න.

**නිපුණතාව 1.0** : ඊමාන් පිළිබඳ කරුණු දැනගෙන එම පදනම මත ජීවිතය හැඩගස්වා ගනියි.

**නිපුණතා මට්ටම 1.2.3** : අල්ලාහ් මැවුම්කරුබව සවිස්තරාත්මකව පවසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 2

**ඉගෙනුම් පල** :

- මලාඉකාවරු, ජින්වරු අතර වෙනස විස්තර කර පවසයි.
- වැදගත් මලාඉකාවරු 10 දෙනාගේ නාමයන් හා ඔවුන්ගේ සේවාවන් දැනගෙන පවසයි.
- මලාඉකාවරු, ජින්වරු අල්ලාහ්ගේ අනෙක් මැවීම්වලින් වෙනස් වන ආකාරය දැනගෙන ලියා පෙන්වයි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 1** :

- දිනක් නබි (සල්) තුමාගේ සභාවෙහි අප වාඩි වී සිටින සිට තද කලු පැහැති හිසකෙස් වලින් යුත් සුදු පැහැති ඇඳුමක් ඇඳගත් අයෙක් පැමිණියේ ය. ඔහු ගමනේ නිරත වූවකු ලෙස දිස් නොවී ය. අපෙන් කිසිවකුත් ඔහුව දැන සිටියේ නැත. ඔහු නබි (සල්) තුමා ළඟ වාඩි වී ඔහුගේ දෙදණ නබි (සල්) තුමාගේ දෙදණ හා ළං කර තැබුවේ ය. තම දෙඅත් තම කලාවා මත තබා ගත්තේ ය. ඔහු නබි (සල්) තුමාගෙන් ''මුහම්මද්!ඉස්ලමය පිළිබඳ ව මට කියා දෙන්න.'' යැයි පැවසී ය. එයට නබි (සල්) තුමා ''නැමදීමට සුදුස්සා අල්ලාහ් හැර වෙන කිසිවකු නොමැත. මුහම්මද් (සල්) තුමා අල්ලාහ්ගේ දූතයා ලෙස ඔබ සාක්ෂි කීම, සලාතය ඉටු කිරීම, සකාත් දීම, රාමලාන් මාසයේ දී උපවාසය ඉටු කිරීම, ශක්තිය තිබේ නම් හජ් ඉටු කිරීම ආදී ඉටු කිරීම ඉස්ලාමය නම් වේ'' යැයි පැවසී ය. එයට ඔහු ''ඔබ සත්‍යම පැවසී ය.'' යැයි කීවේ ය. පසුව ඔහු ''මට ඊමානය ගැන පහදන්න'' යැයි කීවේ ය. එයට නබි (සල්) තුමා ''ඔබ අල්ලාහ් ව ඔහුගේ මලාඉකාවරුන් ඔහුගේ ආගම්, ඔහුගේ දූතයන්, අවසාන දිනය කලාකදිරය විශ්වාස කිරීම ඊමාන්'' යැයි ප්‍රකාශ කළේ ය. එයට ද ඔහු ''ඔබ සත්‍යම පැවසීය'' යැයි කීවේ ය. පසුව ''ඉහ්ෂාන් යනු කුමක් ද?'' යන්න විමසී ය. එයට නබි (සල්) තුමා ''අල්ලාහ්ව ඔබ බලන්නාක් මෙන් බිය ගැතියෙන් වන්දනා කරන්න. ඔබ ඔහුව නොදුටුව ද, ඔහු ඔබව බලන්නේය යන හැඟීම වන්දනාවේ දී ඔබ තුළ තිබිය යුතු ය. එය ඉහ්ලාස්වේ යැයි'' පැවසී ය. (මුස්ලිම්)
- සිසුවෙකුට කියවන ලෙස පවසන්න.
- සැඟවුණු කරුණු විශ්වාස කිරීමෙහි අවශ්‍යතාවය පිළිබඳ ව සිසුන්ට කියාපාන්න.
- පහත සඳහන් කරුණු ඇතුළත් කර ගනිමින් සාකච්ඡාවක යෙදෙන්න.
  - මලාඉකාවරු, ජින්වරු අපගේ දෑසට පෙනෙන්නේ නැත.
  - මලාඉකාවරුන්ව ආලෝකයෙන් ද ජින්වරුන්ට ගින්දරින් ද මවා ඇත.
  - මලාඉකාවරු අතර ලිංග භේද නැත. පවුල, කුසගින්න, පිපාසය වැනි අවශ්‍යතා ඇතිවන්නේ නැත.
  - ඊමාන් කරන ජින්වරුන්, කාෆිර් වන ජින්වරුන් මෙලොවේ දක්නට ලැබේ.

පියවර 2 :
- සිසුන්ව කණ්ඩායම්වලට බෙදන්න.
- සෑම කණ්ඩායමකටම ගවේෂණ උපදෙස් පත්‍රිකා ලබා දෙන්න.
- සාකච්ඡා කර අදහස් එළි දැක්වීමට සලස්වන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කොට ස්ථිර කරන්න.
- පන්තිය තුළ කණ්ඩායම් වාර්තාව ඉදිරිපත් කිරීමට සූදානම්වන ලෙස පවසන්න.

පියවර 3 :
- සෑම කණ්ඩායමකටම තම වාර්තා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- වැදගත් කරුණු අනෙක් කණ්ඩායම්වලින් ලබා ගැනීමට මෙහෙයවන්න.
- පහත කරුණු ඇතුළත්වන සේ සමාලෝචනයේ යෙදෙන්න.
    - මෙලොවේ ඇති බොහෝ දේ අපගේ ඇස්වලට ගෝචර නොවන සේ මලාඉකාවරුන් හා ජින්වරුන් අපගේ ඉන්ද්‍රියන්ට ගෝචරය නොවන්නන් වේ. මලාඉකාවරුන්ව ආලෝකයෙන් ද ජින්වරුන්ව ගින්දරින් ද මවා ඇත. අපට ගෝචරය වන දේවල් හැර ගෝචරය නොවන දේවල් කෙරෙහි මහත් විශ්වාසය තැබිය යුතුය. ඒවා පිළිබඳ අල්කුර්ආන් පෙන්වා දෙන්නේය.
    - මලාඉකාවරු පාපී ක්‍රියාවන්හි නියැළීමේ ස්වභාවය නොමැත්තේය. දේව විධානයන් සම්පූර්ණයෙන්ම පිළිපදින්නන් වේ. ඔවුන්ගේ සංඛ්‍යාව අල්ලාහ් පමණක් දන සිටින්නේය. මිනිසුන්සේම ජින්වරුන් අල්ලාහ්ට යටත්ව ද සමහරවිට යටත්නොවීත් ක්‍රියා කිරීමේ ස්වභාවය සහිතය.
    - මලාඉකාවරු අල්ලාහ් ලබා දුන් වගකීම් අඩුවක් නොමැතිව ඉටු කරති. ජින්වරු අතර ඊට විරුද්ධවන්නන් සිටිති. වැදගත් මලාඉකාවරු දහයක් වේ. ඔවුන්වත් ඔවුන්ගේ විශේෂ සේවයත් විශ්වාස කර ක්‍රියා කිරීම විශ්වාසයේ අංගයකි.

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව :**

**කණ්ඩායම 1** : මලාඉකාවරුන්ගේ ස්වභාවය ලැයිස්තුගත කරන්න.

**කණ්ඩායම 2** : මලාඉකාවරු දහ දෙනාගේ නම් හා ඔවුන්ගේ සේවාවන් ලියන්න.

**කණ්ඩායම 3** : මලාඉකාවරුන්ට හා ජින්වරුන්ට අප විශ්වාස කළ යුත්තේ මන්ද කියා ලියන්න.

**කණ්ඩායම 4** : තර්ජමතුල් කුර්ආනයේ සහාය ඇතිව ජින්වරු සම්බන්ධ අල්කුර්ආන් වැකි දෙකක් තෝරා ඒවායෙහි තේරුම ලියන්න.

**ගෙදර පරිසරයෙන්**

ඉන්ද්‍රියන් ගෝචරය නොවන වස්තූන් පිළිබඳ ව දෙමාපියන් සමඟ සාකච්ඡා කොට ඒවා ලැයිස්තුගත කිරීමට යොමු කරන්න.

**නිපුණතාව 1.0** : ඊමාන් පිළිබඳ කරුණු දැනගෙන එම පදනම මත ජීවිතය හැඩ ගස්වා ගනියි.

**නිපුණතා මට්ටම 1.2.4** : අල්ලාහ් මැවුම්කරු බව සවිස්තරාත්මක ව පවසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 1

**ඉගෙනුම් පල** :
- භෞතික වස්තු වර්ග කර පවසයි.
- භෞතික වස්තුව අල්ලාහ්ගේ දායාද බව කියාපායි.
- භෞතික වස්තුන්ගේ යහපත දැන ලියා පෙන්වයි.
- භෞතික වස්තුව ක්‍රමවත්ව ආරක්ෂා කර ගනියි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**

පියවර 1 :
- ඇමුණුම 1 හි ඇති සටහන සිසුන්ට කියවා පෙන්වන්න.
- පරිසරයේ දක්නට ලැබෙන භෞතික වස්තුන් පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- භෞතික වස්තුන් මඟින් ලබා ගන්නා ප්‍රයෝජන කිහිපයක් අසා දැනගන්න.
- පහත සඳහන් කරුණු මතුවන සේ ඔවුන් සමඟ සාකච්ඡා කරන්න.
  - අප පරිසරයේ විවිධ වස්තූන් දක්නට ලැබේ.
  - සුළඟ, කඳු, පස, ගල්, පොළොව, ජලය, ගස්.... යනාදිය ඒවායින් කිහිපයකි.
  - ඒවා එකිනෙකෙහි අධික ප්‍රයෝජන දක්නට ලැබේ.
  - භෞතික වස්තුන් යහපත් ආකාරයෙන් භාවිතා කිරීමත් ආරක්‍ෂා කිරීමත් අපගේ යුතුකමකි.
  - අනෙක් මැවීම් සේම, භෞතික වස්තු සියල්ල අල්ලාහ් විසින් සැලසුම් සහගත ව මවා ඇත.

පියවර 2 :
- සිසුන්ව කණ්ඩායම් හතරකට බෙදන්න. සෑම කණ්ඩායමකට ම කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකා ලබා දෙන්න.
- සාකච්ඡා කර අදහස් මතු කිරීමට සලස්වන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කොට ස්ථිර කරන්න.

පියවර 3 :
- සෑම කණ්ඩායමකටම තම ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- වැදගත් කරුණු හා ඒ හා සම්බන්ධ වෙනත් කරුණු අනෙක් කණ්ඩායම් වලින් ලබා ගැනීමට මෙහෙයවන්න.
- පහත සඳහන් කරුණු ඇතුළත්වන සේ සාකච්ඡා කරන්න.
  - භෞතික මැවීම් සියල්ලම අල්ලාහ්ගේ දායාදයන් ය. ඉහත සඳහන් මැවීම් සියල්ලෙහිම ප්‍රයෝජන ඇත. අල්ලාහ්ගේ බලය, ශක්තිය යනාදිය භෞතික වස්තුන්ගේ සැලසුම් සහගත බිහි කිරීම මඟින් දැනගත හැකිය.
  - මිනිස් ජීවිතය ස්ථාවරවීමට භෞතික වස්තුන් මත රැඳී සිටීම අනිවාර්යය වේ. භෞතික වස්තුන් යන්න, අල්ලාහ් අපට ලබා දුන් දිව්‍යමය දායාදයන් ය. ඒවා පිළිබඳව පරමාන්ත දිනයේ දී විමසුමට ලක් කෙරේ.
- ඒවා අනිසි ලෙස භාවිත කිරීම දඬුවම් ලැබිය යුතු වරදකි. භෞතික වස්තුව රැක ගැනීම සියලුම මුස්ලිම්වරුන්ගේ වගකීමකි.

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව** :

**කණ්ඩායම 1** : භූමිය පිළිබඳ ව අල්කුර්ආනයෙහි සඳහන් වන වාක්‍ය 3ක් තර්ජුමතුල් කුර්ආනයෙන් සොයාගෙන දෙමාපියන් සමඟ ලියන්න.

**කණ්ඩායම 2** : අහස පිළිබඳ ව අල්කුර්ආනයෙහි සඳහන් වන වාක්‍ය 3ක් තර්ජුමතුල් කුර්ආනයේ සහාය ඇතිව අර්ථය ලියන්න.

**කණ්ඩායම 3** : මුහුද, ජලය යනාදිය සම්බන්ධ අල්කුර්ආනයෙහි සඳහන් වන වාක්‍ය තුනක අර්ථය තර්ජුමතුල් කුර්ආනයේ සහාය ඇතිව සොයා ලියන්න.

**කණ්ඩායම 4** : ජීවීන්, ශාක පිළිබඳව අල්කුර්ආනයෙහි සඳහන් වන වාක්‍ය තුනක් තර්ජුමතුල් කුර්ආනයේ සහයට ඇතිව සොයාගෙන අර්ථය සමඟ ලියන්න.

ඇමුණුම 1

**තොරතුරු ගොනුව**

සූර්යයා පොළොවට සැතපුම් 9,30,00,000 දුරින් පිහිටන බව අප සැම දන්නා කරුණකි. එහි උෂ්ණත්වය සෙල්සියස් 12000 $^{0}$ වේ. ඉර හා පොළොව අතර දුර දැන් ප්‍රමණයෙන් අඩක් යැයි සලකමු. එසේ වූ විට අප පිළිස්සී විනාශ වෙන්නෙමු. එසේ නොමැතිව සූර්යයා තවදුරින් පිහිටයි නම්, පොළොව අප ජීවත්වීමට නොහැකි අයුරින් සිසිල් වේ.

**ගෙදර පරිසරයෙන්**

පරිසරය තුළ දක්නට ලැබෙන කඳු, ගංගා, ඇල, වනාන්තර යනාදි භෞතික වස්තුවලින් එකක් දෙමාපියන් සමඟ සංචාරය කොට ඒ පිළිබඳව විස්තරයක් ලියා පැමිණෙන්න.

**නිපුණතාව 2.0** : ඉස්ලාමයේ මූලික වගකීම්, වැදගත්කම ඒවා ඉටුකරන ක්‍රමය පිළිබඳව වටහාගෙන ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 2.1** : ඉස්ලාමයේ මූලික වගකීම් මූලාශ්‍රයන් මඟින් පහදයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 1

**ඉගෙනුම් පල** :

- ඉස්ලාම් යන පදයෙහි අර්ථය පවසයි.
- විශ්වයෙහි ඇති සියල්ලම කැමැත්තෙන් හෝ අකමැත්තෙන් අල්ලාහ්ට යටත් වේ යන්න පැහැදිලි කරයි.
- අල්ලාහ්ට යටත් වීම මඟින් ශාන්තියත් සාමයත් ඇති වේ යන්න පිළිගෙන ක්‍රියාකරයි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 1** :

- 

"මොවුන් සොයන්නේ අල්ලාහ්ගේ ධර්මය (යහමාර්ගය) නොවන දහමක් ද? අහසේ හා මහපොළොවේ ඇති සියලුම දෑ (කැමැත්තෙන් හෝ අකමැත්තෙන්) යටත්වන්නේ ඔහුටමය. තවද, (සියල්ලක්ම) ආපසු යන්නේ ඔහු වෙතමය." (3:83)

  - .      , أَسْلَمَ   යන පද දෙකෙහි අර්ථය පැහැදිලි කරන්න.
  - පහත සඳහන් කරුණු ඇතුළත්වන සේ සාකච්ඡා කරන්න.
  - අල්ලාහ් විසින් පිළිගනු ලැබූ දහම ඉස්ලාම් පමණය. අල්ලාහ්ගේ නීතිරීතිවලට කීකරුවීම ඉස්ලාම් වේ.
    أَفَغَيْرَ دِيْنِ اللهِ يَبْغُوْنَ وَلَهُ **أَسْلَمَ** مَنْ فِيْ السَّمَاوَاتِ وَالأَرْضِ طَوْعًا وَكَرْهًا وَإِلَيْهِ يُرْجَعُوْنَ
  - අප අල්ලාහ්ට ස්ව කැමැත්තෙන්ම යටත් වන්නෙමු යන්න එළිදක්වන කරුණ ලෙස නැමදුම් හා වතාවත් දක්නට ලැබේ. ඉස්ලාමයෙහි නැමදුම් හා වතාවත් මඟින් අපත් අල්ලාහ්ත් අතරත් සම්බන්ධය ශක්තිමත් කළ හැකිය.

**පියවර 2** :

- සිසුන්ව කණ්ඩායම් තුනකට බෙදන්න. කණ්ඩායම් ක්‍රියාකාරකම් පත්‍රය කණ්ඩායමට ලබා දෙන්න. කණ්ඩායම් ක්‍රියාකාරකම නිරීක්ෂණය කොට සියලුම සිසුන්ව එහි යොදවන්න.

**පියවර 3** :

- සෑම කණ්ඩායමකටම තම ක්‍රියාකාරකම ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- එම කණ්ඩායමට තම නිර්මාණාත්මක අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙන්න.
- අන් කණ්ඩායම්වලට තම නිර්මාණාත්මක අදහස් දැක්වීමට අවස්ථාව දෙන්න.
- පහත කරුණු කේන්ද්‍ර කොට සාකච්ඡාව මෙහෙයවන්න.
  - ඉස්ලාම් යන අරාබි පදයෙහි ප්‍රධාන අදහස් 2ක් ඇත.

سَلَامٌ - ශාන්තිය أَسْلَمَ - යටත් වීම

- යටත්වීම යන්න අල්ලාහ්ගේ මැවීම් වන විශ්වයේ ඇති සියල්ලම අල්ලාහ්ටත් ඔහුගේ අණටත් කැමැත්තෙන් හෝ අකමැත්තෙන් යටත් වීමය.
- හිරු, සඳු, තරු, ග්‍රහලෝක යනාදියෙහි ක්‍රියාකාරකමත්, වැසි වැසීම, සුළං හැමීම, මුහුදු රළ ගැසීම, ශාක වැඩීම, ගිනි ගැනීම..... මෙවැනි සියල්ලක්මත් අල්ලාහ්ගේ අණට යටත්වීමෙහි ප්‍රතිඵලයන්ය.
- ''අහස්හිත්, පොළොවෙහිත් ඇති සියල්ලම කැමැත්තෙන් හෝ අකමැත්තෙන් අල්ලාහ්ට යටත්ව ක්‍රියා කරයි.'' (3:83)
- අල්ලාහ්ගේ මැවීම් අතුරින් මිනිසා තෝරා ගැනීමේ නිදහස ලබා ඇත්තෙකු ලෙස අල්ලාහ්ට යටත්වීමට ඔහු තුළ ඇති කැමැත්ත දැන ගැනීමේ අරමුණින්, ඔහුටම ආවේණික නීතිරීති සම්පාදනය කර ඇත. අල්ලාහ්ගේ අණ කැමැත්තෙන් පිළිගෙන පිළිපදින්නා මුස්ලිම් වේ.
- නබි (සල්) තුමා ''ඉස්ලාමය කුලුණු පහක් මත ඉදිකොට ඇති''බව පවසයි
- ඉස්ලාම් අල්ලාහ්ගේ දහම වීමත් ස්වාභාවික දහම වීමත් එහි විශේෂත්වය වේ.
- ඉස්ලාම් මුළු ජීවිතයටත්, සියලු මිනිසුන්ටත්, සෑම කාලයටත් ගැළපෙන ආගමක් ලෙස දිස්වීම එහි තවත් විශේෂත්වයකි. අල්කුර්ආන් හා සුන්නාහ් ඉස්ලාමයෙහි මූලාශ්‍රයන් වේ. ඉස්ලාම් අවංකත්වය, සත්‍යය, යුක්තිය, විශ්වාසය වැනි යහපත් ගුණාංගයන් දේශනා කරයි.

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව :**

**කණ්ඩායම 1** : ඉස්ලාම් පිළිබඳ සඳහන් වන අල්කුර්ආන් වැකි තුනක් තර්ජුමතුල් කුර්ආනයෙන් තෝරා ගෙන අරාබි අක්ෂරයෙන් ලියා ප්‍රදර්ශනය කරන්න.

**කණ්ඩායම 2** : කැමැත්තෙන් හෝ අකමැත්තෙන් සියල්ලම අල්ලාහ්ට අවනත වන බවට උදාහරණ තුනක් ලියා පින්තූර අලවා ප්‍රදර්ශනය කරන්න.

**කණ්ඩායම 3** : ඉස්ලාමය මගින් සැනසුම ලැබේ කියා පවසන, ඉස්ලාමය අලුතින් වැළඳගත් විද්වතුන් දෙදෙනෙකුගේ අදහස් සඳහන් ග්‍රන්ථයන් තෝරා එක්රැස් කොට අත් පත්‍රිකාවක් ලෑස්ති කරන්න.

**ගෙදර පරිසරයෙන් :**

ඉස්ලාම්හි විශේෂත්වය පිළිබඳ කරුණු පහක් ඔබගේ දෙමාපියන්ගෙන් අසා ලියන්නට යොමු කරන්න.

**නිපුණතාව 2.0** : ඉස්ලාමයේ මූලික වගකීම්, වැදගත්කම ඒවා ඉටුකරන ක්‍රමය පිළිබඳව වටහාගෙන ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 2.2** : ඉස්ලාමයේ මූලික වගකීම් මූලාශ්‍රයන් මඟින් පහදයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 1

**ඉගෙනුම් පල** :
- ඉස්ලාමයේ ප්‍රධාන වගකීම් පවසයි.
- ඉස්ලාමීය වගකීම් සඳහා හදීස් මූලාශ්‍රයන් ගෙන හැර දක්වයි.
- පංච මහා වගකීම්වල සබඳතාව තාර්කිකව ගෙනහැර දක්වයි.
- ඉස්ලාමීය වගකීම් හැකිතාක් දුරට ඉටු කරයි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 1** :
- මුහම්මද් (සල්) තුමා මෙසේ පවසයි. ඉස්ලාමය, කුලුණු පහක් මත ඉදිකොට ඇත. අල්ලාහ් හැර වෙනත් දෙවියෙක් නොමැත, මුහම්මද් (සල්) තුමා අල්ලාහ්ගේ දාසයා බවටත් දූතයා බවටත් සාක්ෂි දැරීම, සලාතය ඉටු කිරීම. සකාතය ගෙවීම, රමළාන් මස උපවාසයේ යෙදීම, හජ් ඉටු කිරීම. (බුහාරි)
- ඉස්ලාමීය වගකීම් පිළිබඳව විමසන්න.
- පහත කරුණු ඇතුළත්වන සේ සාකච්ඡා කරන්න.
    - ඉස්ලාමීය ප්‍රධාන වගකීම් පහකි. මෙම වගකීම් ඉටු කරන්නා ''මුස්ලිම්'' ලෙස සලකනු ලැබේ.
    - කලිමාව පිළිගත් පසු සලාතය සියලුම දෙනාටම ද, උපවාසය කළ හැකි අයට ද, සකාතය නිශ්චිත ප්‍රමාණයක ධනය ඇත්තාට ද, හජ් ඉටුකිරීමට හැකි සියලුම දෙනාට වගකීමක් වේ.
    - ඉස්ලාමීය වගකීම් පිළිබඳව හදීස් විස්තර කරයි.

**පියවර 2** :
- සිසුන්ව කණ්ඩායම් හතරකට බෙදන්න.
- කණ්ඩායම්වලට ගවේෂණ උපදෙස් පත්‍රිකාව ලබා දෙන්න.
- සියලුම සිසුන්ව කණ්ඩායම් ක්‍රියාකාරිත්වයෙහි යොදවන්න.
- එය නිරීක්ෂණය කර සහතික කරන්න.

**පියවර 3** :
- සෑම කණ්ඩායමකටම තම ක්‍රියාකාරකම ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අන් කණ්ඩායම්වලට තම අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු ඇතුළත්වන සේ සාකච්ඡා කරන්න.
- ඉස්ලාමීය වගකීම් අතුරින් සලාතය ඉතාමත් වැදගත් වේ. සලාතයේ වැදගත්කම පිළිබඳවත් විශේෂත්වය පිළිබඳවත් හදීස් සඳහන් කර ඇත.
    - ''කාෆිර්වරු හා මු : මින්වරු අතර වෙනස සලාතය අතහැරීම වේ.'' (බුහාරි)
    - ජාබිර් (රළි) තුමා මෙසේ පවසයි. ''පංචකාල සලාතය ඔබගේ නිවස ඉදිරියෙන් ගලා යන ගඟේ ඔබ දිනපතා පස් වතාවක් දිය නා පිරිසිදු වීම වැනිය.'' (මුස්ලිම්)
    - ඉබ්නු අබ්බාස් (රළි) තුමා මෙසේ පවසයි.

එනම්, මිනිසෙකු මුහම්මද් (සල්) තුමාගෙන් ''මට ස්වර්ගයට ඇතුලු විය හැකි ක්‍රියාවක් කියා දෙන්න'' කියා ඇසුවේය. එයට එතුමාණෝ''අල්ලාහ්ව නමදින්න. ඔහුට කිසිවක් සමාන නොකරන්න. සලාතය ඉටු කරන්න. සකාතය ගෙවන්න. ඥාති සබඳතා රැකගන්න.'' යනුවෙන් පිළිතුරු දුන්හ. (බුහාරි)

- අබු සයීද් අල් කුද්රී (රළි) තුමා නිවේදනය කරන්නේය.

  අල්ලාහ්ගේ දූතයාණෝ ''රමළාන් මාසය පැමිණියහොත්, ස්වර්ගයේ දොරටු ඇරෙනු ලැබේ. නිරයේ දොරටු වසනු ලැබේ. ෂෙයිතාන්ට විලංගු දමනු ලැබේ.'' යැයි පැවසූහ. (බුහාරි)

- අබු හුරෙරා (රළි) තුමා මෙසේ පවසයි. අල්ලාහ්ගේ දූතයාගෙන් විමසනු ලැබිණි. ''කුමන ක්‍රියාව ඉතාමත් යහපත් ද?'' එයට ''අල්ලාහ්ව හා ඔහුගේ දූතයාව විශ්වාස කිරීම'' යැයි එතුමාණෝ පිළිතුරු දුන්හ. පසුව කුමක් ද කියා විමසූ විට ''අල්ලාහ්ගේ මාර්ගයේ ජිහාද් කිරීම'' යැයි පැවසූහ. පසුව කුමක්ද කියා විමසූ විට, ''අනුමත කරන ලද හජ්'' යැයි පැවසූහ.

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව :**

**කණ්ඩායම 1** : ඉස්ලාම් කුලුණු පහක් මත ඉදි කොට ඇති බව සිතුවම් කළ චිත්‍රයක් ඇඳ පෙන්වන්න.

**කණ්ඩායම 2** : සලාතයේ වැදගත්කම පිළිබඳ පැවසෙන හදීස් තුනක් ලියන්න.

**කණ්ඩායම 3** : සලාතයෙන් සකාත් වෙන් කළ නොහැක යන අබුබකර් (රළි) තුමාගේ වදන් එළි වූ අවස්ථාව කෙටියෙන් ලියා පෙන්වන්න.

**කණ්ඩායම 4** : උපවාසයේ නියැළී සිටින්නෙකු පිළිපැදිය යුතු පිළිවෙත් පිළිබඳව පැවසෙන පූර්ණ හදීස් රියාලුස් සාලිහීන් ග්‍රන්ථයෙන් තෝරා ලියන්න.

**ගෙදර පරිසරයෙන් :**

ඔබගේ දෙමාපියන්ගෙන් පංච මහා වගකීම් ඉටුකිරීමේ වැදගත්කම පිළිබඳව හා ඒවා කෙසේ ඉටුකරනවා ද යන්න පිළිබඳව විමසා ඒ පිළිබඳව ඔවුන්ගේ අදහස් ගොනු කිරීමට යොමුකරන්න.

**නිපුණතාව 2.0** : ඉස්ලාමයේ මූලික වගකීම්, වැදගත්කම ඒවා ඉටුකරන ක්‍රමය පිළිබඳව වටහාගෙන ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 2.1.1** : සලාතය කෙරෙහි පෙර සූදානම දැන ඒවා ඉටු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 2

**ඉගෙනුම් පල** :
- ඉස්ලාම් පිරිසිදුකමට ලබා දී ඇති වැදගත්කම පැහැදිලිව පවසයි.
- වුළුඃහි ෆර්ලු, සුන්නත් ලැයිස්තුගත කරයි.
- වුළුඃ සමඟින් සිටියි.
- වුළුඃ කර පෙන්වයි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 1** :
- ''සැබවින් ම අල්ලාහ් පව් සමා කරන්නන් හා පිරිසිදුව සිටින්නන්ට කැමැත්තේ ය.'' (2:222) යන කුර්ආන් වාක්‍යය කියවීමට සලස්වන්න.
- පිරිසිදුකම පිළිබඳව සිසුන්ගේ අත්දැකීම හෙළි කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු ඇතුළත්වන සේ සාකච්ඡා කරන්න.
  - ඉස්ලාම් පිරිසිදුකමට වැඩි වැදගත්කමක් ලබා දෙන්නේය. අභ්‍යන්තරව හා බාහිරව පිරිසිදුවෙන් සිටිය යුතුය. සලාතය වැනි නැමදුම් ඉටු කරන විට අපි පිරිසිදුව සිටිය යුතුය.
  - පිරිසිදුවීමට ජලය භාවිතා කරනු ලැබේ. සමහර අවස්ථාවන්හිදී පස භාවිතා කිරීමට අනුමැතිය ඇත.

**පියවර 2** :
- සිසුන්ව කණ්ඩායම් හතරකට බෙදන්න.
- ගවේෂණ උපදෙස් පත්‍රිකාව ලබාදෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකමෙහි සියලුම සිසුන්ව යොදවන්න.

**පියවර 3** :
- සෑම කණ්ඩායමකට ම තම ක්‍රියාකාරකම ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- සෑම කණ්ඩායමකට තම නිර්මාණාත්මක අදහස් ඉදිරිපත් කොට විස්තර ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- තම අදහස් ඉදිරිපත් කිරීමට අනෙක් කණ්ඩායම්වලටත් අවස්ථාවක් දෙන්න.
- පහත කරුණු ඇතුළත් වන සේ සාකච්ඡා කරන්න.
  - ''පිරිසිදුකම ඊමානයේ අඩකි'' යනුවෙන් මුහම්මද් (සල්) තුමාණෝ පැවසූහ. (බුහාරි)
  - ''නියත වශයෙන්ම අල්ලාහ් පාපොච්චාරණය කරන්නන්ව හා පාරිශුද්ධවන්තයන්ව ප්‍රිය කරන්නේය.'' (2:222)
  - ඉස්ලාම් ''පිරිසිදුකම'' කෝණ තුනකින් බලනු ලැබේ. එනම්, බාහිර පිරිසිදුකම, අභ්‍යන්තර පිරිසිදුකම හා ආධ්‍යාත්මික පිරිසිදුකම.
  - පාපයේ නොයෙදී, අන් අය පිළිබඳ ව වරදවා නොසිතා, සිත පිරිසිදුව තබා ගැනීම, අභ්‍යන්තර පිරිසිදුකම වේ.

- තච්බා, ඉස්තිඃෆාර් මඟින් අපි සෑම විටම අභ්‍යන්තර පිරිසිදුකම රැකගත යුතුය.
- අභ්‍යන්තර පිරිසිදුකම මඟින් සිත සුවපත් කර ගනිමු.
- ශරීරය, ඇඳුම, ස්ථානය, ආහාර යනාදියෙහි පිරිසිදුකම රැක ගැනීම බාහිර පිරිසිදුකම වේ. අපිරිසිදු හා අපද්‍රව්‍ය යනාදියෙන් අපගේ බාහිර පරිසරය පිරිසිදුව තබාගත යුතුය. මළපහ කළ පසු සේදීම, නිය - රෝම කැපීම, නෑම, අවට පරිසරය පිරිසිදුව තබා ගැනීම, නජීස් ලෙස ඉස්ලාම් පෙන්වා දෙන සියල්ලම පිරිසිදු කිරීමට, එය පවසන ක්‍රමය රැකගනිමින් පිරිසිදු කර ගැනීම මඟින් බාහිර පිරිසිදුකම රැකගත යුතුය. බාහිර පිරිසිදුකම රැක ගැනීම මඟින් අප ශරීර සෞඛ්‍යය රැක ගනිමු.
- වගකීමක් වන සලාතය, හජ්ජි කාර්යයන් යනාදියට වුළූඃ කිරීම අනිවාර්යය කොන්දේසියකි.
- අනෙක් අවස්ථාවන්හිදී වුළූඃ කර ගෙන සිටීම සුන්නත් වේ.
- වුළූඃ කිරීමට පිරිසිදු ජලය අවශ්‍ය වේ.
- වුළූඃ සඳහා ෆර්ලු හා සුන්නත් ඇත.
- වුළූඃ කිරීමට අවශ්‍ය ජලය නොමැති විට නැතහොත් ජලය භාවිතා කිරීමට නොහැකි වීම ඊට ප්‍රතිකර්මයක් ලෙස තයම්මුම් කරගත යුතුය.
- වුළූඃ කඩවන කරුණු ''මුබ්තිලාතුල් වුළූඃ ' යනුවෙන් හඳුන්වනු ලැබේ.

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව** :

**කණ්ඩායම 1** : වුළූඃ හි වැදගත්කම පිළිබඳ ව පවසන හදීස් තුනක් තෝරා ලියන්න.

**කණ්ඩායම 2** : වුළූඃ සමඟින් ඉටු කරන ෆර්ලු හා සුන්නත් වන ක්‍රියා ලැයිස්තුගත කරන්න.

**කණ්ඩායම 3** : වුළූඃ හි ෆර්ලු, සුන්නත්, මුබ්තිලාත් ලැයිස්තුගත කරන්න.

**කණ්ඩායම 4** : වුළූඃ හා තයම්මූම් සම්පූර්ණයෙන්ම කර පෙන්වන්න.

**ගෙදර පරිසරයෙන්** :

දිනපතා වුළූඃ සහිතව සිටින්නට හා නිසියාකාරව වුළූඃ ඉටුකිරීමට පුහුණු කරන්න.

**නිපුණතාව 2.0** : ඉස්ලාමයේ මූලික වගකීම්, වැදගත්කම ඒවා ඉටුකරන ක්‍රමය පිළිබඳ ව වටහාගෙන ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 2.2.2** : සලාතය කෙරෙහි පෙර සූදානම දැන ඒවා ඉටු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 2

**ඉගෙනුම් පල** :

- නජීසයේ වර්ග හඳුනාගෙන පවසයි.
- ද්‍රව වර්ග, තහූර් තාහිර්, නජීස් ලෙස වර්ග කර පෙන්වයි.
- සෑම විටම ශරීරය, ඇඳුම, ස්ථානය යනාදියෙහි පිරිසිදුකම රැක ගනිමින් ක්‍රියා කරයි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 1** :

- මුහම්මද් (සල්) තුමාගේ කාලයේදී දිනක් ගම්බද අරාබිවරයෙකු මස්ජිදය තුළ මූත්‍රා කළේය. එය දුටු සහාබාවරු එම මිනිසාට පහරදීමට සූදානම් වූහ. එය දුටු මුහම්මද් (සල්) තුමා ''එම මිනිසාව අතහැර බාල්දියක ජලය පුරවා ගෙනැවිත් මූත්‍රා ඇති ස්ථානයට වක් කරන්න. දහම පහසු කරන්න. එය අපහසුතාවයට පත් නොකරන්න. ජනතාව ඒකරාශි කර ගන්න. එළවා නොදමන්න.''යැයි සහබාවරු දෙස බලා මුහම්මද් (සල්) තුමාණෝ උපදෙස් දුන්හ යන හදීසය කියවන්න සලස්වා පන්තියේ සිසුන්ට අසා සිටින්නට සලස්වන්න.
- ජලයේ වර්ග පිළිබඳ ව සිසුන්ගෙන් පෙර දැනුම දැනගන්න.
- පහත කරුණු මතුවන සේ සාකච්ඡා කරන්න.
  - පිරිසිදු කිරීමට ජලය අත්‍යවශ්‍යය. ජලය වර්ග කර පෙන්වන්න. මාඋන් තහූර් යන ජල වර්ගය පිරිසිදු කිරීමට භාවිතා කරන්නේය. නජීස්වල ස්වභාවයට අනුව පිරිසිදු කරන ක්‍රමය වෙනස් වන්නේය.

**පියවර 2** :

- සිසුන්ව කණ්ඩායම් හතරකට බෙදන්න. සෑම කණ්ඩායමකට ම කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව ලබාදෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකමෙහි සියලුම සිසුන්ව යොදවන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර තහවුරු කරන්න.

**පියවර 3** :

- සෑම කණ්ඩායමකට ම තම වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- නිර්මාණාත්මක අදහස් ඉදිරිපත් කිරීමට එම කණ්ඩායමට අවස්ථාව ලබාදෙන්න. අන් කණ්ඩායම්වලට ද තම අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු ඇතුළත්වන සේ සාකච්ඡා කරන්න.
  - බාහිර පිරිසිදුකම රැක ගැනීමටත් - වුළූඃ කර පරිශුද්ධවීමටත් ජලය අත්‍යවශ්‍යමය. අප වුළූඃ කිරීමට භාවිතා කරන ජලය පිරිසිදුවත්, පිරිසිදු කිරීමේ හැකියාවත් තිබිය යුතුය.
  - විද්වතුන් ජලය කොටස් තුනකට බෙදා දක්වති.
  - මාඋන් තහූර් (පිරිසිදු ජලය - අන්‍ය වස්තූන් පිරිසිදු කරයි.)
  - මාඋන් තාහිර් (පිරිසිදු ජලය - අන්‍ය වස්තූන් පිරිසිදු නොකරයි.
  - මාඋන් නජීස් (අපිරිසිදු ජලය)

- සාගර ජලය, වැසි ජලය, අයිස් කඳු ජලය, ළිං ජලය, ගංගා ජලය යනාදි සියල්ලම මාඋත් තහූර් යන කොටසට අයත් වේ.
- තේ, තැඹිලි වතුර, විවිධ දියර, කුංකුම දියර, සිසිල් බීම යනාදිය මාඋත් තාහිර් යන කොටසට අයත් වේ.
- මූත්‍රා හා නජීස් වන ද්‍රව්‍ය වැටී වර්ණය, සුවඳ, රසය යනාදිය වෙනස් වූ ජලය මාඋත් නජීස් වර්ගයේ ලා සැලකේ.
- කුල්ලතෛන්වලට වඩා අඩු ජලයෙහි අවයව ගිල්වා සේදුවහොත් එම ජලය වුළුඃ කිරීමට නැවත භාවිතා කළ නොහැකිය. කුල්ලතෛන් යනු 210$l$ වූ ජල ප්‍රමාණය වේ.
- නජීස් වර්ග තුනකි. සැහැල්ලු නජීස්, සාමාන්‍ය නජීස් හා දැඩි නජීස් ඒවාවේ.
- මව් කිරි පමණක් බී වැඩෙන අවුඃ 2කට අඩු පිරිමි දරුවෙකුගේ මූත්‍රා සැහැල්ලු නජීස් ලෙස හඳුන්වනු ලැබේ. මෙම නජීස් තැවරුණු ස්ථානය ජලය ඉසීමෙන් පිරිසිදු කළ හැකි ය.
- මළ මූත්‍රා යනාදිය සාමාන්‍ය නජීස් ය. නජීසය තැවරුණු ස්ථානයේ නජීසයෙහි වර්ණය, රසය, සුවඳ යානදි ගුණාංග ඉවත්වන තුරු සේදිය යුතුය. වර්ණය, සුවඳ යනාදිය ස්වල්ප වශයෙන් දක්නට ලැබේ නම්, එය අපිරිසිදු යැයි නොසැලකේ.
- බල්ලන්, ඌරන් යනාදිය දැඩි නජීස් වේ. මෙම සතුන්ගේ කිසියම් ද්‍රව්‍යයක් තැවරුණු ස්ථානය ජලයෙන් සත් වතාවක් සේදිය යුතු අතර ඉන් එක්වරක් පස් මිශ්‍ර ජලයෙන් සෝදා පිරිසිදු කර ගත යුතුය.

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව :**

**කණ්ඩායම 1** : පිරිසිදුකම පිළිබඳ ව සඳහන් වන අල්කුර්ආන් වැකියක් හා හදීසයක් සාකච්ඡා කර සොයා ලියන්න.

**කණ්ඩායම 2** : නජීස් වර්ග කර සාකච්ඡා කොට සියල්ලටම උදාහරණ එක බැගින් ලියන්න.

**කණ්ඩායම 3** : ජලයේ වර්ග සාකච්ඡා කොට සියලු වර්ග විස්තර කරන්න.

**ගෙදර පරිසරයෙන් :**

නජීස් වර්ග පිරිසිදු කරන ක්‍රම පිළිබඳව ඔබගේ දෙමාපියන්ගෙන් අසා ලියන්නට යොමු කරන්න.

**නිපුණතාව 2.0** : ඉස්ලාමයේ මූලික වගකීම්, වැදගත්කම ඒවා ඉටු කරන ක්‍රමය පිළිබඳ ව වටහාගෙන ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 2.5:** සලාතයේ නීතිරීති දැන සලාතය ඉටු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 2

**ඉගෙනුම් පල** :

- සලාතය ඉස්ලාමයේ ප්‍රධාන වගකීම්වලින් එකක් යන්න, දැන පවසයි.
- සලාතයේ වැදගත්කම පිළිබඳවත් විශේෂත්වයන් පිළිබඳවත් විස්තරාත්මකව පවසයි.
- දිනපතා සලාතය කැමැත්තෙන් ඉටු කරයි.
- සලාතයේ වැදගත්කම හා විශේෂත්වය පිළිබඳව අන් අයට පවසයි. සලාතය ඉටු කිරීමට කැඳවයි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 1** :

- ''අමානිදම් නම් ගුණය නොමැත්තෙකු තුළ ඊමාන් නොමැත. පිරිසිදුකම නැති අයෙකු තුළ සලාතය නැත. සලාතය නොමැත්තාට ආගම නැත. ධර්මය තුළ සලාතයට හිමි තත්ත්වය ශරීරයේ හිසට හිමි තත්ත්වයට සමානය. (අත්තබරානි)

  සිසුවෙකු මඟින් මෙම හදීසය කියවීමට සලස්වන්න. අනෙක් සිසුන් එයට සවන් දෙනවා ද යන්න, ස්ථිර කර ගන්න.
- කියවන ලද හදීසයෙන් සලාතය පිළිබඳව සිසුන්ගේ අදහස් විමසා දැන ගන්න.
- සිසුන් දිනපතාම සලාතය ඉටු කරනවා ද යන්න ඔවුන්ගෙන් අසා දැන ගන්න.
- දිනපතාම සලාතය ඉටු කරන සිසුන්ව ප්‍රශංසා කර දිරිමත් කරන්න. සලාතය ඉටු කිරීමෙහිලා අලසකමක් දක්වන සිසුන්ට එහි වැදගත්කම පිළිබඳව අවවාද කරන්න.
- පහත කරුණු ඇතුළත්වන සේ සාකච්ඡා කරන්න.
  - සලාතය ඉස්ලාමයෙහි මූලික දෙවන වගකීම වේ. අස්සලාත් යන්නෙහි භාෂාමය තේරුම ''ප්‍රාර්ථනාව'' වේ. සලාතය මී : රාජ් ගිය අවස්ථාවේ දී අනිවාර්යය කරන ලදී. සලාතයේ වැදගත්කම අල්කුර්ආනයේත් අස්සුන්නාවෙහිත් සඳහන් කර ඇත. සලාතය වේලාව නියම කරන ලද නැමදුමකි. පරමාන්ත දින ප්‍රථමයෙන්ම විමසනු ලබන්නේ සලාතය පිළිබඳවය.

**පියවර 2** :

- සිසුන්ව කණ්ඩායම් හතරකට බෙදන්න. සෑම කණ්ඩායමකටම කණ්ඩායම් ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම නිරීක්ෂණය කොට මෙහෙයවන්න.

**පියවර 3** :

- සාකච්ඡා කොට ලබා ගත් අදහස් පන්තිය තුළ ඉදිරිපත් කිරීමට සෑම කණ්ඩායමකටම අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායම්වල වැදගත් අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව සලස්වන්න.
  - අඩුපාඩු නිවැරදි කර ගැනීමට මඟ පෙන්වන්න.
  - පහත කරුණු ඇතුළත්වන සේ සාකච්ඡා කරන්න.

- මි : රාජ් ගමනේ දී සලාතය 50 වතාවක් ඉටු කිරීමට වගකීමක් පවරන ලදුව, පසුව එය පංච කාලය දක්වා අඩු කරන ලදී.
- ''තවද ජින්වරු හා මිනිසුන් මා නැමදීමට මිස මම මැවුවේ නැත.'' (51: 56)
- ''තවද ඔවුහු කවරහු ද යත් තමන්ගේ සලාතයන් සුපරීක්ෂාකාරීව ඉටු කරන්නන් ය. මොවුහු ස්වර්ගයට හිමිකරුවන්ය. තවද ඔවුහු කවුරුන්ද යත් ෆිර්දව්සය (ස්වර්ගය) උරුම කර ගන්නා අය වෙති. ඔවුහු එහි සදාකල් වෙසෙති. ''(23 : 9-- 11)
- ''නියත වශයෙන්ම නියමිත වේලාවන්හි දී සලාතය ඉටු කිරීම මූ : මින්වරුන්ට අනිවාර්යය කර ඇත.'' (4 : 103)
- පරමාන්ත දින මිනිසෙකුගේ අමල් පිළිබඳව විමසනු ලබන විට, සලාතය පිළිබඳ ව ප්‍රථමයෙන් ම විමසනු ලබයි. එය ක්‍රමවත්ව පවතින්නේ නම්, අනෙක් සියලු නැමදුම් වතාවත් ක්‍රමවත් ව පවතී. එය අක්‍රමවත් නම්, අනෙක් සියල්ලම අක්‍රමවත් වෙයි. (අබූදාවූද්)

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව :**

**කණ්ඩායම 1** : සලාතයේ වැදගත්කම, විශේෂත්වය පිළිබඳ සඳහන් වන පහත දැක්වෙන අල්-කුර්ආන් වැකිවල පරිවර්තනය තර්ජුමතුල් කුර්ආනයෙන් සොයා ලියන්න. (4 : 103) (29 : 45)

**කණ්ඩායම 2** : සලාතයේ වැදගත්කම හුවා දක්වන හදීස් හතරක් සොයා ලියන්න.

**කණ්ඩායම 3** : සලාතය අනිවාර්යය කළ සිද්ධිය සොයා ලියන්න.

**කණ්ඩායම 4** : සලාතය අදාළ වේලාවල ඉටු කළ යුතු වගකීමක් යන්න අවධාරණය කරන අල්කුර්ආන් හා හදීස් වාක්‍යය ලියන්න.

**ගෙදර පරිසරයෙන් :**

සලාතය ඉටු කරන විට ස්ත්‍රීන් හා පුරුෂයින් අඳින ඇඳුම් ද සලාතයේ ඉරියව් යනාදියේ වෙනස්කම් දෙමාපියන්ගෙන් විමසා ලිවීමට යොමු කරන්න.

**නිපුණතාව 2.0** : ඉස්ලාමයේ මූලික වගකීම්, වැදගත්කම ඒවා ඉටු කරන ක්‍රමය පිළිබඳ ව වටහාගෙන ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 2.3.2:** සලාතයේ නීතිරීති දැන සලාතය ඉටු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 2

**ඉගෙනුම් පල** :
- සලාතයේ ෆර්ළු හා ෂර්තයන් දැන කටයුතු කරයි.
- එසේ ඉටු කළහොත් පමණක් සලාතය පිළිගනු ලබන්නේය යන්න වටහා ගනියි.
- ෂර්ත් හා ෆර්ළු අනුව නිසි පරිදි සලාතය ඉටු කරයි.
- සලාතයේ සුන්නතයන් නිසි පරිදි ඉටු කරයි.
- සලාතය බිඳ වැටෙන ක්‍රියා අවබෝධ කරගෙන ඉන් වැළකී සිටියි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 1** :
- 'අබූ හුරෛරා (රලි) තුමා මෙසේ පවසයි. දිනක් නබි (සල්) තුමා මස්ජිදයේ වාඩිවී සිටින විට මිනිසෙක් පැමිණ සලාතය ඉටු කළේ ය. පසුව නබිතුමා වෙත පැමිණ සලාම් කීවේ ය. එයට පිළිතුරු දුන් එතුමා '' ඔබ නැවත වරක් සලාතය ඉටු කරන්න '' යැයි පැවසී ය. මෙය තෙවතාවක් නබිතුමා පැවසූ විට, එම මිනිසා ''යාරසූලුල්ලාහ්, මට කියා දෙන්න '' යැයි පැවසී ය. එවිට නබි (සල්) තුමා ''ඔබ සලාතයට සූදානම් වන විට නිවැරදි ව වුළු කරන්න. පසුව කිබ්ලාව දෙසට හැරී තක්බීර් බඳින්න. පසුව ඔබට පහසු අල් - කුර්ආන් වැකි පාරායනය කරන්න. පසුව රුකූඃ කරන්න. නැවත කෙළින් සිටගන්න. පසුව සජදා කරන්න. නැවත හිස ඔසවා ඍජුව තබා ගන්න. මේ ආකාරයට අනෙක් රකාඅත්වල ද සිදු කරන්න. (සංයමයෙන් ඉටු කළ යුතුය) (බුහාරි) මෙම හදීසය ශිෂ්‍යයෙකුට ශබ්ද නඟා කියවීමට ඉඩ සලස්වන්න.
- සලාත් කළ යුතු ආකාරය පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- පහත කරුණු ඇතුළත්වන සේ සාකච්ඡා කරන්න.
  - සලාතය ඉස්ලාමයේ ප්‍රධාන වගකීමකි. සියලුම දෑට මෙන්ම සලාතයට ද නිශ්චිත ක්‍රමවේදයක් ඇත. ෂර්ත් හා ෆර්ළු පිළිබඳ සැලකිලිමත් වන්නේ නම් පමණි සලාතය පිළිගැනීමට ලක්වනුයේ.

**පියවර 2** :
- සිසුන්ව කණ්ඩායම් හතරකට බෙදන්න. සෑම කණ්ඩායමකටම කණ්ඩායම් ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම නිරීක්ෂණය කොට මෙහෙයවන්න.

**පියවර 3** :
- සාකච්ඡා කොට ලබා ගත් අදහස් පන්තිය තුළ ඉදිරිපත් කිරීමට සෑම කණ්ඩායමකටම අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායම්වල වැදගත් අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව සලස්වන්න.
- පහත කරුණු ඇතුළත්වන සේ සාකච්ඡා කරන්න.
  - සලාතයේ ෂර්ත් 10 හා ෆර්ලු 19 ක් තිබේ.
  - අල්ලාහ්ගේ පිළිගැනීමට ලක් වෙන සලාතයට කුසල් හිමිවේ. පව් සමා කරනු ලැබේ.

- සලාතයේ ප්‍රධාන සුන්නත් 7 ක් තිබේ. ඒවා නිසි පරිදි ඉටු කිරීමෙන් සලාතය පූර්ණත්වයට පත්වේ.
- සලාතය බිඳ වැටෙන ක්‍රියා මුබ්තිලාත් වේ.
- සලාතයේ මුබ්තිලාත් 09 කි.
- අල්ලාහ් අනුමත කරන ලබන සලාතයට කුසල් හිමි වේ. අකුසල් කමා කෙරේ.

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව :**

**කණ්ඩායම 1** : සලාතයේ ෂර්තයන් රැස් කර ලියන්න.

**කණ්ඩායම 2** : සලාතයේ ෆර්ලු අනුපිළිවෙලට ලියන්න.

**කණ්ඩායම 3** : සලාතයේ ප්‍රධාන සුන්නත් ලියන්න.

**කණ්ඩායම 4** : සලාතයේ මුබ්තිලාත් ලියන්න.

**ගෙදර පරිසරයෙන් :**

ඔබගේ මව හෝ නිවසේ සිටින වැඩිහිටියෙකුගේ සලාතය අවධානයට ලක් කොට එහි දක්නට ලැබෙන සුන්නත් 10ක් ලැයිස්තුගත කොට පැමිණෙන්න.

**නිපුණතාව 2.0** : ඉස්ලාමයේ මූලික වගකීම්, වැදගත්කම ඒවා ඉටු කරන ක්‍රමය පිළිබඳ ව වටහාගෙන ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 2.4** : උපවාසය පිළිබඳව දැන උපවාසයේ නියැළෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 1

**ඉගෙනුම් පල** :

- උපවාසයේ වැදගත්කම දැන පවසයි.
- රමළානයේ විශේෂත්වය පිළිබඳව මූලාශ්‍ර සහිතව සවිස්තරාත්මකව පවසයි.
- උපවාසයේ අරමුණු වටහාගෙන අවධානයෙන් උපවාසයේ නියැළී පාපයෙන් වැළකී ජීවත් වෙයි.
- රමළාන් මස සිදු කරනු ලබන ක්‍රියාවන්ට විශේෂයක් ඇතැයි දැනගෙන අන්‍යයන්ටත් පවසයි.
- උපවාසයේ බලපෑම් දැන පැහැදිලි කරයි.
- දුගීන්ගේ කුසගින්න, පිපාසය වටහා ගෙන ඔවුන්ට උපකාර කරයි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 1** :

- ''ආදම්ගේ දරුවන් සිදු කරනු ලබන සියලුම ක්‍රියාවන් ඔවුන් වෙනුවෙන් ඉටු කර ගනු ලබන්නේය. උපවාසය හැර, එය මට අයත්ය. එයට මම ම කුසල් ලබා දෙන්නෙමි. ඔහු මා උදෙසාම අනුභව කිරීමෙන් වැළකෙන්නේය. මා උදෙසාම පානය නොකරන්නේය. මට බිය බැතිව ඔහු තම ආශාවන් මැඩ පවත්වා ගන්නේය.''

  ස්වකැමැත්තෙන්ම ඉදිරිපත්වී කියවන සිසුවෙකු මඟින් කියවීමට සලස්වන්න.
- කියවන ලද හදීසය කුමක් පිළිබඳව පවසයි ද කියා විමසා සිසුන්ගෙන් අදහස් විමසන්න.
- පහත කරුණු ඇතුළත්වන සේ සාකච්ඡා කරන්න.
  - සෑම මුස්ලිම්වරයෙකුට ම රමළාන් මාසයේ උපවාසයේ නියැළීම ෆර්ලු වේ. (අනිවාර්යය වේ)
  - ඉස්ලාමයේ තෙවන මූලික වගකීම වන උපවාසය හිජ්රි වර්ෂ 02 දී අනිවාර්යය කරන ලදී.
  - උපවාසය යන පදයට අරාබි පදය ''අස්සවුම්'' වේ.
  - රමළාන් මාසය තුළ ඉටු කරන සියලුම යහ ක්‍රියාවන්ට අනෙක් කාලවලට වඩා වැඩි කුසල් ප්‍රමාණයක් ලබා දෙන බව අල්ලාහ් පොරොන්දු වුණේය.
  - රමළාන් මාසයේ දින 30 හෝ 29 ම දහයේ කාණ්ඩ තුනකට බෙදා තිබෙන බව හදීස්වල සඳහන් වේ.
  - රමළාන් මාසය තුළ තරාවීහ්, කියාමුල් ලෛල් යනාදිය ඉටු කිරීම මඟින් අධික කුසල් ලබාගත හැකිය.
  - සලාතයේ ෆර්ලු, සුන්නත් සලාත් තිබෙන්නාක් මෙන් උපවාසයේත් ෆර්ලු, සුන්නත් උපවාස ඇත.

**පියවර 2** :

- සිසුන්ව කණ්ඩායම් පහකට බෙදන්න.
- අවශ්‍ය පරිදි ලිපි ද්‍රව්‍ය, ෆෙල්ට් පෑන් සෑම කණ්ඩායමකටම ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම හොඳින් නිරීක්ෂණය කරන්න.

- සෑම කණ්ඩායමකට ම වාර්තාවක් ඉදිරිපත් කිරීමට සූදානම් වන ලෙස අවවාද කරන්න.

පියවර 3 :
- සාකච්ඡා කර ලබා ගත් අදහස් පංතිය තුළ ඉදිරිපත් කිරීමට සෑම කණ්ඩායමකටම අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායම්වලට තම අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- වැරදි නිවැරදි කර ගැනීමට මඟ පෙන්වන්න.
- පහත කරුණු ඇතුළත්වන සේ සාකච්ඡා කරන්න.
  - සහර් වේලාවේ සිට හිරු බැස යන (මහ්රිබ් අදාන්) තුරු අල්ලාහ් උදෙසා ආහාර - පාන අනුභව නොකොට, උපවාසය කඩවන කාර්යයන්හි නොයෙදී සිටීම උපවාසය වේ.
  - ''විශ්වාසවන්තයිනි! ඔබට පෙර සිටියවුන් වෙත අනිවාර්යය කළාක් මෙන් ඔබලා බිය බැතිව සිටීමට ඔබලා වෙතත් උපවාසය අනිවාර්යය කරන ලදී.'' (2 : 183)
  - යමෙකු දේව විශ්වාසයෙන් හා පරමාන්ත දින කුසල් ලබා ගැනීමේ අදිටනින් රමළාන් මස උපවාසයේ නියැළෙන්නේ නම් ඔහු පෙර සිදු කරන ලද පාපයන් අල්ලාහ් කමා කරන්නේය. (බුහාරී, මුස්ලිම්)
  - රමළාන් මස ඉටු කරන එක් ෆර්ලයකට ෆර්ලු 70ක් ඉටු කළ කුසල් ද එක් සුන්නතයකට ෆර්ලයක් ඉටු කළ කුසල් ද ලැබෙන බව නබි (සල්) තුමාණෝ පැවසූහ.
  - රමළාන් මස ප්‍රථම දින දහය තුළ අල්ලාහ්ගේ දයාවත් (රහ්මත්) දෙවන දින දහය තුළ පව් කමාවත් (මෑෆිරත්) අවසාන දින දහය තුළ නිරයේ නිදහසත් (ඉත්කුම් මිනන් නාර්) වෙනුවෙන් ප්‍රාර්ථනා කරන ලෙස හදීස් දේශනා කරයි.
  - ''යමෙකු රමළාන් මස රාත්‍රියෙහි දේව විශ්වාසයෙන් හා පරමාන්ත දින කුසල් ලබා ගැනීමේ අදිටනින් සලාතය (කියමුල් ලෛල්, තරාවීහ්) ඉටු කරන්නේ නම්, ඔහුගේ පෙර පාපයන් අල්ලාහ් කමා කරන්නේය. (බුහාරී, මුස්ලිම්)
  - ස්වර්ගයේ ''රෛයාන්'' නම් වූ දොරටුවක් ඇත. සවුම්ධාරීන් පමණක් පරමාන්ත දින ඒ තුළින් ඇතුළු වේ. ඔවුන් හැර වෙන කිසිවෙකුත් ඒ තුළින් ඇතුළු නොවේ. (බුහාරී, මුස්ලිම්)
  - මාස දහයකට වඩා විශේෂ වූ රාත්‍රියක් රමළාන් මාසය සතු වේ. එම රාත්‍රිය ''ලෛයිලතුල් කද්ර්'' යනුවෙන් හඳුන්වනු ලැබේ.

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව :**

**කණ්ඩායම 1** : උපවාසයේ මහිමය පිළිබඳව ලැයිස්තු ගත කරන්න.

**කණ්ඩායම 2** : උපවාසය ඉටුකරන්නාට හිමිවන කුසල් පිළිබඳව සාකච්ඡා කර ලියන්න.

**කණ්ඩායම් 3** : කණ්ඩායමේ සියල්ලෝම සාකච්ඡා කර ඔබගේ මුස්ලිම් නොවන යහලුවෙකුට උපවාසය හඳුන්වාදෙන ලිපියක් ලියන්න.

**කණ්ඩායම් 4** : පසුගිය රමළාන් මස ඔබ විශේෂයෙන් ඉටු කළ යහක්‍රියාවන් පිළිබඳ ව සාකච්ඡා කොට ලැයිස්තුගත කරන්න.

**ගෙදර පරිසරයෙන් :**

රමළාන් මාසයේ සිදු කරනු ලබන කුසල් ක්‍රියා පිළිබඳ සටහනක් හෝ මුහාසබා සටහනක් පවත්වාගෙන යෑමට උපදෙස් ලබාදෙන්න.

**නිපුණතාව 3.0** : ඉස්ලාම් පවසන යහ ගුණාංග දැන ඒවායෙහි වැදගත්කම වටහාගෙන, පුද්ගලික ජීවිතයේත් සමූහ ජීවිතයේත් ගෙන හැර දක්වා ආදර්ශමත් ලෙස ජීවත්වී අන්‍යයන්ට මඟපෙන්වයි.

**නිපුණතා මට්ටම 3.1** : ගුරුවරුන්ගේ උසස් බව දැන ඔවුන්ට ගරු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 2

**ඉගෙනුම් පල** :
- ගුරුවරුන්ගේ උසස් බව, ගරුත්වය යනාදිය පිළිබඳ ව දැන විස්තර කරයි.
- සැමවිටම ගුරුවරුන්ට ගරු කොට ඔවුන් උදෙසා ප්‍රාර්ථනා කරයි.
- ගුරුවරු සමඟ විනීතව හැසිරෙයි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 1** :
- ''අපගෙන් වැඩිහිටියන්ට ගරු නොකරන්නන් ද ළමුන්ට ආදරය නොකරන්නන් ද ගුරුවරුන්ගේ අයිතීන් ලබා නොදෙන්නන් ද අපගේ අය නොවෙති.'' (අහ්මද්)

  මෙම හදීසය, ස්ව කැමැත්තෙන්ම ඉදිරිපත් වන සිසුවෙකු මඟින් කියවීමට සලස්වන්න.
- අනෙක් සිසුන්ට එය ඇසීමට සලස්වන්න.
- ගුරුවරුන්ගේ උසස් බව පිළිබඳව සිසුන් වටහාගෙන ඇති දේ අසා දැන ගන්න.
- පහත කරුණු ඇතුළත්වන සේ සාකච්ඡා කරන්න.
  - ගුරුවරු උසස් භාවය ඇති පුද්ගලයෝ වේ.
  - ඔවුන්ගේ උසස් භාවය පිළිබඳව ඉස්ලාම් පැහැදිලි උපදෙස් ඉදිරිපත් කර ඇත.
  - ඉස්ලාමීය ඉතිහාසය තුළ ගුරුවරුන්ව ගරු කොට සැලකූ බවට ඓතිහාසික සාක්ෂි බොහෝමයක් දක්නට ලැබේ.
  - ඉමාම්වරු හා ගුරුවරුන් උදෙසා අපි ප්‍රාර්ථනා කළ යුතුය.

**පියවර 2** :
- සිසුන්ව කණ්ඩායම් තුනකට බෙදන්න.
- සෑම කණ්ඩායමකට ම කණ්ඩායම් ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම නිරීක්ෂණය කර තහවුරු කරන්න.
- සාකච්ඡා කර අදහස් මතු කිරීමට ඉඩ ලබා දෙන්න.

**පියවර 3** :
- සාකච්ඡා කොට ලබා ගත් අදහස් පංතිය තුළ ඉදිරිපත් කිරීමට සෑම කණ්ඩායමකටම අවස්ථාව ලබා දෙන්න.
- වැරදි නිවැරදි කොට විස්තර කිරීමට එම කණ්ඩායමට ම ප්‍රථමයෙන් අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායම්වල නිර්මාණාත්මක අදහස් විමසා ලබා ගන්න.
- පහත කරුණු ඇතුළත්වන සේ නැවත සමාලෝචනය කරන්න.
  - ගුරුවරු ගෞරවය හිමි පුද්ගලයෝය. ගරුත්වය ලැබීමට සුදුස්සන්ය.
  - ''ඔබලා අතර සිටින විශ්වාසවන්තයින්ගේත් උගතුන්ගේත් තත්වය අල්ලාහ් උසස් කරන්නේය.''

- අල්ලාහ්ත් ඔහුගේ මලාඉකාවරුත් අහසේත් පොළොවේත් ඇති සියලුම මැවීම්ද තුඹස තුළ සිටින කුඹිහුද සයුරේ සිටින මත්ස්‍යයෝ ඇතුළු සියල්ලෝම ගුරුවරුන් උදෙසා ප්‍රාර්ථනා කරති. (තිර්මිදි)
- ගුරුවරුන්ට ගරු කළ යුතුයි. ඔවුන් උදෙසා ප්‍රාර්ථනා කළ යුතුයි.

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව :**

**කණ්ඩායම 1** : ගුරුවරුන්ගේ උසස් බව ගැන පවසන අල්කුර්ආන් වාක්‍ය ගොනුකර ලියන්න.

**කණ්ඩායම 2** : ගුරුවරුන්ගේ සහ උගතුන්ගේ ගෞරවය ගැන කියන හදීස් ලියන්න.

**කණ්ඩායම 3** : ගුරුවරුන්ගේ ගෞරවය රැක ගැනීමට අනුගමනය කළයුතු දෑ ලැයිස්තුගත කරන්න.

**ගෙදර පරිසරයෙන් :**

ගුරුවරුන් සමඟ සමීපව අසුරු කිරීමටත්, ඔවුන් වෙනුවෙන් දිනපතා දුආ ප්‍රාර්ථනා කිරීමටත් යොමු කරන්න.

**නිපුණතාව 3:0** : ඉස්ලාම් පවසන යහ ගුණාංග දැන ඒවායෙහි වැදගත්කම වටහාගෙන, පුද්ගලික ජීවිතයේත් සමූහ ජීවිතයේත් ගෙන හැර දක්වා ආදර්ශමත් ලෙස ජීවත්වී අන්‍යයන්ට මඟපෙන්වයි.

**නිපුණතා මට්ටම 3:2** : දෙමාපියන්ට ගෞරව කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 2

**ඉගෙනුම් පල** :
- දෙමාපියන්ට ගරු කිරීමේ අවශ්‍යතාව පිළිබඳව විස්තර කරයි.
- දෙමාපියන්ගේ ගරුත්වයට හානි කරන අංග දැන ගෙන ඒවායින් වැළකී ක්‍රියා කරයි.
- දෙමාපියන් උදෙසා සැමවිටම උපකාර කරමින් ක්‍රියා කරයි.
- දෙමාපියන් උදෙසා සැමවිටම ප්‍රාර්ථනා කරයි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 1** :
- 

  මෙම දුආ ව සිසුවකු මඟින් කියවීමට සලස්වා එයට අනෙක් සිසුන්ට සවන්දීමට සලස්වන්න.
- දුආව උසුරීමට සලස්වන්න.
- තම දෙමාපියන් වෙනුවෙන් ඔවුන් කෙසේ ප්‍රාර්ථනා කරන්නේ ද යන්න සිසුන්ගෙන් අසා දැන ගන්න.
- පහත කරුණු ඇතුළත්වන සේ සාකච්ඡා කරන්න.
  - ඉස්ලාමය දෙමාපියන්ට උසස් තත්ත්වයක් ලබා දෙන්නේය. අල්ලාහ්ව
    رَبَّنَا اغْفِرْ لِي وَلِوَالِدَيَّ وَلِلْمُؤْمِنِينَ يَوْمَ يَقُومُ الْحِسَابُ
    විශ්වාස කිරීමෙන් හා නැමදීමෙන් පසුව දෙමාපියන්ට ඇප උපස්ථාන කිරීමට ඉස්ලාමය අවධාරණය කර ඇත.
  - දෙමාපියන් මිය ගිය පසුවත් ඔවුන්ට උපහාර පුදන මෙන් ඉස්ලාමය අණකර ඇත.
  - දෙමාපියන්ට දුක්වේදනා දීම මහා පාප කර්මයකි.

**පියවර 2** :
- සිසුන්ව කණ්ඩායම් හතරකට බෙදන්න. සෑම කණ්ඩායමකට ම කණ්ඩායම් ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම අවධානය කර මෙහෙයවන්න.

**පියවර 3** :
- තමන් සාකච්ඡා කර ලබා ගත් අදහස් පන්තිය තුළ ඉදිරිපත් කිරිමට සෑම කණ්ඩායමකට ම අවස්ථාව ලබා දෙන්න.
- අඩුපාඩු සම්පූර්ණ කර විස්තර කිරීමට එම කණ්ඩායමට ම ප්‍රථමයෙන් අවස්ථාව ලබා දෙන්න.
- අන් කණ්ඩායම්වල වැදගත් අදහස් විමසා ලබා ගන්න.
- පහත කරුණු අන්තර්ගත කර සමාලෝචනය කරන්න.
  - දෙමාපියන් සමඟ ගෞරවනීය ලෙස හැසිරීමෙන් දෙලොවෙහි ම යහපත් භාග්‍යයක් ලබාගත හැකිය. මව හා පියාට ඉටුකළ යුතු වගකීම අල්ලාහ්, තමාට ඉටුකළ යුතු වගකීම් සමඟ එක්කොට පැවැසුවේය.

- අප වෙනුවෙන් අපගේ දෙමාපියන්ට අත් විඳි කරදර ගැන සිතා, ඔවුන් අප සමඟ සෙනෙහසින් ක්‍රියා කොට, අපට ඉටු කරන ලද යහපත උදෙසා තුති පුදමින් හැසිරිය යුතුය.
- දෙමාපියන්ව සැමවිටම සතුටින් තබාගත යුතුය. ''දෙමාපියන්ගේ තෘප්තියෙහි අල්ලාහ්ගේ තෘප්තිය දක්නට ලැබේ. දෙමාපියන්ගේ පිළිකුලෙහි අල්ලාහ්ගේ පිළිකුල දක්නට ලැබේ''. (තිර්මිදි)
- ''නුඹලා අල්ලාහ් හැර වෙනත් කිසිවකු නොඅදහනු. තව ද දෙමාපියන්ට දයාබර වනු. ඔවුන් දෙදෙනාගෙන් කෙනකු හෝ දෙදෙනාම මහලු වියට පත්වුවහොත් ඔවුන් දෙදෙනාට උෆ්ෆීන් (ඒ) යනුවෙන් නොකියනු. ඔවුන් දෙදෙනාව දුර්මුඛ නොකරනු. ඔවුන් දෙදෙනාට ගෞරව වචනයෙන් ආමන්ත්‍රණය කරනු''. (17: 23)
- දෙමාපියන් උදෙසා සැමවිටම ප්‍රාර්ථනා කරන්න.

- මාගේ දෙවියනේ! බාලවියේ දී කෙසේ මාව මොවුන් කරුණාවෙන් සෙනෙහසින් හදා වඩා ගත්තේ ද එසේම ඔවුන් වෙත ඔබ කරුණාව දක්වනු මැනවි. (17 : 24)

- ''අපගේ දෙවියනේ! මටත් මගේ දෙමාපියන්ටත් විශ්වාසවන්තයින් සියල්ලන්ටමත් ප්‍රශ්න අසනු ලබන දිනයේ දී සමාව දෙනු මැනව!''

(14 : 41)

- දෙමාපියන් ඉදිරියේ උස් හඬින් කතා කිරීම, ඔවුන් සිටගෙන සිටින විට අප හිඳ ගැනීම, එක්ව ඇවිදගෙන යන විට ඔවුන්ට ඉදිරියෙන් ගමන් කිරීම, ඔවුන්ව නම [illegible] පෙර තමාට හෝ තම දරුවන්ට ආහාර බෙදා දීම, ඔවුන්ගේ කාමරවලට අනුමැතියකින් තොරව ඇතුලුවීම යනාදිය ගෞරවය කෙළෙසන්නාවූ ක්‍රියාවන් වේ.

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව :**

**කණ්ඩායම 1** : පහත කුර්ආන් වැකිවල පරිවර්තනය කියවා හොඳින් සාකච්ඡා කර එයින් අපගේ ජීවිතයේ පිළිපැදිය හැකි ආදර්ශයයන් තෝරා ගෙන ලියන්න.

(අන් නිසා : 36) (ලුක්මාන් : 114) (බනු ඉස්රායීල් :23)

**කණ්ඩායම 2** : දෙමව්පියන්ට ඇප උපකාර කිරීම පිළිබඳව ඇති හදීස් හතරක් ගොනුකර එහි සඳහන් යුතුකම් ලියන්න.

**කණ්ඩායම 3** : අප අපගේ දෙමාපියන්ට කෙසේ ගෞරව කර ඔවුන්ට උපකාර කළ හැකි ද යන ක්‍රියාමාර්ගයන් සාකච්ඡා කර ලැයිස්තු ගත කරන්න.

**කණ්ඩායම 4** : දෙමව්පියන්ට අප ගරු කළ යුත්තේ ඇයි යන්නත් ඔවුන් අප වෙනුවෙන් විඳින දුක් කරදරයන් වෙන වෙනම ලැයිස්තු ගත කරන්න.

**ගෙදර පරිසරයෙන්**

දෙමාපියන්ට කළ යුතු යුතුකම් තවදුරටත් වර්ධනය කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග ලිවීමට යොමු කරන්න.

**නිපුණතාව 3:0** : ඉස්ලාම් පවසන යහ ගුණාංග දන ඒවායෙහි වැදගත්කම වටහාගෙන පුද්ගලික ජීවිතයේත් සමූහ ජීවිතයේත් ගෙන හැර දක්වා ආදර්ශමත් ලෙස ජීවත්වී අනායයන්ට මඟපෙන්වයි.

**නිපුණතා මට්ටම 3:3** : දිව රැකගෙන ක්‍රියාකරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 2

**ඉගෙනුම් පල** :

- දිව රැක ගැනීම මඟින් ලැබෙන යහපත දන පවසයි.
- කථාකරන විට පිළිපැදිය යුතු කොන්දේසි හඳුනාගෙන පවසයි.
- මිනිසුන්ගේ සිත ආකර්ශනය වන සුමිහිරි වචනයෙන් දෙලොවේ ම යහපත ලබාගත හැකි බව පිළිගෙන ඒවා ක්‍රියාත්මක කරයි.
- සන්නිවේදනයේ දී සිත ආකර්ශනය වන පරිදි සෙනෙහෙබර වචන භාවිත කරයි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**

පියවර 1 :

- කතාව අපට ලබා දී ඇති දායාදයක් බවත් එය 'අමානිදම්' බවත්, සිසුන්ට මතක් කරන්න. කෙනෙකුගේ කතාව මඟින් කුමක් වටහාගන්නේ දැයි සිසුන්ගෙන් විමසන්න.
- අපගේ සන්නිවේදනය ඉස්ලාමීය ගුණාංග හා ශිෂ්ටාචාරයට අනුකූලව තිබිය යුතු බව අවවාද කරන්න.
- පහත කරුණු ඇතුළත්වන සේ සාකච්ඡා කරන්න.
    - කථනය යනු සන්නිවේදනයට හා මිනිසාව ආකර්ශනය කිරීමට ඇති මාධ්‍යයකි.
    - කථනය මඟින් කුසල් හිමිකර ගැනීමට මඟපෙන්වීමක් ඉස්ලාමය ලබා දෙන්නේය.
    - මිනිසා කරන උපකාර උදෙසා තුති පිදීමත් මිනිසාට ආශිර්වාද කිරීමත් ඉස්ලාමය දේශනා කරන්නාවූ ගුණාංග වේ.
    - දිව පාලනයෙන් ස්වර්ගය ලැබෙන බව නබි (සල්) තුමාණෝ පැවසූහ.
- සිසුන්ව කණ්ඩායම් හතරකට බෙදන්න. සෑම කණ්ඩායමටම කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව ලබා දෙන්න.
- සාකච්ඡා කර අදහස් එළි දැක්වීමට ඉඩ සලස්වන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කොට තහවුරු කරන්න.

පියවර 2 :

- සෑම කණ්ඩායමකටම තම කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව ඉදිරිපත් කිරිමට අවස්ථාව ලබා දෙන්න.
- අමතර තොරතුරු ඉදිරිපත් කර විස්තර කිරීමට එම කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායම්වල නිර්මාණාත්මක අදහස් විමසා ලබාගන්න.

පියවර 3 :

- සාකච්ඡා කොට ලබා ගත් අදහස් පන්තිය තුළ ඉදිරිපත් කිරීමට සෑම කණ්ඩායමකටම අවස්ථාව ලබා දෙන්න.
- වැරදි නිවැරදි කොට විස්තර කිරීමට එම කණ්ඩායමට ප්‍රථමයෙන් අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායම්වල නිර්මාණාත්මක අදහස් විමසා ලබා ගන්න.

- පහත කරුණු ඇතුළත්වන සේ නැවත සමාලෝචනය කරන්න.
  - කථනය යනු අල්ලාහ් මිනිසාට ලබා දුන් ඉමහත් දායාදයයි.
  - ''මිනිසාට කථනය ඉගැන්වූයේ ඔහුමය'' (55:4)
  - අයහපත් ආකාරයට කථනයෙහි නියැළීම අල්ලාහ් දුන් දායාදය අපයෝජනයට ලක් කිරීමක් මෙන්ය. ඉස්ලාම් කථනය සමඟ ඊමාන් සම්බන්ධ කර අගයන්නේ ය. කථනයෙහි නියැළෙන විට වැරැදි වචන භාවිතයෙන් ගැටලු ඇති වේ යනුවෙන් සිතන්නේ නම් නිහඬ ව සිටින ලෙස ඉස්ලාමය පවසයි.
  - මුහම්මද් (සල්) තුමා''යමෙකු අල්ලාහ්ව හා පරමාන්ත දිනය විශ්වාස කරන්නේ නම්, ඔහු යහපත කථා කරත්වා නැතහොත් නිහඬව සිටිත්වා'' යනුවෙන් පැවසුවේ ය. (බුහාරි)
  - කථනයෙහි යෙදෙන විට අවධානය යොමු කළ යුතු කොන්දේසි :
    - අවශ්‍යතාව උදෙසා කථා කිරීම.
    - අවස්ථාව, පරිසරයට අනුකූලව කථා කිරීම.
    - ගැළපෙන වචන භාවිත කොට කථා කිරීම.
    - පුද්ගලයා හැඳින කථා කිරීම. (ගුරුවරු, දෙමාපියන්, වැඩිහිටියන් යන අය සමඟ)
  - කථනයේ දී වළක්වා ගත යුතු දේ ඇත.

    උදා : කේළම්, මුසාව, පරුෂ වචන, නම්පට බැඳීම, ඕපාදූප කථා කිරීම.
  - උස් හඬින් කථා කිරීම ජනයා පිළිකුල් කරන්නේය.

    ''ඔබගේ හඬ පහත් කර ගන්න. හඬවල් අතුරින් අප්‍රිය හඬ බූරුවාගේ හඬය'' (31:19)
  - මම අස්ථි නොමැති අවයවයකි. එම නිසා ඒ මඟින් අපරාධ සිදුවීමට අවස්ථාව ඇත. දිව රැකගැනීම පිළිබඳව බොහෝ හදීස් දැනුම් දී ඇත.
  - දිවෙහි මූලිකත්වයෙන් කුසල් ලබා ගත හැකි මාර්ග බොහෝමයක් දක්නට ලැබේ.

    උදා : ආශිර්වාද කිරීම, ඔවදන් දීම, ස්තුති කිරීම, ශුභ පැතීම.

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව :**

**කණ්ඩායම 1** : දිව රැක ගැනීම පිළිබඳ ව පැවසෙන හදීස් තුනක් සොයා ලියන්න.

**කණ්ඩායම 2** : කථනයේ දී පිළිපැදිය යුතු කරුණු පහක් සොයා ලියන්න.

**කණ්ඩායම 3** : කථනයේ දී වළක්වා ගත යුතු කරුණු 05ක් සොයා ලියන්න.

**කණ්ඩායම 4** : යහපත් වචන අන්තර්ගත වන පරිදි කුඩා දෙබසක් කර පෙන්වන්න.

**ගෙදර පරිසරය**

සංවරව කතා කිරීමට හා අන් අයගේ අදහස්වලට ඇහුම්කන් දීමට පුහුණු කරන්න.

| | | |
|---|---|---|
| **නිපුණතාව 3:0** | : | ඉස්ලාමය පවසන යහ ගුණාංග දින ජීවායෙහි වැදගත්කම වටහාගෙන, පුද්ගලික ජීවිතයේත් සමූහ ජීවිතයේත් ගෙන හැර දක්වා ආදර්ශමත් ලෙස ජීවත්වී අන්‍යයන්ට මඟ පෙන්වයි. |
| **නිපුණතා මට්ටම 3:4** | : | නිවසකට හා සභාවකට අවසර ගෙන ඇතුළු වෙයි. |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | : | 2 |
| **ඉගෙනුම් පල** | : | • නිවසකටත් සභාවකටත් ඇතුළුවීමට පෙර අවසර ලබා ගැනීමේ වැදගත්කම ගෙන හැර කියා පායි.<br>• නිවස තුළත් සභාව තුළත් පිළිපැදිය යුතු පිළිවෙත් ලැයිස්තුගත කරයි.<br>• නිවස තුළත් සභාව තුළත් ඉස්ලාමීය පිළිවෙත් පිළිපදිමින් ක්‍රියා කිරීමෙහි වැදගත්කම දින ක්‍රියා කරයි. |

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 1** :

- අල්කුර්ආනයේ 24:27,28 පාඨ ශිෂ්‍යයෙකු ලවා අලංකාරව පාරායනය කරන්නට සලස්වන්න. තවත් ශිෂ්‍යයෙකු ලවා එහි පරිවර්තනය කියවන්න සලස්වන්න.
- අනෙක් සිසුන්ට එයට සවන් දීමට සලස්වන්න.
- අවසර ගැනීම සම්බන්ධව සිසුන් දන්නා දේවල් අසා දැනගන්න.
- පහත කරුණු ඇතුළත්වන සේ අදහස් හුවමාරු කර ගන්න.
    - නිවසකට, සභාවකට ඇතුළු වන විට පිළිපැදිය යුතු පිළිවෙත් ඉස්ලාම් පැහැදිලි කර ඇත. නිවසකට, සභාවකට ඇතුළුවන විට අවසර ලබා ගන්නා ලෙස ෂරීයා අණ කරයි. සභාවක පිළිපැද ක්‍රියා කළ යුතු (ආදාබ්) පිළිවෙත් ඉස්ලාම් පැහැදිලි කර ඇත.

**පියවර 2** :

- සිසුන්ව කණ්ඩායම් හතරකට බෙදන්න. කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව සෑම කණ්ඩායමකට ම ලබා දෙන්න.
- සාකච්ඡා කර අදහස් මතු කිරීමට යොමු කරන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම නිරීක්ෂණය කොට මෙහෙයවන්න.

**පියවර 3** :

- තම වාර්තා ඉදිරිපත් කිරීමට සෑම කණ්ඩායමකට ම අවස්ථාව ලබා දෙන්න.
- ඉදිරිපත් කරන ලද අදහස් විස්තර කිරීමට පළමු ව එම කණ්ඩායමට ම අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු අන්තර්ගත කොට සමාලෝචනය කරන්න.
    - කවරෙකුගේ නිවසක් වුව ද අවසර ලැබුණු පසු ඇතුළුවිය යුතුය. තම දෙමාපියන්, සහෝදර සහෝදරියන්ගේ කාමරවලට ඇතුළුවන විට ද තෙවරක් හෝ ඔවුන්ගෙන් අවසර ලබා ගත යුතුය.
    - අනුමැතිය ප්‍රතික්ෂේප කළහොත්, කිසියම් කරුණු නිසා තෙවරක් අවසර අයැද පිළිතුරු නොලැබුණහොත් නැවත හැරී යන්න.
    - නිවසක හා සභාවක අවසර ලබා 'සලාම්' පවසා ඇතුළුවිය යුතුය. සභාවක හිඳ ගැනීමට අවශ්‍යය වුවහොත්, ඊට පෙර හිඳ ගෙන සිටින අයට කරදර නොවන පරිදි ක්‍රියා කළ යුතුය.

- කවරෙකු හෝ නැගිට සිටින විට එම ස්ථානයෙහි හිඳ ගැනීම නොකළ යුතුය.
- වැඩිහිටියන්, විද්වතුන්, ගෞරවනීය පුද්ගලයින් වැනි අය පැමිණියේ නම් කරුණාවෙන් ඉඩ ලබා දී හිඳ ගැනීමට සලස්වන්න.
- සභාව තුළ කතා කිරීමට සිතුවේ නම් සභාවෙන් අවසර ලබා කතා කළ යුතුය.
- සභාව තුළ කතා වුන රහසක් හෙළි කිරීමත් දෙදෙනකු පමණක් රහසේ කතා කිරීමත් වළක්වාගත යුතුය. සභාවකට සහභාගි වන විට දිය නා, සුවඳ විලවුන් ගල්වා පිරිසිදු ඇඳුමින් සැරසී යෑම ප්‍රියජනක ය. සභාව තුළ තමන් හඳුනන අයට පමණක් සලාම් පැවසීමත් අතට අතදීමත් නොකළ යුතු ය.

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව :**

**කණ්ඩායම 1** : පහත සඳහන් අල්-කුර්ආන් වැකි තර්ජුමතුල් කුර්ආනයෙන් සොයා ලියාගන්න. පසුව එම වැකි පෙන්වා දෙන වැදගත් උපදෙස් ලැයිස්තුගත කරන්න. (6 : 54) (24 : 61) (24 : 59)

**කණ්ඩායම 2** : රියාලුස් සාලිහීන් නම් හදීස් ග්‍රන්ථයේ අංක 870, 872, 879 දරන හදීසයන්හි පරිවර්තනය සොයා ලියන්න.

**කණ්ඩායම 3** : නිවසකට ආගන්තුකයෙක් ලෙස ගිය අවස්ථාවේ සිට නැවත ආපසු එනතුරු පිළිපැදිය යුතු පිළිවෙත් ඔබගේ අත්දැකීම මත සාකච්ඡා කර ලියන්න.

**කණ්ඩායම 4** : සභාවකට ගිය විට එහි සිටින්නන්ගේ සැලකීම ලැබීමට අයෙක් හැසිරිය යුතු ආකාරය සාකච්ඡා කර ලියන්න.

**ගෙදර පරිසරයෙන් :**

නිවසකට හෝ සභාවකට ඇතුළුවීමේදී වැරදි ලෙස කටයුතු කළ අයෙකුගේ ක්‍රියා කලාපය හා එවිට අනුගමනය කළ යුතුව තිබුණ නිවැරදි ක්‍රියා කලාපය ලියන්නට යොමු කරන්න.

**නිපුණතාව 3:0** : ඉස්ලාමය පවසන යහ ගුණාංග දැන ඒවායෙහි වැදගත්කම වටහාගෙන, පුද්ගලික ජීවිතයේත් සමූහ ජීවිතයේත් ගෙන හැර දක්වා ආදර්ශමත් ලෙස ජීවත්වී අන්‍යයන්ට මඟ පෙන්වයි.

**නිපුණතා මට්ටම 3:5** : අන්‍යයන්ගේ අවශ්‍යතාවයට ප්‍රමුඛතාවය දෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 1

**ඉගෙනුම් පල** :

- අන්‍යයන්ට උපකාර කළ හැකි ක්‍රම දැන පවසයි.
- අන්‍යයන්ගේ අවශ්‍යතාවයට මූලිකත්වය ලබා දීමේ අවශ්‍යතාවය පිළිගෙන ක්‍රියා කරයි.
- අන්‍යයන්ට උපකාර කිරීම උසස් ධර්මයක් බව විස්තර කරයි.
- අන්‍යයන්ට උපකාර කිරීම මඟින් ලැබෙන ප්‍රයෝජන දැන උපකාර කරයි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 1** :

- ''යර්මුක්'' නැමැති ස්ථානයෙහි සටනක් ඇති විය. එහි දී මුස්ලිම්වරු රෝම අධිරාජ්‍යයේ සේනාවට විරුද්ධව සටන් කළහ. දෙපාර්ශවයට ම දැඩි තුවාල සිදු විය. සමහරු මිය ගියහ.

  අබූ ජහ්ම් ඉබ්නු හුදෛබා, ජලය ස්වල්පයක් ගෙන සටන් බිමේ තුවාල වී සිටින අය අතරට ගියේය. ඔහු තම සුළු පියාගේ පුතා වන ඉක්රිමා සෙව්වේය. ඔහු දැඩි සේ තුවාල වී වේදනාවෙන් පසු විය. ජලය දුටු විගස සතුටට පත් වී ඉක්මනින් එය ගෙන එන මෙන් සංඥා කළේය. අබූජහ්ම් ඉක්මනින් ජලය ගෙන ගොස් ඔහුට ජලය පෙවීමට සැරසුණේය. එවිට අසල අයෙක් ''ජලය, ජලය'' යැයි මුමුණනු හඬක් ඇසුණි. එවිට ඉක්රිමා තමාට නොව අනෙක් සහෝදරයාට ජලය පොවන මෙන් ඉල්ලීය. අබූජහ්ම් එසේ කිරීමට සැරසුණේ ය. එවිට ඒ අසල අයෙක් ජලය ඉල්ලන හඬ ඇසුණි. එවිට, හිෂාම් ඉබ්නු අබුල් ආස් තමන්ට නොව එම පුද්ගලයාට ජලය දෙන්න යැයි සංඥා කළේය. අබූ ජහ්ම් එසේ කළේය. එම තෙවන පුද්ගලයාට සමීප වන විට ම ඔහු ෂහීද් වුණේය. දෙවන්නා වූ හිෂාම් දෙසට ඉක්මනින් පැමිණියේය. ඒ අතරතුර ඔහු ද ෂහීද් වුණේය. පසුව තම ඥාති ඉක්රිමා දෙසට ගියේය. ඒ අතර ඔහුද ෂහීද් වුණේ ය.

  මෙම ඓතිහාසික සිදුවීම කතාවක් ලෙස පවසා සිසුන්ට සවන් දීමට සලස්වන්න.

- පන්තිය තුළ යහළුවන්ගේ අවශ්‍යතාවන්ට මූලිකත්වය ලබා දුන් අවස්ථාවන් ගැන විමසන්න.
- පහත කරුණු පාදක කර ගනිමින් සාකච්ඡා කරන්න.
  - අන්‍යයන්ගේ යහපත වෙත අවධානය යොමු කිරීම අත්‍යාවශ්‍යය. අන්‍යයන්ගේ යහපත මූලික කර ගැනීම ''අල්ඊසාර්'' නම් වේ.
  - තම අවශ්‍යතාවයට වඩා අන්‍යයන්ගේ අවශ්‍යතාවයට මූලිකත්වය ලබා දීම උසස් දානයකි. සහාබාවරු අන්‍යයන්ගේ අවශ්‍යතාවය මූලික කර ගෙන ක්‍රියාකිරීම අපට ආදර්ශයකි.

පියවර 2 :
- සිසුන්ව කණ්ඩායම් තුනකට බෙදන්න. සෑම කණ්ඩායමකටම කණ්ඩායම් ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න.
- සෑම කණ්ඩායමක් ම, කණ්ඩායම් ක්‍රියාකාරීත්වයෙහි නිරත කරන්න.

පියවර 3 :
- සෑම කණ්ඩායමකටම තමන් සාකච්ඡා කළ දේවල් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අමතර තොරතුරු ඉදිරිපත් කර විස්තර කිරීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායම් තුළින් වැදගත් අදහස් විමසා ලබා ගන්න.
- පහත කරුණු අන්තර්ගතවන සේ සමාලෝචනය කරන්න.
    - දන් දීම, පරාර්ථකාමීත්වය යනාදිය ඉස්ලාමය දේශනා කරන යහපත් ගුණාංගවේ. මුස්ලිම්වරයෙකු තම යහපත පමණක් නොව අන්‍යයන්ගේ යහපතත් සැලකිය යුතුය.
    - ''ඔබලා අතරින් කෙනකු තමන්ට ප්‍රියමනාප දේවල් තම සහෝදරයාටත් ප්‍රිය නොකරන්නෙක් ඊමාන්ධාරියෙකු නොවන්නේ ය.'' (බුහාරි)
    - යහපත් දේවලට ඇලුම් කිරීමත් යහපත් දේවලට සහායවීමත් මුස්ලිම්වරයකුගේ ගුණාංගයකි.
    - ''යහපත් දෙයම ඉටු කරන්න. එය මඟින් ඔබ ජය අත්පත් කර ගන්නේය.'' (22 : 77)
    - මුඃමින්වරයෙකුගේ අපහසුතාවය, දුක දුරුකර හෝ ඔහුගේ කුසගින්න දුරු කර හෝ ඔබ ඔහුට ලබා දෙන සතුට අල්ලාහ්ට ඉතාමත් ප්‍රියමනාප කාර්යයකි. (ඉබ්නු අබ්ත්දුන්යා)

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව**

**කණ්ඩායම 1** : අනුන්ගේ අවශ්‍යතාවයට ප්‍රමුඛත්වය දිය යුතුය යන ගුණය දේශනා කරන ඉස්ලාමයේ අනන්‍ය ස්වභාවය පහදන්න.

**කණ්ඩායම 2** : අනුන්ගේ අවශ්‍යතාවට ප්‍රමුඛතාවය දෙමින් ජීවත්වූ නබි (සල්) තුමාගේ නිවසේ සිදුවූ සිද්ධියක් කතාවක් ලෙස ලියන්න.

**කණ්ඩායම 3** : පන්ති කාමර පරිසරයේ දී අනුන්ගේ අවශ්‍යතාවයට ප්‍රමුඛතාවය දී කටයුතු කළ යුතු අවස්ථා ලැයිස්තු ගත කරන්න.

**ගෙදර පරිසරයෙන් :**

අනුන්ගේ අවශ්‍යතාවයට ප්‍රමුඛතාවය දීමේ ගුණාංගය පවුලේ සාමාජිකයන් වැඩිදියුණු කරන්නේ කෙසේ දැයි සැලසුම් කිරීමට යොමු කරන්න.

**නිපුණතාව 4.0** : ඉස්ලාමීය මූලාශ්‍ර පැහැදිලිව වටහාගෙන ඒ අනුව තම ජීවිතය ගොඩනගා ගනියි.

**නිපුණතා මට්ටම 4.1** : අල්-කුර්ආනය පිළිවෙළට පරිහරණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 2

**ඉගෙනුම් පල** :

- අල්-කුර්ආනය උතුම් වූ දේව ග්‍රන්ථයක් යන්න පැහැදිලි කරයි.
- අල්-කුර්ආනය පරිහරණය කරන විට පිරිසිදුකම රැකගනියි.
- අල්-කුර්ආනය පාරායනය කරන ක්‍රමය දැන පාරායනය කරයි.
- අල්-කුර්ආනය පාරායනය කිරීමෙහි වැදගත්කම දැන කටපාඩම් කර පාරායනය කරයි.
- අල්-කුර්ආනයෙහි උතුම් බව රැකගනිමින් පරිහරණය කිරීම ඉබාදත් යන්න දැන ක්‍රියා කරයි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 1** :

- ඇමුණුම 1 හි සඳහන් හදීසය සිසුවකු මඟින් කියවා එයට අනෙක් සිසුන්ව සවන්දීමට සලස්වන්න.
- අල්-කුර්ආනයේ වැදගත්කම පිළිබඳව සිසුන්ගෙන් අසා දැන ගන්න.
- පහත කරුණු ඇතුළත්වන සේ සාකච්ඡා කරන්න.
  - අල්ලාහ්ගේ කථනය වන අල්-කුර්ආනය උතුම්ය.
  - පිරිසිදුවී එය පරිහරණය කළ යුතුය.
  - අල්-කුර්ආනය පාරායනය කරන විටත් සවන්දෙන විටත් එයට අදාළ පිළිවෙළ ආරක්ෂා කර ගත යුතුය.
  - අල්-කුර්ආනය පිළිවෙළට පරිහරණය කිරීම ඉබාදතයකි.

**පියවර 2** :

- සිසුන්ව කණ්ඩායම් හතරකට බෙදන්න. සෑම කණ්ඩායමකටම කණ්ඩායම් ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම කෙරෙහි අවධානය යොමු කර එය මෙහෙයවන්න.

**පියවර 3** :

- තමන් සාකච්ඡා කර ලබා ගත් අදහස් පන්තිය තුළ ඉදිරිපත් කිරීමට සෑම කණ්ඩායමකටම අවස්ථාව ලබා දෙන්න.
- අඩුපාඩු සම්පූර්ණ කර විස්තර කිරීම එම කණ්ඩායමට ප්‍රථමයෙන් අවස්ථාව ලබා දෙන්න.
- අන් කණ්ඩායම්වල වැදගත් අදහස් විමසා ලබා ගන්න.
- පහත කරුණු අන්තර්ගත කර සමාලෝචනය කරන්න.
  - අල්-කුර්ආනය අවලස්සන කිරීමත්, අගෞරව කිරීමත් මහා පාප කර්මයකි.
  - අල්-කුර්ආනය උසුරන විටත්, තබන විටත්, පරිහරණය කරන විටත්, එහි උතුම් බව රැකිය යුතුය.
  - පාරායන කර පෙන්වන ලද වහී වන අල්-කුර්ආනය උතුම්ය යන්න කුර්ආනය හා සුන්නාහ්ව පෙන්වා දෙයි.
  - අල්-කුර්ආනය වුළූ සමඟින් පරිහරණය කිරීම සුන්නත්ය.
  - ශරීරය, වස්ත්‍රය, ස්ථානය යනාදියෙහි පිරිසිදුකම රැක ගනිමින්, අල්කුර්ආනය පරිහරණය කළ යුතුය.

- තජ්වීද් ක්‍රමය පිළිපදිමින් අල්-කුර්ආනය පාරායනය කිරීම වැදගත්ය.
- අල්-කුර්ආනය පරායනය කරන විට එහි පාරිශුද්ධත්වය, උතුම්භාවය, දේවත්වය යනාදිය සැලකිල්ලට ගෙන ක්‍රියා කළ යුතුය.
- අල්-කුර්ආනය සැමදාම පාරායන කිරීම, එයට සවන් දීම, කටපාඩම් කිරීම යනාදිය ඉබාදත් වේ.

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

ඇමුණුම 1

''අල්-කුර්ආනය පාරායනය කිරීමෙහි දක්ෂයන්, යහපත් ගෞරවනීය පුද්ගලයන් සමග සිටියි. අල්-කුර්ආනය පාරායනය තමන්ට අපහසුවුව ද යමෙකු ගොත ගසමින් පාරායනා කරන්නේ ද ඔහුට කුසල් දෙකක් ඇත'' (මුස්ලිම්)

**කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව :**

**කණ්ඩායම 1** : අල්-කුර්ආනය පාරායනය කරන්නා රැකගත යුතු ශරීර පිරිසිදුතාවය පිළිබඳව සාකච්ඡා කර ලියන්න.

**කණ්ඩායම 2** : අල්-කුර්ආනය පාරායනය කිරීමෙහි වැදගත්කම ගෙනහැර දක්වන අල්-කුර්ආන් වැකි දෙකක් තෝරාගෙන ලියන්න.

**කණ්ඩායම 3** : අල්-කුර්ආනය කටපාඩම් කිරීමේ වැදගත්කම ගෙන හැර දක්වන හදීස් 2ක් සොයා ලියන්න.

**ගෙදර පරිසරයෙන් :**

නිවසෙහි දෙමාපියන් අල්-කුර්ආනය පරිහරණය කරන ක්‍රමය අවධානය යොමු කර ඔබ උගත් පාඩමට අදාළව දෙමාපියන්ට ගෙනහැර දක්වන ලද කරුණු ලියා පැමිණෙන්න.

**නිපුණතාව 4.0** : ඉස්ලාමීය මූලාශ්‍ර පැහැදිලිව වටහාගෙන ඒ අනුව තම ජීවිතය ගොඩනගා ගනියි.

**නිපුණතා මට්ටම 4.2** : අල්-කුර්ආනයේ සූරාවන් නිවැරැදිව පාරායනය කර පෙන්වයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 2

**ඉගෙනුම් පල** :
- සූරතුල් ඉහ්ලාස්හි පද විවරණය පවසයි.
- සූරතුල් ඉහ්ලාස්හි වැදගත්කම දැන පවසයි.
- ඒකත්වය පිළිබඳ ප්‍රතිපත්තිවලට අදාළ දැනමුතුකම් මෙමඟින් දැන පවසයි.
- සූරතුල් ඉහ්ලාස්හි දැනමුතුකම් අන් අයට ගෙන හැර පවසයි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 1** :
- සූරතුල් ඉහ්ලාස් ශිෂ්‍යයෙකු ලවා අලංකාරව පාරායනය කරන්නට සලස්වා අනෙක් සිසුන්ට එයට සවන්දීමට සලස්වන්න.
- මෙම සූරාවෙන් අවධාරණය කරන්නේ කුමක්දැයි කියා විමසා අදහස් හුවමාරු කරගන්න.
- පහත කරුණු ඇතුළත් වන සේ සාකච්ඡා කරන්න.
  - සූරතුල් ඉහ්ලාස් අල්-කුර්ආනයේ ඉතාමත් කුඩා සූරාවන්ගෙන් එකකි.
  - මෙය මුහම්මද් (සල්) තුමාගේ මක්කා ජීවිතයේදී පහළ කරන ලදී.
  - මෙම සූරාවෙහි තනි වැදගත්කමක් ඇත.
  - එය පාරායනය කිරීම, කටපාඩම් කිරීම, එහි අර්ථය දැන ගැනීම යනාදිය යහපත් ක්‍රියාවන්ය.

**පියවර 2** :
- සිසුන්ව කණ්ඩායම් හතරකට බෙදන්න.
- සෑම කණ්ඩායමකට ම කණ්ඩායම් ගවේෂණ පත්‍රිකා ලබා දෙන්න.
- සෑම කණ්ඩායමක්ම කණ්ඩායම් ක්‍රියාකාරකම්හි මෙහෙයවන්න.
- කණ්ඩායම් වාර්තාව පන්තිය තුළ ඉදිරිපත් කිරීමට සූදානම් වන ලෙස දැනුම් දෙන්න.

**පියවර 3** :
- සෑම කණ්ඩායමකට ම තමන් සාකච්ඡා කළ සියල්ල ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අමතර තොරතුරු ඉදිරිපත් කර විස්තර කිරීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායම්වල වැදගත් අදහස් විමසා ලබා ගන්න.
- පහත කරුණු අන්තර්ගත වනසේ සමාලෝචනය කරන්න.
  - මක්කාවේ දී පහළ කරන ලද සූරතුල් ඉහ්ලාස්හි ඒකත්වය පිළිබඳව අවධාරණය කරන්නේය.
  - මෙම සූරාවේ වැදගත්කම අල්-කුර්ආනයේ තුනෙන් එක් කොටසකට සමානය යන්න හදීස් ගෙන හැර දක්වන්නේය.
  - සූරා ඉහ්ලාස් ඉදිරිපත් කරන වැදගත් අදහස් :
    - අල්ලාහ් ඒකයෙකි.
    - අල්ලාහ් අවශ්‍යතාවයෙන් තොර ය.
    - අල්ලාහ් පරපුරක් නොමැත්තාය.
    - අල්ලාහ් අසමසමය.

- අල්-කුර්ආනයේ වැදගත්ම දේශනාව වන ඒක දේවවාදයෙහි සාරාංශය පිළිබඳව මෙම සූරාව පවසයි.
- මෙම සූරාව තජ්වීද් ක්‍රමයට කටපාඩම් කර එය පාරායනය කළ යුතු අවස්ථාවන්හි දී පාරායනය කළ යුතුය.
- මෙම සූරාව උදේ,- සවස පාරායනය කිරීම නබි මුහම්මද් (සල්) තුමාගේ මඟ පෙන්වීමකි.

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව :**

**කණ්ඩායම 1** : සූරතුල් ඉඛ්ලාස්හි වැදගත්කම පිළිබඳ පැවසෙන හදීසයක් හදීස් ග්‍රන්ථවලින් තෝරා මූලාශ්‍රය සමඟින් ලියා ප්‍රදර්ශනය කරන්න.

**කණ්ඩායම 2** : සූරතුල් ඉඛ්ලාස්හි අල්ලාහ් පිළිබඳ පැවසෙන කරුණු සඳහන් වාක්‍යය පහක් ලියන්න.

**කණ්ඩායම 3** : සූරතුල් ඉඛ්ලාස්හි අරාබි භාෂාවෙන් හා එහි අර්ථය දෙමළ භාෂාවෙන් ලියා ප්‍රදර්ශනය කරයි.

**කණ්ඩායම 4** : සූරතුල් ඉඛ්ලාස්හි කෙසේ ඒකත්වය පිළිබඳ දේශනා ඉදිරිපත් කරන්නේ ද යන වැකි පහතින් ලියා පෙන්වන්න.

**ගෙදර පරිසරයෙන්** :

දෙමව්පියන් සමඟ එකතුවී ඉඛ්ලාස්හි අර්ථය කටපාඩම් කර එය, පන්තියේ ඉදිරිපත් කිරීමට ඉඩ සලස්වන්න.

**නිපුණතාව 4:0** : ඉස්ලාමීය මූලාශ්‍ර පැහැදිලිව වටහාගෙන ඒ අනුව තම ජීවිතය ගොඩනගා ගනියි.

**නිපුණතා මට්ටම 4.3** : අල්-කුර්ආනයේ සූරාවන් නිවැරැදිව පාරායනය කර පෙන්වයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 2

**ඉගෙනුම් ඵල** :

- සූරතුල් ෆලක්, නාස් සූරාවන්ගේ වැදගත්කම අවබෝධ කර ගනී .
- ඒවායේ අර්ථය පවසයි.
- අල්ලාහ්ගේ ආරක්ෂාව පතා මෙම සූරාවන් පාරායනා කරයි.
- මෙම සූරාවන්හි අඩංගු කරුණු තමන්ද අවබෝධ කර අන් අයටද පහදයි.

පාඩම සැලසුම් සඳහා උපදෙස්

**පියවර 1** :

- සූරතුල් ෆලක්, සූරතුන් නාස් ඉතා අලංකාරව පාරායනය කළ හැකි ශිෂ්‍යයෙකු ලවා හෝ හඬ පටයක් ආධාරයෙන් ඇසෙන්නට සලස්වන්න.
- මෙම සූරාවන් මඟින් ප්‍රකාශවන දෑ සම්බන්ධයෙන් සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- පහත සඳහන් කරුණු ඇතුළත්වන සේ සාකච්ඡා කරන්න.
    - සූරතුල් ෆලක්, සූරතුන් නාස් ආදි සූරාවන් අල්-කුර්ආනයයෙහි අවසාන භාගයෙහි සටහන්ව ඇත.
    - මෙම සූරාවන් මුඅව්විදතෙන් යනුවෙන් අමතනු ලබයි.
    - මෙම සූරාවෙහි තනි වැදගත්කමක් ඇත.
    - මෙම සූරාවන් පාරායනය කිරීම, කටපාඩම් කිරීම, අර්ථය වටහා ගැනීම වැදගත් කාර්යයකි.

**පියවර 2**

- සිසුන්ව කණ්ඩායම් හතරකට බෙදන්න.
- සෑම කණ්ඩායමකට ම කණ්ඩායම් ගවේෂණ පත්‍රිකා ලබා දෙන්න.
- සෑම කණ්ඩායමක්ම කණ්ඩායම් ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- කණ්ඩායම් වාර්තාව පන්තිය තුළ ඉදිරිපත් කිරීමට සූදානම්වන ලෙස දැනුම් දෙන්න.

**පියවර 3** :

- සෑම කණ්ඩායමකටම තමන් සාකච්ඡා කළ සියල්ල ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අමතර තොරතුරු ඉදිරිපත් කර විස්තර කිරීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායම්වල වැදගත් අදහස් විමසා ලබා ගන්න.
- පහත කරුණු අන්තර්ගත වනසේ සාකච්ඡා කරන්න.
    - අල්කුර්ආනයෙහි අවසන් සූරාවන් වන ෆලක් හා නාස් පහළවීමට බලපෑ හේතුන් ඇත.
    - මේවා විපත්වලින් ආරක්ෂා කරන සූරාවන් වන හෙයින් මෙම සූරා මුඅව්විදතෙන් යනුවෙන් අමතනු ලබයි.
    - සෑම අවස්ථාවකදී ම ආරක්ෂාව පැතීමට සුදුස්සා අල්ලාහ් පමණක් බව මේ සූරා දෙකම සඳහන් කරයි.

- අල්ලාහ් මිනිසුන්ගේ 'පරිපාලකයා' මිනිසුන්ගේ 'රජු,' මිනිසුන්ගේ 'දෙවියා'ය යන මූලික කරුණු ඉදිරිපත් කරයි.
- මෙම සූරාව තජ්වීද් ක්‍රමයට පාරායනය කිරීම හා කටපාඩම් කිරීම ඉතා සුදුසු ක්‍රියාවන් වේ.
- මෙම සූරාව උදේ, සවස පාරායනය කිරීම නබි මුහම්මද් (සල්) තුමාගේ මඟපෙන්වීමකි.

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව :**

**කණ්ඩායම 1** : සූරතුල් ෆලක් පාරායනය කරන අවස්ථා වගුගත කරන්න.

**කණ්ඩායම 2** : සූරතුල් ෆලක් හි අර්ථය සාකච්ඡා කර ලියා පෙන්වන්න.

**කණ්ඩායම 3** : සූරතුන් නාස් පාරායනය කරන අවස්ථා වගුගත කරන්න.

**කණ්ඩායම 4** : සූරතුන් නාස් හි අර්ථය සාකච්ඡා කර ලියා පෙන්වන්න.

**ගෙදර පරිසරයෙන්**

සූරතුල් ෆලක්, සූරතුන් නාස් ආදී සූරාවන් දිනපතා උදේ හා සවස තුන්වතාවක් පාරායනය කිරීමට යොමු කරන්න.

**නිපුණතාව 4.0** : ඉස්ලාමීය මූලාශ්‍ර පැහැදිලිව වටහාගෙන ඒ අනුව තම ජීවිතය ගොඩනගා ගනියි.

**නිපුණතා මට්ටම 4.4** : අල් කුර්ආන් කටපාඩම් **කර ඉදිරිපත් කරයි.**

**කාලච්ඡේද සංඛ්‍යාව** : 2

**ඉගෙනුම් ඵල** :
- සූරතුල් ෆීල් හි අර්ථය පවසයි.
- සූරතුල් ෆීල් පහළවූ හේතු පහදයි.
- සූරතුල් ෆීල් ලබා දෙන ඉගැන්වීම් පහදයි.
- සූරතුල් ෆීල් මඟින් හෙළිවන ඓතිහාසික තොරතුරු රැස් කර අන්අයට පවසයි.
- තම ඊමානය ශක්තිමත් කර ගැනීම සඳහා මෙම සූරාවේ අර්ථය දැන පාඩම් කරයි.

පාඩම සැලසුම් සඳහා උපදෙස්

**පියවර 1** :
- සූරතුල් ෆීල් අලංකාරව පාරායනය කළ හැකි ශිෂ්‍යයෙකු ලවා හෝ හඬ පටයක් ආධාරයෙන් ඇසෙන්නට සලස්වන්න.
- මෙම සූරාවෙහි අදහස හා එහි ඓතිහාසික පසුබිමද පහත කරුණු ද පාදක කර ගනිමින් සාකච්ඡා කරන්න.
- පහත කරුණු ඇතුළත් වන සේ සාකච්ඡා කරන්න.
  - මෙය මක්කාවෙහි පහළවූ කුඩා සූරාවකි.
  - මෙම සූරාව පහළවීමට ඓතිහාසික පසුබිමක් ඇත.
  - ඕනෑම කුමන්ත්‍රණයක් අල්ලාහ් විසින් විනාශ කරන බව මෙම සූරාව මඟින් හෙළිවේ.
  - මෙය පාරායනය කිරීම, කටපාඩම් කිරීම, අර්ථය වටහා ගැනීම ඉතා වැදගත් කරුණකි.

**පියවර 2** :
- සිසුන්ව කණ්ඩායම් හතරකට බෙදන්න.
- සෑම කණ්ඩායමකට ම කණ්ඩායම් ගවේෂණ පත්‍රිකා ලබා දෙන්න.
- සෑම කණ්ඩායමක්ම කණ්ඩායම් ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- කණ්ඩායම් වාර්තාව පන්තිය තුළ ඉදිරිපත් කිරීමට සූදානම් වන ලෙස දැනුම් දෙන්න.

**පියවර 3** :
- සෑම කණ්ඩායමකට ම තමන් සාකච්ඡා කළ සියල්ල ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අමතර තොරතුරු ඉදිරිපත් කර විස්තර කිරීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායම්වල වැදගත් අදහස් විමසා ලබා ගන්න.
- පහත කරුණු අන්තර්ගතවන සේ සාකච්ඡා කරන්න.

- මක්කාවෙහි පහළවූ මෙම සූරාව මගින් අල්ලාහ්ගේ ශක්තිය විදහා පෙන්වයි.
- අල්ලාහ්ගේ කෑබාව ඔහු විසින්ම ආරක්ෂා කරන බව මෙම සූරාවෙන් තහවුරු වේ.
- අල්ලාහ් පිළිබඳ විශ්වාසය මෙම සූරාව තවදුරටත් තහවුරු කරයි.
- ඕනෑම කුමන්ත්‍රණයක් අල්ලාහු තආලා ඉදිරියේ දූවිල්ලක් වැනිය.

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව :**

**කණ්ඩායම 1** : සූරතුල් ෆීල් හි සඳහන් අබාබීල් කුරුල්ලන් ගල් ගැසූ ආකාරය ඇඳ දක්වන්න.

**කණ්ඩායම 2** : මෙම ඓතිහාසික කතාව කෙටියෙන් පැහැදිලි කරන්න.

**කණ්ඩායම 3** : මෙම ඓතිහාසික කතාවට අදාළ ඇත් සේනාව චිත්‍රයට නගන්න.

**කණ්ඩායම 4** : මෙම සූරාව පාරායනය කරන විට ඔබේ සිතේ ඇතිවන හැඟීම් සාකච්ඡා කර සටහනක් නිර්මාණය කරන්න.

**ගෙදර පරිසරයෙන්**

'අබාබීල්' යන ළමා කතා ඇතුළත් සීඩී තැටිය දෙමව්පියන් සමඟ නැරඹීමට හා එමගින් ලැබූ දැනුම සටහන් කිරීමට යොමු කරවන්න.

-

**නිපුණතාව 4.0** : ඉස්ලාමීය මූලාශ්‍ර පැහැදිලිව වටහාගෙන ඒ අනුව තම ජීවිතය ගොඩනගා ගනියි.

**නිපුණතා මට්ටම 4.3** : හදීසයන් කටපාඩම් කර ඉදිරිපත් කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 2

**ඉගෙනුම් ඵල** :

- හදීස් නීති මූලාශ්‍රයක් යන්න පහදයි.
- හදීස් වර්ග වගුගත කරයි.
- අල් කුර්ආනය පැහැදිලි ව තේරුම් කර ගැනීම සඳහා හදීස් අවශ්‍ය බව පහදයි.
- අල් කුර්ආනය හා අල් හදීස් අතර තිබෙන වෙනස පැහැදිලි කරයි.

පාඩම සැලසුම් සඳහා උපදෙස්

**පියවර 1**

- පහත හදීසය එක් ශිෂ්‍යයෙකු ලවා ශබ්ද නඟා කියවන්න.
- ''මම ඔබලාට කරුණු දෙකක් තබා යමි. එය ඔබලා අනුගමනය කරන්නේ නම් මඟ නොවරදිනු ඇත. ඒවා නම් අල්ලාහ්ගේ ධර්මය ( අල් කුර්ආන්) හා මාගේ ජීවන මඟ (හදීස්) යි.'' (මුවත්තා)
- මෙම හදීසය සම්බන්ධයෙන් ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- එහිදි පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.
    - හදීසය ඉස්ලාමයේ ප්‍රධාන මූලාශ්‍රවලින් එකක් වේ.
    - එය සුන්නා යනුවෙන් ද හැඳින්වේ.
    - මෙය නබි (සල්) තුමාගේ සම්පූර්ණ ජීවන ක්‍රමය වේ.
    - කුර්ආනයට පැහැදිලි කිරීමක් ලෙස හදීස් පවති.
    - හදීස් ඉමාම්වරුන්ගෙන් අපට හිමිවිය.

**පියවර 2**

- සිසුන්ව කණ්ඩායම් හතරකට බෙදන්න.
- සෑම කණ්ඩායමකට ම කණ්ඩායම් ගවේෂණ පත්‍රිකා ලබා දෙන්න.
- සෑම කණ්ඩායමක්ම කණ්ඩායම් ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- කණ්ඩායම් වාර්තාව පන්තිය තුළ ඉදිරිපත් කිරීමට සූදානම්වන ලෙස දැනුම් දෙන්න.

**පියවර 3**

- සෑම කණ්ඩායමකටම තමන් සාකච්ඡා කළ සියල්ල ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අමතර තොරතුරු ඉදිරිපත් කර විස්තර කිරීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායම්වල වැදගත් අදහස් විමසා ලබා ගන්න.
- පහත කරුණු අන්තර්ගතවන සේ සාකච්ඡා කරන්න.
    - හදීස් යනු නබි (සල්) තුමාගේ වදන, ක්‍රියා, ගුණාංග, පිළිගැනීම, වර්ණනාවන් යන්නය.
    - මෙය ඉස්ලාමීය නීති මූලාශ්‍රයන්ගෙන් එකකි.
    - කුර්ආනයේ විවරණයන් හදීසයන් මගින් ප්‍රායෝගික කරනු ලැබේ.
    - කුර්ආනය අල්ලාහ්ගේ අදහස් හා භාෂා භාවිතය අනුව සැකසී ඇත.

- අල්ලාහ්ගේ අදහස් හා නබි (සල්) තුමාගේ භාෂා භාවිතය මත පදනම්වන හදීසයන් 'හදීස් කුද්සි' නම් වේ.
- හදීසයන් සහීහ්, හසන්, ලඊෆ් යනුවෙන් වර්ග තුනකි.
- හදීසයන් පිළිපැදීම, එය ආරක්ෂා කර ගැනීම හා එය ඉගෙනීම අපේ යුතුකම වේ.

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදාගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව :**

**කණ්ඩායම 1** : හදීස්හි වැදගත්කම ඉස්මතු කරන කුර්ආන් ආයත් දෙකක් තර්ජුමතුල් කුර්ආනයෙන් උපුටා දක්වන්න.

**කණ්ඩායම 2** : කණ්ඩායම කටපාඩම් කරගත් හදීස් 3 ක් අරාබියෙන් ලියා එහි අර්ථයන්ද ලියන්න.

**කණ්ඩායම 3** : කුර්ආනයට විවරණයක් ලෙස හදීසයන් පවතින බවට උදාහරණ දෙකක් ලියන්න.

**කණ්ඩායම 4** : හදීස්හි වැදගත්කම ප්‍රකාශ කරන හදීස් 3 ක් ලියන්න.

**ගෙදර පරිසරයෙන්**

**දෙමාපියන් හෝ වැඩිහිටියන්** සමග එක්ව කුඩා හදීසයන් 3 ක් අර්ථය සමඟ ලියා පැමිණන මෙන් දන්වන්න.

| | | |
|---|---|---|
| **නිපුණතාව 4:0** | : | ඉස්ලාමීය මූලාශ්‍ර පැහැදිලිව වටහාගෙන ඒ අනුව තම ජීවිතය ගොඩනගා ගනියි. |
| **නිපුණතා මට්ටම 4.4** | : | හදීසයන් කටපාඩම් කර ඉදිරිපත් කරයි. |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | : | 2 |
| **ඉගෙනුම් ඵල** | : | • හදීස් මඟින් පෙන්වා දී ඇති කළ යුතු හා වළක්වා ඇති දේවල් පිළිබඳව අවබෝධයක් ලබා ගෙන කටයුතු කරයි.<br>• අසත්‍ය කතා කිරීම මුනාෆික්ගේ ලක්ෂණයක් යැයි දැන ඉන් ඉවත් වෙයි.<br>• කවටනම් පටබැඳීම තහනම් ක්‍රියාවක් බව දැන ඉන් ඉවත්ව කටයුතු කරයි. |

පාඩම සැලසුම් සඳහා උපදෙස්

**පියවර 1**

- පහත සඳහන් හදීසය එක් ශිෂ්‍යයෙකු ලවා ශබ්ද නගා කියවන්න.
- ''බුද්ධිමතෙක් නැතිනම් ඉගෙනීම් කරන්නෙක් නැතිනම් සවන්දෙන්නෙකු ලෙස නැතිනම් අධ්‍යාපනයට ආදරය කරන්නෙකු ලෙස සිටිනු. ඊට බාධා කරන්නෙක් වුවහොත් ඔබ විනාශ වී යනු ඇත.'' (තබරානි)
- මෙම හදීසයන් සම්බන්ධයෙන් ශිෂ්‍යයන් සමඟ අදහස් හුවමාරු කර ගන්න.
- පහත කරුණු ඇතුළත් වනසේ සාකච්ඡා කරන්න.
  - අණවලට යටත්ව හා වළක්වා ඇති ක්‍රියාවන්වලින් ඉවත්වී සිටීම සෑම මුස්ලිම්වරයෙකුගේම යුතුකම් වේ.
  - බොරු කීම, කවටනම් පටබැඳීම වළක්වා ඇති දේවල් බව හදීසයෙන් පවසයි.

**පියවර 2**

- සිසුන්ව කණ්ඩායම් හතරකට බෙදන්න.
- සෑම කණ්ඩායමකට ම කණ්ඩායම් ගවේෂන පත්‍රිකා ලබා දෙන්න.
- සෑම කණ්ඩායමක්ම කණ්ඩායම් ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- කණ්ඩායම් වාර්තාව පන්තිය තුළ ඉදිරිපත් කිරීමට සූදානම් වන ලෙස දැනුම් දෙන්න.

**පියවර 3**

- සෑම කණ්ඩායමකට ම තමන් සාකච්ඡා කළ සියල්ල ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අමතර තොරතුරු ඉදිරිපත් කර විස්තර කිරීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායම්වල වැදගත් අදහස් විමසා ලබා ගන්න.
- පහත කරුණු අන්තර්ගත වනසේ සමාලෝචනය කරන්න.
  - අසත්‍ය පැවසීම, කවටනම් පැවසීම ආදිය වළක්වා ඇති ක්‍රියා බව අල්කුර්ආනය හා සුන්නාව පවසයි.
  - අධ්‍යාපනය සොයා ලබා ගන්නා ලෙස අල්කුර්ආනය හා සුන්නාව අණ කරයි.

- අධ්‍යාපනය සම්බන්ධයෙන් ඔබ අන්‍යයන් සමඟ යහපත් ලෙස කටයුතු කරනු. ඔබලා ධනය මඟින් කරන්නා වූ වංචාවන්ට වඩා අධ්‍යාපනය සම්බන්ධයෙන් වංචා කිරීම බරපතල පාපයකි. නිශ්චිත වශයෙන් ම අල්ලාහුතාලා විනිශ්චය දිනයේදී ඔබ විමසනු ඇත. (තබරානි)
- සැක කිරීම ඉවත දමන්න. වන්දනයන් සත්‍ය තෘප්තිය ලබා දෙයි. අසත්‍යය සැකයට මුල්බීජ සපයයි.
- අසත්‍යය අයහපත් ක්‍රියාවන්ට මාර්ග සපයන්නක් යැයි හදීසය පවසයි.
- කවටනම් පටබැඳීම මහත් පාපයක් ලෙස අල්කුර්ආනය පවසයි.

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදාගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව :**

**කණ්ඩායම 1** : හදීස් මඟින් පෙන්වා දී ඇති කළ යුතු හා වළක්වා ඇති දේවල් අවධාරණය කරන හදීස් දෙකක් සොයා ලියන්න.

**කණ්ඩායම 2** : ''අසත්‍ය පැවසීමෙන් හා බොරු කීමෙන් වැළකී සිටිය යුතු ය'' යන්න දැක්වෙන හදීසයක් ලියන්න.

**කණ්ඩායම 3** : අධ්‍යාපනය සොයා යෑම පිළිබඳව දැක්වෙන හදීසයක් ලියන්න.

**කණ්ඩායම 4** : කවටනම් පටබැඳීම සම්බන්ධව පවසන හදීස් දෙකක් ලියන්න.

**ගෙදර පරිසරයෙන් :**

අබ්දුල් කාදිර් (රහ්) සත්‍ය කතා කර මං පහරන්නන් (සොරුන්) යහමගට ගත් ආකාරය පිළිබඳ කතා පුවත සොයන්නට යොමු කරවන්න.

**නිපුණතාව 5:0** : නබිවරු, සහාබාවරු, මුතුන්මිත්තන්ගේ ජීවන ක්‍රමය ඉගෙන ඔවුන්ගේ ආදර්ශයන් පිළිගෙන ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 5:1** : මුහම්මද් (සල්) තුමාගේ උපත හා යොවුන්වියට අදාළ තොරතුරු දැන පැහැදිලි කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 2

**ඉගෙනුම් පල** :

- මුහම්මද් (සල්) තුමා උපත ලද අරාබි සමූහය පිළිබඳ පහදයි.
- නබි (සල්) තුමා මුහුණදුන් දුෂ්කරතා පහදයි.
- යොවුන්වියේ දී එතුමා තුළ තිබූ යහගුණාංග ආදර්ශට ගනියි.
- එතුමාගේ යොවුන්වියට අදාළ වූ වැඩිහිටියන් පිළිබඳ තොරතුරු වගු ගත කරයි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**

පියවර 1 :

- නබි (සල්) තුමා උපත ලද සිද්ධිය පවසා සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- පහත සඳහන් කරුණු ඇතුළත් වන සේ සාකච්ඡා කරන්න.
  - මුහම්මද් නබි (සල්) තුමා අරාබියාවේ මක්කා නගරයෙහි උපත ලැබීය.
  - එතුමා උපත ලබන විට පියා මරණයට පත් වී සිටි අතර, අවුරුදු 6 දීම මව මරණය පත්වූවා ය.
  - පසුව සීයාගේ රැකවරණයේ ද, ඉන්පසුව සුළු පියාගේ රැකවරණයේද ජීවත් විය.
  - හලීමා තුමිය කිරි මව වූවාය.
  - ළමා කාලයේ දී සත්‍ය පැවසීම හා විශ්වාසවන්තභාවය එතුමා සතුව පැවති ප්‍රබල යහගුණාංග වෙයි.

පියවර 2

- සිසුන්ව කණ්ඩායම් හතරකට බෙදන්න.
- සෑම කණ්ඩායමකට ම කණ්ඩායම් ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න.
- සෑම කණ්ඩායමක්ම කණ්ඩායම් ක්‍රියාකාරකමෙහි යොදවා මඟපෙන්වන්න.
- කණ්ඩායම් වාර්තාව පන්තිය තුළ ඉදිරිපත් කිරීමට සූදානම් වන ලෙස දැනුම් දෙන්න.

පියවර 3 :

- සෑම කණ්ඩායමකට ම තමන් සාකච්ඡා කළ සියල්ල ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අමතර තොරතුරු ඉදිරිපත් කර විස්තර කිරීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායම්වල වැදගත් අදහස් විමසා ලබා ගන්න.
- පහත කරුණු අන්තර්ගත වනසේ සමීක්ෂණය කරන්න.
  - ආමුල් ෆීල් අර්ථය.
  - අයියාමුල් ජාහිලියියා පසුබිම.
  - මුහම්මද් (සල්) තුමාගේ තරුණවියේ සමාජ ක්‍රියාකාරකම්.

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව :**

**කණ්ඩායම 1** : නබි (සල්) තුමාගේ ජීවිතයට අදාළ වූ නම් සොයා ලියන්න.

**කණ්ඩායම 2** : එතුමාගේ රැකියාව හා එතුමා සතුව තිබූ ගුණාංගයන් ලැයිස්තු ගත කරන්න.

**කණ්ඩායම 3** : එතුමා උපත ලද ස්ථානය, ගෝත්‍රය, බිරිඳ, සංචාරය කළ ස්ථාන සොයා ලියන්න.

**කණ්ඩායම 4** : නබිතුමාගේ විශේෂිත නාමයන් සොයා ලියන්න.

**ගෙදර පරිසරයෙන්** :

නබි (සල්) තුමාගේ උපතට අදාළ සිදුවීමක් සම්බන්ධව දෙමාපියන් සමඟ සාකච්ඡා කර ලියන්නට යොමු කරන්න.

**නිපුණතාව 5:0** : නබිවරු, සහාබාවරු, මුතුන්මිත්තන්ගේ ජීවන ක්‍රමය ඉගෙන ඔවුන්ගේ ආදර්ශයන් පිළිගෙන ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 5:2** : මුහම්මද් (සල්) තුමාගේ යොවුන්වියේ ආදර්ශයන් පහදයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 2

**ඉගෙනුම් පල** :

- මුහම්මද් (සල්) තුමාගේ යොවුන්විය ගත වූ ආකාරය පහදන්න.
- මුහම්මද් (සල්) තුමාගේ හිරා ගුහා ගමන හා එහි ප්‍රතිඵලයන් පහදයි.
- මුහම්මද් (සල්) තුමාගේ ප්‍රචාරය හා එහිදී එතුමා මුහුණදුන් අභියෝග පහදයි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 1** :

- ඇමුණුම 1 හි සඳහන් සිදුවීම සිසුවකු මඟින් කියවීමට සලස්වන්න.
- පහත සඳහන් කරුණු ඇතුළත්වන සේ සාකච්ඡා කරන්න.
    - මුහම්මද් (සල්) තුමාගේ ජීවිතය මක්කා හා මදීනා ජීවිතය ලෙස දෙකට බෙදිය හැකි ය.
    - මක්කා ජීවිතයද නබිත්වයට පෙර හා පසු ලෙස බෙදිය හැකි ය.
    - නබිත්වයට පෙර සිටම නබි (සල්) තුමා සතුව යහගුණාංගයන් පැවතිණි.
    - නබිත්වයට පසු ඉස්ලාමය ප්‍රචාරය කිරීම කෙරෙහි අධික අවධානයක් එතුමා යොමු කළේ ය.

**පියවර 2**

- සිසුන්ව කණ්ඩායම් හතරකට බෙදන්න.
- සෑම කණ්ඩායමකට ම කණ්ඩායම් ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න.
- සෑම කණ්ඩායමක්ම කණ්ඩායම් ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- කණ්ඩායම් වාර්තාව පන්තිය තුළ ඉදිරිපත් කිරීමට සූදානම්වන ලෙස දැනුම් දෙන්න.

**පියවර 3** :

- සෑම කණ්ඩායමකටම කණ්ඩායම් ක්‍රියාකාරකම ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායම්වල වැදගත් අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න
    - නබි (සල්) තුමා සත්ව පාලනය හා ව්‍යාපාර කටයුතු සිදු කළේ ය.
    - එතුමා කදීජා (රළි) තුමියගේ වෙළඳ කණ්ඩායමේ නායකයා විය.
    - පසුව එතුමිය විවාහ කරගත් නබි (සල්) තුමා පවුල් ජීවිතයක් ගත කළේය.
    - සමාජ සංශෝධනයට කැමැත්තෙන් හිරා ගුහාවට ගොස් ධ්‍යාන (භාවනා) කළේය.
    - එතුමා විවිධ දුෂ්කරතාවලට මුහුණ දුන්නේ ය. එයට මුහුණදීම සඳහා විවිධ ක්‍රම අනුගමනය කළේ ය.
    - අවසානයේ දී එතුමා මක්කම නගරයෙන් පිටත් විය. එම සිදුවීම හිජ්රත් යනුවෙන් හැඳින්වේ.

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදාගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව** :

**කණ්ඩායම 1** : නබි (සල්) තුමාගේ යොවුන්විය ගැන කරුණු පහදන්න.

**කණ්ඩායම 2** : නබි (සල්) තුමාට හිරාවේ දී නුබූවතය හිමිවූ අයුරු පහදන්න.

**කණ්ඩායම 3** : නබි (සල්) තුමාගේ ප්‍රථම ප්‍රචාරක කටයුතු පැවති ආකාරය පහදන්න.

**කණ්ඩායම 4** : ධර්ම ප්‍රචාරයේ දී නබි (සල්) තුමා මුහුණදුන් දුෂ්කරතා පහදන්න.

**ගෙදර පරිසරයෙන්** :

නබි (සල්) තුමාට වහී ප්‍රථමයෙන් පහළ වූ ආකාරය නිවසේ වැඩිහිටියන්ගෙන් දැනගෙන කතාවක් ලෙස ලිවීමට යොමු කරවන්න.

**ඇමුණුම 1**

කවිය

විශ්වාසනීය ලැජ්ජාශීලී
සොඳින් වෙළඳාම් කර
යහපත රැස්කර පැමිණ
සොඳ සේ සතුටින් කදීජා
ප්‍රිය කර අපගේ මුහම්මද් තුමාව
විවාහ කර ගත්තාය
තරුණ මුහම්මද් තුමාණෝ
අඥානකමින් වැළකී තනියම
හිරා ගුහාවට ගියේය.
භාවනයේ යෙදී සිටින විට
දිනක් ජිබ්රීල් පැමිණ
පාරායනය කරන්න කියා හඬ නැගුවා
නුඹගේ දෙවිඳුන්ගේ ගරු නාමයෙන්
පාරායනය කරන්න නොදනී කෙලෙස
පාරායනය කරන්නද විමසූ විට එතුමා
නුඹගේ දෙවිඳුන්ගේ ගරු නාමයෙන්
පාරායනය කරන්න යැයි හඬ නැගූ විට
එතුමාණෝ පාරායනය කළහ.
උතුම් වූ නබිත්වය හිමි වී
ලොවේ සැමට නබි වී
සිරස නැමීමට තෝරා පත්වූයේ
නැමදිය යුතු අල්ලාහ්ම වේ
නමදිනු එපා වෙන කිසිවක්
අසමසම දෙවිඳුගේ දූතයා ලෙස
ඔහු මා එවනු ලැබුවායි
නමුදු පාපිවුන් එතුමාණන්ට
කරදර කළා බොහෝ සේ
අපහාස කළා බැන වැද
තායිෆ් නම් නගරයට
පහදාදීමට ඉස්ලාම් ධර්මය
පිය නැගූ විට නබිතුමාණෝ
නරක දරුවන් යලි රැගෙන
පහර දුන්නා අපගේ නබිට
ගලා ගියා රුධිරය
කරදර දුන් සියල්ලන්ට ම
කමා කළා ශ්‍රේෂ්ට නබිතුමාණන්
වැඩිවුණා කරදර පාපීවූවන්ගේ
සඟයන් සමඟ නබිතුමාණෝ
පිය නගලා මදීනාවට
යහමඟ පෙන්වා පැතිරුවා

**නිපුණතාව 5:0** : නබිවරු, සහාබාවරු, මුතුන්මිත්තන්ගේ ජීවන ක්‍රමය ඉගෙන ඔවුන්ගේ ආදර්ශයන් පිළිගෙන ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 5.3** : මුහම්මද් නබි (සල්) තුමාගේ යොවුන්වියේ ආදර්ශයන් පහදයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 2

**ඉගෙනුම් ඵල**
- මුහම්මද් නබි (සල්) තුමා ආදරණීය පුතෙකු, පියෙකු, සැමියෙකු, ගුරුවරයෙකු යහ මඟපෙන්වන්නෙකු බව ඊට අදාළ අවස්ථාවක් උපයෝගි කරගෙන පහදයි.
- එතුමාව සෑම අංශයකම ආදර්ශයක් ලෙස ගෙන කටයුතු කරයි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 1**
- ඇමුණුම 1 සිසුවෙකු මඟින් කියවීමට සලස්වන්න.
- පහත කරුණු ඇතුළත්වන සේ සාකච්ඡා කරන්න.
  - අල්ලාහ්ගේ දූතයා සතුව යහපත් ආදර්ශයන් පවතින්නේ යැයි අල්-කුර්ආන් පවසයි.
  - නබි (සල්) තුමාගේ මඟපෙන්වීම අපට ආදර්ශයන් සපයයි.
  - එතුමාගේ ජීවිතය සෑම කෝණයකටම අදාළ වන්නකි.

**පියවර 2**
- සිසුන්ව කණ්ඩායම් හතරකට බෙදන්න.
- සෑම කණ්ඩායමකට කණ්ඩායම් ගවේෂණ පත්‍රිකා ලබා දෙන්න.
- සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම් නිරීක්ෂණය කරන්න.
- වාර්තාව ඉදිරිපත් කිරීමට සූදානම්වන ලෙස අවවාද කරන්න.

**පියවර 3**
- සාකච්ඡා කොට රැස් කළ අදහස් පන්තිය තුළ ඉදිරිපත් කිරීමට කණ්ඩායමට අවස්ථාව ලබා දෙන්න.
- සෑම කණ්ඩායමකටම තම අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- වැරැදි නිවැරැදි කර ගැනීමට මඟපෙන්වන්න.
- පහත කරුණු අන්තර්ගතවන සේ සාකච්ඡා කරන්න.
  - කුඩා කලදීම දෙමාපියන් අහිමිව කිරි මවවූ හලීමා හදාවැඩූ මව ෆාතිමා බින්ත් සෛද්, සුළුපියා අබූතාලිබ් හට ආදරණීය පුතෙක් විය. එතුමා තම දරුවන්ට ආදරණීය පියෙකු විය. එතුමා ආදරණීය සැමියෙක් විය.
  - එමෙන්ම තම සහාබාවරුන්ට ඉතා හොඳ ගුරුවරයෙක් විය.
  - එමෙන්ම සමාජයට යහ මඟපෙන්වන්නෙකු විය.

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව :**

**කණ්ඩායම 1** :නබි (සල්) තුමා යහපත් පුතෙකු විය යන්න පහදන්න.

**කණ්ඩායම 2** :නබි (සල්) තුමා ආදරණීය පියෙකු විය යන්න පහදන්න.

**කණ්ඩායම 3** :නබි (සල්) තුමා යහපත් සැමියෙක් විය යන්න පහදන්න.

**කණ්ඩායම 4** :නබි (සල්) තුමා යහ මඟ පෙන්වන්නෙකු විය යන්න පහදන්න.

**ඇමුණුම 1**

නබි (සල්) තුමා ප්‍රථම වහිය ලැබීමෙන් කම්පනයට පත්ව නිවසට පැමිණියේය. 'මාව පොරවන්න, පොරවන්න' යැයි බිරිඳවූ කදීජා (රළි) තුමියට පැවසුවේය. ඇය 'ඔබට කුමක්වූවාදැ' යි අසමින්ම පෙරවූවාය. එතුමා හිරා ගුහාවේදී සිදුවූ සිදුවීම පවසා 'මට කුමක්වන්නට යන්නේදැ' යි බියවෙමි යැයි පැවසීය.

එවිට කදීජා (රළි) තුමිය ඔබ දුක් නොවන්න. අල්ලාහ් මත සත්තකින්ම ඔහු ඔබව අතහරින්නේ නැත. එමෙන්ම අපහසුතාවයට පත්කරන්නෙත් නැත. මන්දයත් ඔබ සමීපතයින්ව ළඟින් ආශ්‍රය කරන්නේය. දුක් විඳින්නන්ට උපකාර කරන්නේය. දුප්පතුන්ට උදව් කරන්නේය. අමුත්තන්ට සංග්‍රහය කරන්නේය. එබැවින් ඔබට කිසිදු හානියක් නොවන්නේ යැයි අස්වැසුවාය.

**ගෙදර පරිසරයෙන්**

නබි (සල්) තුමා කුඩා දරුවන්ට ආදර්ශයක් වන ආකාරයට කටයුතු කළ සිදුවීමක් සොයා ලිවීමට යොමු කරන්න.

**නිපුණතාව 5.0** : නබිවරු, සහාබාවරු, මුතුන්මිත්තන්ගේ ජීවන ක්‍රමය ඉගෙන ඔවුන්ගේ ආදර්ශයන් පිළිගෙන ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 5.4** : උම්මහාතුල් මුඃමිනීන්වරියන්ගේ ජීවන ක්‍රමය දැනගෙන පවසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 2

**ඉගෙනුම් පල** :
- නබි (සල්) තුමා හා කදීජා (රළි) තුමියගේ විවාහය සිදුවූ පසුබිම පහදයි.
- ඔවුන්ට ලැබුණු දරුවන්ගේ නම් ලැයිස්තු ගත කරයි.
- කදීජා (රළි) තුමිය ඉස්ලාමයට කළ සේවාව අළලා කථාවක් ඉදිරිපත් කරයි.
- ඇය ඉස්ලාමයට කළ සේවාවන් ආදර්ශයට ගනියි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**

පියවර 1 :
- ඇමුණුම 1 හි සඳහන් සිදුවීම සිසුවෙකු මඟින් කියවීමට සලස්වන්න.
- පහත කරුණු ඇතුළත් වන සේ සාකච්ඡා කරන්න.
  - කදීජා (රළි) තුමිය මක්කාවෙ ජීවත් වූ ධනවත් කාන්තාවකි. ඇගේ සැමියාගේ මරණයන් පසු දරුවන් දෙදනා සමග වැන්දඹු වූවාය. ඉන් පසු ටික දිනකින් ඇගේ පියාද මරණයට පත් විය.
  - එනිසා ඇගේ ව්‍යාපාර කටයුතු සඳහා සුදුසු සහකරුවෙක් බලාපොරත්තු වූවාය.
  - එයට ගැලපෙන්නෙකු ලෙස අල් අමීන් එමෙන්ම අස්සාදික් යනුවෙන් ප්‍රශංසාවට පාත්‍ර වූ නබි (සල්) තුමාව තෝරා ගත්තාය.

පියවර 2
- සිසුන්ව කණ්ඩායම් හතරකට බෙදන්න.
- සෑම කණ්ඩායමකට ම කණ්ඩායම් ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න.
- සෑම කණ්ඩායමක්ම කණ්ඩායම් ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- කණ්ඩායම් වාර්තාව පන්තිය තුළ ඉදිරිපත් කිරීමට සූදානම්වන ලෙස දැනුම් දෙන්න.

පියවර 3 :
- සෑම කණ්ඩායමකට ම කණ්ඩායම් ක්‍රියාකාරකම ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායම්වල වැදගත් අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
  - කදීජා (රළි) තුමිය නබි (සල්) තුමාගේ පළමු බිරිඳ වේ. දෙදෙනා අතර විවාහය සිදුවන විට, නබි (සල්) තුමාගේ වයස අවුරුදු 25 කි. කදීජා (රළි) තුමියගේ අවුරුදු 40 කි.
  - දෙදෙනාගේ විවාහ ජීවිතයෙන් දරුවන් 6 දෙනෙක් සිටිති.
  - නබි (සල්) තුමා සමාජ කටයුතුවල නිරත වන විට කදීජා (රළි) තුමිය තම පූර්ණ සහාය ලබා දුන්නා ය. නබි (සල්) තුමාට වහී පහළ වූ අවස්ථාවේ දී ඇති වූ කම්පනයේදීත් වෙනත් අවස්ථාවලදීත් තම පූර්ණ සහාය ලබා දුන්නා ය.

- එතුමිය ඉස්ලාමය වැළඳගත් පළමු පුද්ගලයා විය.
- තම කාලය හා ධනය ඉස්ලාමය වෙනුවෙන් කැප කළා ය.
- ෂි : බු අබුතාලිබ් හිදී නබි (සල්) තුමා සමඟ කදීජා (රළි) තුමිය සිටියාය. උපකාර කළා ය. එයින් පිටත් වූ වර්ෂය වන නුබූවත් 10 හිදී එතුමිය මිය ගියා ය.
- කදීජා (රළි) තුමියගේ කැප කිරීම් පිළිබඳ ව නබි (සල්) තුමා ඇයගේ මරණයට පසුවත් ප්‍රශංසා කර සිටියේ ය.

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත..

**කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව** :

**කණ්ඩායම 1** : කදීජා (රළි) තුමියගේ ගෘහ ජීවිතය පිළිබඳව පරිච්ඡේදයක් ලියන්න.

**කණ්ඩායම 2** : කදීජා (රළි) තුමිය නබි තුමාට දක්වූ උපකාර හා සහාය පිළිබඳ ව කුඩා රචනයක් ලියන්න.

**කණ්ඩායම 3** : කදීජා (රළි) තුමියගේ ආදර්ශයන් සඳහන් කර ඔබගේ සහෝදරියට ලිපියක් ලියන්න.

**කණ්ඩායම 4** : කදීජා (රළි) තුමිය අනෙක් උම්මහාතුල් මු:මිනීන්වරියට වඩා කෙසේ වෙනස් වන්නේ ද කියා ලියන්න.

**ගෙදර පරිසරයෙන්**

කදීජා (රළි) තුමිය පිළිබඳ ව ඔබ උගත් දේ දෙමාපියන්ට ගෙනහැර පවසා ඔවුන්ගෙන් අමතර තොරතුරු ලබා ගන්නට යොමු කරන්න.

**අමුණුම 1**

නායිකා කදීජාතුමියගේ
යහ වෙළඳ අංශයේ ය
එක සිතින් අවංක බව
කියා පෑවා නායකයිනි
කදීජාගේ ස්වාමියා ලෙසින්
විවාහ දිවියට පිය මැන
නව ශක්තියකින්
ප්‍රසාදය ලැබූ නායකයිනි
ස්ත්‍රී පරපුරේ
ඉහමත් ප්‍රයෝජනය ලෙසින්
නිධානයක මුලසුන ලෙස සිටි
යහපත් ෆාතිමා තුමියව :

**නිපුණතාව 5:0** : නබිවරු, සහාබිවරු, මුතුන්මිත්තන්ගේ ජීවන ක්‍රමය ඉගෙන ගෙන ඔවුන්ගේ ආදර්ශයන් පිළිගෙන ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 5:5** : උම්මහාතුල් මුඃමිනීන්වරියන්ගේ ජීවන ක්‍රමය දැන ගෙන පවසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 2

**ඉගෙනුම් පල** :

- නබි (සල්) තුමා හා අබූබක්කර් (රළි) තුමාගේ පවුල අතර තිබූ සමීපත්වය පහදයි.
- ආයිෂා (රළි) තුමියගේ ගුණාංග ලැයිස්තු ගත කරයි.
- ආයිෂා (රළි) තුමිය ඉස්ලාමය වෙනුවෙන් කළ සේවාවන් හා කදීජා (රළි) තුමිය කළ සේවාවන් සසඳයි.
- ආයිෂා (රළි) තුමියගේ ආදර්ශයන් තම ජීවිතයේ දී අනුගමනය කරයි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**

පියවර 1 :

- ඇමුණුම 1 හි සඳහන් සිදුවීම සිසුවෙකු මඟින් කියවීමට සලස්වන්න.
- පහත කරුණු ඇතුළත්වන සේ සාකච්ඡා කරන්න.
  - ආයිෂා (රළි) තුමිය, ආබුබක්ර් (රළි) තුමා හා උම්මු රූමාන් (රළි) තුමිය යන අඹු-සැමියන්ගේ දියණිය වේ.
  - කුඩා කළ සිටම නබි (සල්) තුමාව දැන සිටියාය.
  - මුස්ලිම් පවුලක ඉපදුණාය.
  - කුඩා කාලයේ දීම ඉස්ලාමීය දැනුමත්, යහ ගතියන් ලබා ගත්තාය.
  - නබි (සල්) තුමාගේ තරුණ බිරිඳ වේ.

පියවර 2

- සිසුන්ව කණ්ඩායම් හතරකට බෙදන්න.
- සෑම කණ්ඩායමකට ම කණ්ඩායම් ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න.
- සෑම කණ්ඩායමක්ම කණ්ඩායම් ක්‍රියාකාරකමෙහි යොදවා මඟපෙන්වන්න.
- කණ්ඩායම් වාර්තාව පන්තිය තුළ ඉදිරිපත් කිරීමට සූදානම් වන ලෙස දැනුම් දෙන්න.

පියවර 3

- සෑම කණ්ඩායමකට ම තමන් සාකච්ඡා කළ සියල්ල ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අමතර තොරතුරු ඉදිරිපත් කර විස්තර කිරීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායම්වල වැදගත් අදහස් විමසා ලබා ගන්න.
- පහත කරුණු අන්තර්ගත වනසේ සමීක්ෂණය කරන්න.
  - ආයිෂා (රළි) නුබුවත් දෙකේ දී මක්කම නගරයේ දී ඉපදුණා ය.
  - දෙමාපියන් හරහා ඉස්ලාමය ඉගෙන ගත්තා ය.
  - කදීජා (රළි) මරුමුවට පත්වූ පසු නබි (සල්) තුමාණන් ආයිෂා (රළි) විවාහ කර ගත්තේ ය.
  - උම්මහාතුල් මුඃමිනීන්වරියන්ගෙන් ඉතා දක්ෂතා ඇත්තියෙකි.
  - නබි (සල්) තුමාගෙන් බොහෝ කරුණු ඉගෙන ගත්තා ය.
  - නබි (සල්) තුමාට දැඩිව ආදරය කළා ය.

- සැහැල්ලු ජීවිතයක් ගත කළ අතර බොහෝ ලෙස දන් දුන්නාය.
- ස්ත්‍රීන්ගෙන් වැඩිම හදීස් රිවායත් කළේ ආයිෂා (රළි) තුමිය ය.
- නබි (සල්) තුමා මරුමුවට පත්වූ පසුවත් ඇය ජීවත්වූවා ය. (මරණය හිජ්රි 58)
- ආයිෂා (රළි) තුමියගෙන් ස්ත්‍රීන්ට බොහෝ ආදර්ශයන් තිබේ.

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව :**

**කණ්ඩායම 1** : ආයිෂා (රළි) තුමියගේ ගතිගුණාංගයන් ගැන සකච්ඡා කර ලියන්න.

**කණ්ඩායම 2** : ආයිෂා (රළි) තුමියගේ ආදර්ශයන් පිළිබඳ සාකච්ඡා කර ලියන්න.

**කණ්ඩායම 3** : ආයිෂා (රළි) තුමිය හා කදීජා (රළි) තුමිය අතර තිබෙන වෙනස්කම් සාකච්ඡා කර ලැයිස්තු ගත කරන්න.

**කණ්ඩායම 4** : නබි (සල්) තුමාගේ මරණයට පසු ආයිෂා(රළි) තුමියගේ ක්‍රියාවන් පිළිබඳ සාකච්ඡා කර ලියන්න.

**ගෙදර පරිසරයෙන්** :

ආයිෂා (රළි) තුමිය හා නබි (සල්) තුමා අතර තිබූ සමීපතම සම්බන්ධතාවය පෙන්නුම් කරන සිද්ධීන් දෙකක් දෙමාපියන් සමඟ සාකච්ඡා කරන්නට යොමු කරන්න.

**නිපුණතාව 5:0** : නබිවරු, සහාබිවරු, මුතුන්මිත්තන්ගේ ජීවන ක්‍රමය ඉගෙන ගෙන ඔවුන්ගේ ආදර්ශයන් පිළිගෙන ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 5:6** : සහාබිවරුන්ගේ ජීවිතයෙන් ආදර්ශයන් වටහාගෙන පිළිපදියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 2

**ඉගෙනුම් පල** :
- සෛද් ඉබ්නු තාබිත් (රළි) තුමාගේ ඉගෙනීම් හැකියාව පහදයි.
- සෛද් ඉබ්නු තාබිත් (රළි) තුමාගේ සේවාව අගයයි
- කුර්ආනය ග්‍රන්ථාරූඪ කිරීමේ සේවය අගයයි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 1** :
- ඇමුණුම 1 හි සඳහන් සිදුවීම සිසුවෙකු මඟින් කියවීමට සලස්වන්න.
- පහත කරුණු ඇතුළත් වන සේ සාකච්ඡා කරන්න.
  - නබි තුමාගේ සහාබාවරු සෑම අංශයකම සම්බන්ධ වූහ.
  - ඔවුන්ගෙන් සමහරු කුර්ආනය ද, තවත් අය හදීස් හා නීති අංශයෙහි ද නිපුණතාවය ලද හ.
  - මින් සෛද් ඉබ්නු තාබින් (රළි) තුමා භාෂා හා කුර්ආනය දැනුමෙන් විශිෂ්ටයකු විය.

**පියවර 2**
- සිසුන්ව කණ්ඩායම් හතරකට බෙදන්න.
- සෑම කණ්ඩායමකට ම කණ්ඩායම් ගවේෂන පත්‍රිකා ලබා දෙන්න.
- සෑම කණ්ඩායමක්ම කණ්ඩායම් ක්‍රියාකාරකම් යොදවා මෙහෙයවන්න.
- කණ්ඩායම් වාර්තාව පන්තිය තුළ ඉදිරිපත් කිරීමට සූදානම් වන ලෙස දැනුම් දෙන්න.

**පියවර 3**
- සෑම කණ්ඩායමකට ම තමන් සාකච්ඡා කළ සියල්ල ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අමතර තොරතුරු ඉදිරිපත් කර විස්තර කිරීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායම්වල වැදගත් අදහස් විමසා ලබා ගන්න.
- පහත කරුණු අන්තර්ගත වනසේ සමාලෝචනය කරන්න.
  - සෛද් ඉබ්නු තාබිත් (රළි) තුමා අන්සාරියක් වෙයි.
  - ළමා කාලයේදීම දෙමාපියන් නැති වූහ.
  - නබි (සල්) තුමා මක්කමෙන් මදීනාවට හිජ්රත් ගිය අවස්ථාවේ දී සෛද් ඉබ්නු තාබිත් (රළි) තුමාට වයස අවුරුදු 10 යි.
  - නබි (සල්) තුමාව මුණගැසීමට පෙර අල්කුර්ආනයේ සූරාවන් 17 ක් කටපාඩම් කරගත්තේ ය.
  - බද්ර් යුද්ධයේදී අත්අඩංගුවට පත්වූවන්ගෙන් ඉගෙන ගත්තේ ය.

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව :**

**කණ්ඩායම 1** : සෙද් (රළි) තුමාගේ කට පාඩම් කිරීමේ හැකියාව පිළිබඳව සාකච්ඡා කර වාක්‍ය කිහිපයක් ලියන්න.

**කණ්ඩායම 2** : සෙද් (රළි) තුමා භාෂා රැසක් ඉගෙන ගැනීම පිළිබඳව සාකච්ඡා කර වාක්‍ය කිහිපයක් ලියන්න.

**කණ්ඩායම 3** : සෙද් (රළි) තුමාගේ අධ්‍යාපනයේ නියැළීම පිළිබඳව සාකච්ඡා කර වාක්‍ය කිහිපයක් ලියන්න.

**කණ්ඩායම 4** : සෙද් (රළි) තුමා විසින් අල්-කුර්ආනය ග්‍රන්ථාරූඪ කිරීම සඳහා එක්රැස් කරන ලද ආකාරය සාකච්ඡා කර ලියන්න.

**ගෙදර පරිසරයෙන්** :

සෙද් ඉබ්නු තාබිත් (රළි) තුමාගේ ජීවිතය තළ ඇති වූ වෙනස දෙමාපියන්ට ගෙනහැර පවසා. එතුමාගේ ජීවිතයේ ඇති වූ වෙනසක් හෝ ඔවුන් ඉගෙන ගත්, දන හැඳිනගත් තවත් කෙනෙකුගේ ජීවිත වෙනසක් අසා ලියා පැමිණෙන්න.

ඇමුණුම 1

**සම්බන්ධීකරණ තොරතුරු**

මුස්ලිම්වරුන්ට පහර දීම සඳහා කුරෛෂිවරු මක්කාවේ සිට මදීනාවට පැමිණෙමින් සිටියහ. මෙම පුවත සැල වූ වහාම මදීනා වැසියෝ සටනට සැරසුණහ. දරුවෙකු ඉනෙහි කුඩුවක් රඳවාගෙන පැමිණියේය. එම කඩුවෙහි තුඩ පොළොවෙහි ගෑවෙමින් තිබුණි.

දරුවන්ව යුද සේනාවට බඳවා නො ගන්නා බව දැනුම් දුන් විට ශෝකයෙන් නැවත හැරී ගියේය. ඔහුගේ ශෝකයට ප්‍රතිකර්මයක් ලෙස ''ඔබ අල්-කුර්ආනය කටපාඩම් කරන්න. එය නබිතුමාට පාරායනය කර පෙන්වන්න. ඒ මඟින් ඔබ ප්‍රයෝජනයක් අත් කර ගනියි.'' කියා කෙනෙකු අවවාද කළේය. එය පිළිගත් දරුවා අල්-කුර්ආනය කටපාඩම් කිරීමට ආරම්භ කළේය.

යුද්ධය අවසන් වී නබිතුමා මදීනාවට නැවත පැමිණි විට, දරුවා තමා කටපාඩම් කරමින් සිටි අල්-කුර්ආනයේ කොටස් කිහිපයක් නබි (සල්) තුමාට පාරායනය කර පෙන්නුවේය. එය දැක සතුටට පත්ව නබිතුමාණෝ එම දරුවාව ලිවීමට, කියවීමට දත් සිරකරුවකුට භාර කළහ. අක්ෂර ඉගෙන ගන්නා මෙන් ආයාචනා කළහ. ඔහුගෙන් ඉගෙන ගත් එම දරුවා පසු කලෙක දී අල්-කුර්ආනය ලිඛිතව ගොනු කිරීමේ සේවයට නායකත්වය දැරුවේය.

ඔහු සෙද් ඉබ්නු සාබිත් (රළි) තුමාය.

**නිපුණතාව 5:0** : නබිවරු, සහාබිවරු, මුතුන්මිත්තන්ගේ ජීවන ක්‍රමය ඉගෙනගෙන ඔවුන්ගේ ආදර්ශයයන් පිළිගෙන ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 5:7** : නබි ආදම් (අලෛ) තුමාගේ ඉතිහාස කතාව පවසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 2

**ඉගෙනුම් පල** :
- ආදම් (අලෛ) තුමාව මවන ලද සිදුවීම පවසයි.
- ආදම්, හව්වා යන දෙදෙනා වැරැදි කළ සිදුවීම කතාවක් ලෙස ගෙන හැර පවසයි.
- එතුමා අල්ලාහ්ගෙන් පව් කමාව අයැදිය ක්‍රමය ගෙන හැර දක්වයි.
- ආදම් (අලෛ) තුමාව මැවීමට පෙර අල්ලාහ් හා මලායිකාවරු අතර සිදුවූ දෙබස අල්-කුර්ආන් වැකි මඟින් ලබා ගෙන ලියා පෙන්වයි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 1** :
- පහත සඳහන් අල්-කුර්ආන් වැකිය හා එහි පරිවර්තනය හඬ නගා පවසන ලෙස සිසුවකුට භාර දෙන්න.

  පල් වූ වියළි හඬ නගන මැටියෙන් අපි මිනිසා මැව්වෙමු. එසේම, (ආදම්ව) පෙර අපි තද ගින්නෙන් ජින්වරුන් මැව්වෙමු. පල් වූ, වියළි හඬ නගන මැටියෙන් මම නියත වශයෙන් මිනිසකු මවන බව (පරමාධිපති) මලක්වරුන්ට කී අවස්ථාව සිහිපත් කරනු. එලෙස, මා ඔහු අංග සම්පූර්ණව මවා මගේ ආත්මයෙන් ඔහු ප්‍රාණවත් කළ කල්හි නුඹලා ඔහුට සුජුද් (නමස්කාර) කරමින් දණින් වැටෙනු. (15:26-27)
- පහත කරුණු ඇතුළත් වන සේ සාකච්ඡා කරන්න.
  - ප්‍රථම මිනිසා ආදම් (අලෛ) තුමාය.
  - අල්ලාහ් ඔහුව පසෙන් මැව්වේය.
  - පොළොවේ ඔහුගේ නියෝජිතයා ලෙස පත් කළේය.
  - ඔහුගේ පරම්පරාව මිනිස් කුලය වේ.
  - ඔහු බොහෝ කාලයක් ජීවත් විය. පරම්පරා තුනක් දැක ගත්තේය.

**පියවර 2** :
- සිසුන්ව කණ්ඩායම් හතරකට බෙදන්න.
- කණ්ඩායම් ගවේෂණ පත්‍රිකාව ලබාදෙන්න.
- අවශ්‍ය ඩිමයි කඩදාසි ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම අවධානය කර මෙහෙයවන්න.
- වාර්තාව ඉදිරිපත් කිරීමට සූදානම් වන ලෙස අවවාද කරන්න.

**පියවර 3** :
- සෑම කණ්ඩායමකට ම කණ්ඩායම් ක්‍රියාකාරකම ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායම්වල වැදගත් අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- වැරැදි නිවැරැදි කර මඟ පෙන්වන්න.

- පහත කරුණු අන්තර්ගත වන පරිදි සාකච්ඡා කරන්න.
  - අල්ලාහ් මිනිසාව මැවීමට සූදානම් වුණේය.
  - මලාඉකාවරුන්ගෙන් අදහස් විමසූ විට, ඔවුහු ආශ්චර්යයට පත් වුණ අතර ඊට හේතුව ද දැනුම් දුන්හ.
  - නමුදු, අල්ලාහ් ආදම් (අලෛ) තුමාව හා ඔහුගේ ජෝඩුව ද මැව්වේය. මලාඉකාවරුන්ව සුජුද් කිරීමට සැලැස්සුවේය.
  - එතුමාව ස්වර්ගයේ නැවත්වූවේය. එහි දී එතුමා අඥානයෙන් අල්ලාහ්ගේ විධානයන් පැහැර හැරියේය. පසුව කමා අයැදුවේය.
  - අල්ලාහ් එතුමාව පොළොවට එවනු ලැබුවේය.
  - එතුමාට පරම්පරාවක් ඇති කළේය.
  - අද ජීවත්වන සියල්ලෝම එතුමාගේ පරම්පරාව වේ.
  - එතුමාව ''අබුල් බෂර්'' මිනිසාගේ පියා යනුවෙන් හඳුන්වනු ලැබේ.
  - මිනිසාට මඟපෙන්වීමට අල්ලාහ් කාලයෙන් කාලයට රසූල්වරු යැව්වේය.

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව :**

**කණ්ඩායම 1** : ආදම් (අලෛ) තුමා මවන ලද සිදුවීම පිළිබඳව ''ඉරෛතුදර්කල්'' නම් ග්‍රන්ථයෙන් තොරතුරු එක් රැස් කර ලියා ප්‍රදර්ශනය කරන්න.

**කණ්ඩායම 2** : එතුමාව ෂෙතාන් වැරැදි මඟට ගත් ආකාරය අල්-කුර්ආන් පරිවර්තනය මඟින් හෝ ග්‍රන්ථ මඟින් ලබාගෙන තොරතුරු රැස්කර ලියා ප්‍රදර්ශනය කරන්න.

**කණ්ඩායම 3** : එතුමා අල්ලාහ්ගේ පව් කමාව අයැදිය ආකාරය පවසන අල්-කුර්ආන් වැකිය සොයා එය අක්ෂර කලාවට අනුව ලියා ප්‍රදර්ශනය කරන්න.

**කණ්ඩායම 4** : මලක්වරු මිනිසාව මැවීමට අනවශ්‍යය, යන්න පැවැසීමට හේතුව හා ෂෙතාන් සුජුද් නොකිරීම උදෙසා පැවසූ හේතුව අල්-කුර්ආන් පරිවර්තනය මඟින් හෝ වෙනත් ග්‍රන්ථ මඟින් තොරතුරු රැස් කර පිළිවෙළට ලියා ප්‍රදර්ශනය කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

ආදම් (අලෛ) තුමා ෂෙයිතාන්ගේ උගුලට හසුවී පසුව පව් කමාව අයැදී සිදුවීම කථාවක් ලෙස ඉදිරිපත් කරන්නට යොමු කරන්න.

**නිපුණතාව 6:0** : ආර්ථිකය සම්බන්ධ ඉස්ලාමීය උපදෙස් හා පවුල් ජීවිතය සම්බන්ධ ඉස්ලාමීය අදහස් වටහාගෙන ඒවා ජීවිතය තුළ ක්‍රමවත්ව පිළිපදියි.

**නිපුණතා මට්ටම 6:1** : අසල්වාසීන්ගේ සබඳතාව රැකගනිමින් ක්‍රියා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 2

**ඉගෙනුම් පල** :
- අසල්වැසියන් කවුද යන්න අර්ථකථනය කරයි.
- අසල්වාසීන්ගේ විශේෂතාවය දැන ගරු කරයි.
- අසල්වාසීන්ගේ අයිතිවාසිකම් ගරු කොට ක්‍රියා කරයි.
- අසල්වාසීන් සමඟ හොඳ සම්බන්ධතාවයක් පවත්වා ගෙන ඔවුන්ගේ ගෞරවය ආරක්ෂා කරයි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 1** :
- ඇමුණුම 1 හි සඳහන් කුර්ආන් වැකිය අලංකාරවත් ලෙස පාරායනය කරන සිසුවෙකු මඟින් පාරායනය කර පෙන්වන්න. තවත් සිසුවෙකු මඟින් එහි පරිවර්තනය කියවා පෙන්වන්න.
- පාරායනය කර පෙන්වන ලද වාක්‍යය මඟින් සිසුන් කුමක් වටහා ගත්තේ ද කියා විමසා අදහස් හුවමාරු කර ගන්න.
- පහත කරුණු ඇතුළත් වන සේ සාකච්ඡා කරන්න.
  - අසල්වාසීන් යන්නට අර්ථකථනයන් රැසක් ඇත.
  - අසල්වාසීන් පිළිබඳ අර්ථකථනයන් අල්-කුර්ආන් හා හදීස් පැහැදිලි කර ඇත.
  - අසල්වාසීන්ට විශේෂතා රැසක් ඇත.
  - නිතර ආශ්‍රය කිරීමටත් සෙනෙහස පෑමටත් හිමිකම ඇත්තේ අසල්වාසීන්ටය.
  - අසල්වාසීන්ගේ හැඟීම්වලට ගරු කොට, අයිතිවාසිකම් ලබා දීම යහපත් ක්‍රියාවකි.

**පියවර 2** :
- සිසුන්ව කණ්ඩායම් හතරකට බෙදන්න.
- සෑම කණ්ඩායමකට ම කණ්ඩායම් ගවේෂණ පත්‍රිකාව ලබා දෙන්න.
- සෑම කණ්ඩායමක්ම කණ්ඩායම් ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- කණ්ඩායම් වාර්තාව පන්තිය තුළ ඉදිරිපත් කිරීමට සූදානම් වන ලෙස දැනුම් දෙන්න.

**පියවර 3** :
- සෑම කණ්ඩායමකට ම තමන් සාකච්ඡා කළ දෑ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අමතර තොරතුරු ඉදිරිපත් කර විස්තර කිරීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායම්වල වැදගත් අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු අන්තර්ගත වන පරිදි සාකච්ඡා කරන්න.
- ඉස්ලාමීය පවුල් සීමාවෙහි අසල්වාසීන් ද අන්තර්ගත වේ.

- මුස්ලිම්වරයෙකුගේ නිවෙසේ සිට සෑම දිශාවකම ඇති නිවාස 40ක් අසල්වාසී නිවාස යන සීමාවෙහි අඩංගුය.
- අසල්වාසීන් කොටස් තුනක් අඩංගු කෙරේ.
  - මුස්ලිම් වූ ඥාති වන අසල්වාසීන්
  - ඥාතීන් නොවන මුස්ලිම් අසල්වාසීන්
  - මුස්ලිම් නොවන ඥාති නොවන අසල්වාසීන්
- නිතර අප සමඟ සමීප ව ආශ්‍රය කරන්නත් අසල්වාසීන් ලෙස සැලකේ.
- ගමනක නියැළෙන සමීප මගීන්, පන්ති තුළ සමීප මිතුරන්, සලාතයේ දී ළඟ සිටගෙන සිටින්නා යන බොහෝ අය අසල්වාසීන් යන්නට අන්තර්ගත වේ.
- ''තම අසල්වාසීන් අතරින් සමීපව සිටින්නන්ට වඩා දුර සිටින්නන්ට වැඩි වැදගත්කමක් නොදක්වන්න. පළමුව සමීපව සිටින්නාටය, පසුව දුර සිටින්නාට උපකාර කළ යුතුය.'' (අල්අදබුල් මුෆ්රත්)
- ''යමෙකුගේ අයහපතින් අසල්වාසීන් සැනසුනම නොලැබුවේද ඔහු ස්වර්ගයට ඇතුළු නොවේ. (මුස්ලිම්)
- අසල්වාසීන් අපට කරදර කළ ද පලි නොගෙන ඉවසීමෙන් ඔහුට උපකාර කිරීම ඉස්ලාමීය දේශනාවන් වේ.
- අසල්වාසීන් කරදරයට පත්වුවහොත් උදව් කිරීම, ඔවුන්ගේ සතුටෙහි තමන් සහභාගීවීම, ඔවුන්ගේ දුකේදී තමන් ඔවුන්ට සැනසීමක්වීම වැදගත්ය.

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදාගත හැකිය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

وَاعْبُدُوا اللَّهَ وَلَا تُشْرِكُوا بِهِ شَيْئًا ۖ وَبِالْوَالِدَيْنِ إِحْسَانًا وَبِذِي الْقُرْبَىٰ وَالْيَتَامَىٰ
وَالْمَسَاكِينِ وَالْجَارِ ذِي الْقُرْبَىٰ وَالْجَارِ الْجُنُبِ وَالصَّاحِبِ بِالْجَنبِ وَابْنِ السَّبِيلِ
وَمَا مَلَكَتْ أَيْمَانُكُمْ ۗ إِنَّ اللَّهَ لَا يُحِبُّ مَن كَانَ مُخْتَالًا فَخُورًا

ඇමුණුම 1

''ඒකයා වූ අල්ලාහ්වම නමදින්න. ඔහුට කිසිවක් සමාන නොකරන්න. දෙමාපියන්ට තුති පුදන්න. (එසේම) ඥාතීන්ටත්, අනාථයන්ටත්, දුගීන්ටත්, අසල්වාසී නිවෙසේ සිටින ඥාතීන්ටත්, අන්‍ය අසල්වාසීන්ටත්, (සැමවිටම) ඔබ සමඟ සිටින යහලුවන්ටත්, මගීන්ටත්, ඔබ සතු වහලුන්ටත් (සෙනෙහසින් තුති පුදන්න) යමෙකු ආඩම්බරයෙන් අහංකාරව ක්‍රියා කරන්නේ ද ඔහු නියත වශයෙන් ම අල්ලාහ්වම සෙනෙහස නොදක්වයි.'' (4:35)

**කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව :**

**කණ්ඩායම 1** : ඇමුණුම 1 හි සඳහන් 4:35 අල්-කුර්ආන් වැකියෙහි පරිවර්තනය හොඳින් සාකච්ඡා කර අසල්වාසීන්ගේ කොටස් හඳුනාගෙන ලියන්න.

**කණ්ඩායම 2** : පහත සඳහන් හදීස් තුන කියවන්න. පසුව ඒවා සාකච්ඡා කර අසල්වාසීන්ගේ විශේෂත්වය පිළිබඳ ව රචනාවක් සූදානම් කරන්න.

- ''යහපත් අසල්වාසීන් සිටීමත්, විශාල නිවසක් හා හොඳ වාහනයක් තිබීමත් මෙලොව මුස්ලිම්වරයෙකුගේ ජීවිතය දියුණුවීමේ ලක්ෂණයකි.'' (අහ්මද්)
- අල්ලාහ්ගේ දැක්මට අනුව යහපත් අසල්වාසීන් කවුරුන්ද යත් තම අසල්වාසීන්ට යහපත්ව සිටින්නා වේ. (තිර්මිදි)
- යමෙකු අල්ලාහ්ව හා පරමාන්ති දිනය විශ්වාස කරන්නේ ද ඔහු අසල්වාසීන් සමඟ යහපත්ව හැසිරෙන්නාවේ. (බුහාරි)

**කණ්ඩායම 3** : අසල්වාසීන් සමඟ සමඟිය ශක්තිමත් කර ගන්නා මාර්ග පිළිබඳ ව සාකච්ඡාවක් ලියන්න.

**කණ්ඩායම 4** : ඔබගේ අසල්වාසී නිවසෙහි වාසය කරන මුස්ලිම් වන ඥාතීන් හෝ ඥාතීන් නොවන මුස්ලිම්වන අසල්වාසීන් සමඟ යහපත් සබඳතාවක් පවත්වාගත හැකි ක්‍රමෝපායන් සාකච්ඡා කර ලියන්න.

**කණ්ඩායම 5** : ඔබගේ නිවස අසල වාසය කරන මුස්ලිම් නොවන අසල්වාසීන් සමඟ හොඳ සබඳතාවක් වර්ධනය කර ගත හැකි ක්‍රමෝපායන් සාකච්ඡා කර ලියන්න.

**ගෙදර පරිසරයෙන් :**

මෙම සතියේ දින පහ තුළ ඔබ අසල්වාසීන්ට ඉටු කරන ලද උදවු හා සහයෝගයන් පිළිබඳ ලැයිස්තුවක් සූදානම් කිරීමට යොමු කරන්න.

| දිනය | ඉටු කළ උදව් |
|---|---|
| පළමු දින | .................................................................................................. |
| දෙවන දින | .................................................................................................. |
| තෙවන දින | .................................................................................................. |
| සිව් වන දින | .................................................................................................. |
| පස් වන දින | .................................................................................................. |

| | | |
|---|---|---|
| **නිපුණතාව 7:0** | : | සියලුම අංශ සම්බන්ධයෙන් ඉස්ලාමයට ආවේණික දැක්මක් ඇත යන්න වටහාගෙන ඒ පදනමින් සියල්ලම අරමුණු කර ගෙන ක්‍රියා කරයි. |
| **නිපුණතා මට්ටම 7:1** | : | පරිසරය රැකගැනීමේ ක්‍රියාවලියෙහි නියැලෙයි. |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | : | 4 |
| **ඉගෙනුම් පල** | : | • පරිසරය ආරක්ෂා කළ යුතුය යන්නට හේතු දැනගෙන පවසයි.<br>• පරිසරය රැකගත හැකි ක්‍රමෝපායන් සොයා බලා පවසයි.<br>• පරිසරයේ පිරිසිදුකම රැකගැනීම ෆර්ලු කිෆායා යැයි පිළිගෙන ක්‍රියා කරයි.<br>• පරිසරය රැකගැනීමේ ක්‍රියාවලියෙහි නියැලෙයි. |

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර 1** :

- පහත සඳහන් පුවත්පත් තොරතුරු සිසුවෙකු මඟින් කියවීමට සලස්වන්න.
    - ඩෙංගු මර්දන සැලැසුම යටතේ අවට පරිසරය පිරිසිදු කිරීමේ ශ්‍රමදාන සේවාව.
    - කර්මාන්තවල අපවිත්‍ර ජලය ගංගාවලට මුදා හැරීම නිසා ප්‍රදේශ ජනයාගේ විරෝධතා පෙළපාලිය.
    - විෂ වායුන් නිසා ඕසෝන් තරයට බලපෑම්.
    - පොලිතින් භාවිතය වළක්වන රාජ්‍ය ක්‍රියාමාර්ග.
- අනෙක් සිසුන්ට සවන්දීමට සලස්වන්න.
- පරිසරය පිරිසිදුව තබාගැනීමේ අවශ්‍යය, යන හැඟීම ඇති කරන්න.
- පහත කරුණු අවධාරණය කරන්නාක් මෙන් සාකච්ඡා කරන්න.
- අවට පරිසරය අල්ලාහ්ගේ මහඟු දායාදයකි.
- පරිසරය යැයි කියන විට, අප වටා ඇති ජීවීන්, ශාක, සුළඟ, ජලය, පස යනාදි ස්වභාවික අංග සියල්ලම එහි අන්තර්ගත වේ.
- මිනිසාගේ ක්‍රියාකාරකම් හේතුවෙන් පරිසරය දූෂණය වේ.
- අප මුස්ලිම්වරු වශයෙන් පරිසරය ආරක්ෂා කිරීම ධාර්මික මෙන්ම ආගමික වගකීමවේ.

**පියවර 2** :

- සිසුන්ව කණ්ඩායම් පහකට බෙදන්න.
- සෑම කණ්ඩායමකටම කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම ස්ථිර කරන්න.

**පියවර 3** :

- සෑම කණ්ඩායමකටම තම ක්‍රියාකාරකම් පත්‍රිකාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- වැරැදි නිවැරැදි කරගැනීමට ප්‍රථමයෙන් එම කණ්ඩායමටම අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායම්වල වැදගත් අදහස් විමසා ලබාගන්න.
- පහත කරුණු අන්තර්ගත වන පරිදි සකච්ඡා කරන්න.

- මිනිසා භූමිය තුළ අල්ලාහ්ගේ නියෝජිතයා යැයි අල්-කුර්ආන් පවසන්නේය. එම නිසා භූමිය ආරක්ෂා කිරීම මිනිසාගේ වගකීමකි.
- පරිසරය ආරක්ෂා කිරීම මඟින් මිනිසා භූමිය ආරක්ෂා කරන්නේය.
- පරිසරය ආරක්ෂා කිරීමෙහි පදනම වන්නේ ස්වාභාවික පරිසරයට සෙනෙහස දැක්වීමයි.
- අපගේ පරිසරයේ ඇති ජීවීන්, ශාක, ජලය ඇති ස්ථාන, අප භාවිත කරන භාණ්ඩ, පොදු ස්ථාන සියල්ලම වෙත අප සෙනෙහස දැක්වීමට පුරුදු විය යුතුය.
- පරිසරයට අප ඉටු කළ යුතු යුතුකම් රැසක් ඇත.
  - මිනිසාට අනතුරුදායක නොවන ජීවීන් පිරි පරිසරයක් ආරක්ෂා කිරීම.
  - පරිසරය තුළ ප්‍රයෝජනවත් ශාකයන් විනාශ නොකිරීම.
  - ශාක සිටුවා පරිසරයේ සාරවත් බව ආරක්ෂා කර ගැනීම.
  - පරිසරයේ ඇති ජලය රැඳෙන ස්ථාන පිරිසිදුව තබා ගැනීම.
  - මහාමාර්ග අපිරිසිදු කරන ක්‍රියාකාරකම් වැළැක්වීම.
  - පොලිතින්, ප්ලාස්ටික් යනා දී ද්‍රව්‍ය පස සමග මිශ්‍ර නොවන ලෙස පසෙහි සරුබව රැකගනිමු.
- ජලය රැඳෙන ස්ථානවලත්, සෙවණ ලබා දෙන ශාකයටත් හානි කරන ද්‍රව්‍ය හා මලපහ කිරීම නබි (සල්) තුමා වැළැක්වීය.
- වර්තමානය වන විට පරිසරය දූෂණය වී ඇති නිසා අපි විවිධ පාරිසරික ගැටලු අත් විඳින්නෙමු.
  - ස්වාභාවික පරිසරයේ සමබර බව
  - ඩෙංගු වැනි රෝග
  - ස්වභාවික අනතුරු වැඩිවීම.
  - සයුරේ හා පොළොවේ වාසය කරන ජීවීන් විනාශ වීම.
- මෙවැනි ගැටලු ඇති වීමට හේතුව මිනිසා වේ.
- පරිසරය ආරක්ෂා කර ගැනීම ෆර්ලු කිෆායා වේ.
- මිනිසාට හානි ගෙන ද්‍රව්‍ය ඉවත් කිරීම නබි (සල්) තුමා ඊමානය සමඟ සම්බන්ධ කොට පැවසූහ.
- පරිසරය අපිරිසිදු කරන අපද්‍රව්‍ය ඉවත්කිරීමෙහිලා අප අලංකාර ක්‍රමෝපායන් අනුගමනය කළ යුතුය.
  - අපද්‍රව්‍ය කසල බඳුන්වලට දැමීම.
  - කසල ප්‍රතිශක්තිකරණය කර නැවත භාවිතයට ගැනීම.
- පරිසරය ආරක්ෂා කිරීමේ සැලැසුම්වලට ආගම්, ජාති භේද නොමැතිව අප සමඟියෙන් ක්‍රියා කළ යුතුය.
- පරිසරය යැයි කියන විට අපගේ නිවාස අවට පරිසරය, යනාදිය වැදගත් වේ. මෙම අවට පරිසරය අපි සැමවිටම පිරිසිදුව හා අලංකාරවත් ලෙස තබා ගත යුතුය.

**ගුණාත්මක යෙදවුම් :** පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව :**

**කණ්ඩායම 1** : ගේ දොර වටපිටාව, දේවස්ථාන අවට පරිසරය, පාසල් පරිසරය යනාදිය අලංකාරව තබා ගන්නා ආකාරය සාකච්ඡා කර ලියන්න.

**කණ්ඩායම 2** : පරිසරය රැකගැනීමේ ක්‍රමෝපායන් ලියන්න.

**කණ්ඩායම 3** : පරිසරය රැකගැනීම සම්බන්ධ අල්-කුර්ආන්, හදීස් සාක්ෂි තර්ජුමතුල් කුර්ආන් හා රියාලුස් සාලිහීන් මඟින් එක්රැස් කරන්න.

**කණ්ඩායම 4** : බිත්ති පුවතක් සූදානම් කිරීමට පරිසරය පිළිබඳ හැඟීමක් ඇති කරන වැකි පහක් සාකච්ඡා කර ලියන්න.

**ගෙදර පරිසරයෙන් :**

ඔබගේ නිවස අසල අපිරිසිදුව දක්නට ලැබෙන ප්‍රදේශ (වතුපිටි, ජලය රැඳෙන ස්ථාන,වල්වැදීම, කාණු පද්ධති) දෙමාපියන් සමඟ එක්ව පිරිසිදු කර ඒ පිළිබඳව වාර්තාවක් සකස් කරන්න.

**නිපුණතාව 7:0** : සියලුම අංශ සම්බන්ධයෙන් ඉස්ලාමයට ආවේණික දැක්මක් ඇත යන්න වටහා ගෙන ඒ පදනමින් සියල්ලම අරමුණු කර ගෙන ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 7:2** : ජීවීන් වෙත සෙනෙහස දක්වමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 3

**ඉගෙනුම් පල** :

- ජීවීන් අපගේ පරිසරයට අත්‍යවශ්‍යය අංග යැයි දැනගෙන පවසයි.
- සුරතුන් නහ්ල් හි සඳහන් වන ජීවීන්ගේ ප්‍රයෝජන පවසන වාක්‍ය එක් රැස් කරයි.
- ජීවීන් අප වැන්නවුන්ය. ඔවුන් වෙත සෙනෙහස දැක්විය යුතුය යන්න පිළිගනියි.
- ජීවීන්ව ආරක්ෂා කර හදා වඩා ගනියි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**

පියවර 1 :

- ඇමුණුම 1 හි සඳහන් ඓතිහාසික සිදුවීම සිසුවෙකු මගින් කියවා පෙන්වන්න.
- ජීවීන්ට සෙනෙහස දැක්වීමෙන් ලැබෙන ප්‍රයෝජන පහදන්න.
- පහත කරුණු ඇතුළත් වන සේ සාකච්ඡා කරන්න.
    - ජීවීන් සියල්ලන්ටම අපට මෙන් හැඟීම් ඇත.
    - අල්ලාහ් ඒවා යහපත උදෙසා මැව්වේය.
    - නබිවරු ජීවීන්ට අධික සෙනෙහසක් දැක්වූහ.
    - ජීවීන් වෙත සෙනෙහස දක්වා උන්ව හදාවඩා ගැනීම ඊමාන් සම්බන්ධ කරුණකි.

පියවර 2 :

- සිසුන්ව කණ්ඩායම් පහකට බෙදන්න.
- කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රය ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම අහවරවූ වහාම වාර්තාව ඉදිරිපත් කිරීමට සූදානමින් සිටින ලෙසට දැනුම් දෙන්න.

පියවර 3 :

- සෑම කණ්ඩායමකට ම වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අමතර තොරතුරු ඉදිරිපත් කර විස්තර කිරීමට පළමුව එම කණ්ඩායමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායම්වලින් වැදගත් අදහස් විමසා ලබාගන්න.
- පහත කරුණු පදනම් කොටගෙන සාකච්ඡා කරන්න.
    - අල්ලාහ් මිනිසාට මෙන්ම ජීවීන්ටත් හැඟීම් ලබා දෙයි.
    - උන්ට සෙනෙහස, ශෝකය, සතුට යන හැඟීම් ඇත.
    - ජීවීන්ට තම හැඟීම් වචනයෙන් ප්‍රකාශ කළ නොහැකි බැවින් උන්ව ආරක්ෂා කර රැකගැනීම අපගේ වගකීමකි.
    - ජීවීන් යන කරුණෙහි අප අල්ලාහ්ට බිය බැති විය යුතුය.
    - ජීවීන්ගේ හැඟීම්වලට ගරු කොට අල්ලාහ්ගේ හා ඔහුගේ දූතයාගේ මඟපෙන්වීමට අනුව අප ක්‍රියා කළ යුතුය.
    - ජීවීන්ට හිරිහැර කිරීම, ඒවා විනාශ කිරීම ඉස්ලාම් පිළිකුල් කරන අශිෂ්ටසම්පන්න ක්‍රියාවකි.

- ජීවීන් මගින් මිනිසා ප්‍රයෝජන රැසක් ලබාගත්තේය.
- අල්-කුර්ආනයේ පරිච්ඡේද කිහිපයක් ජීවීන්ගේ නමින් හඳුන්වනු ලැබේ. උදා :- අන්ආම්, නම්ල්, බකරා, නහ්ල්
- අල්ලාහ් කරුණු කාරණා රැසක් උදෙසා ජීවීන් මැව්වේය.
  - මිනිසාගේ රසාස්වාදය උදෙසා
  - මිනිසාගේ අවශ්‍යතාව උදෙසා
  - මිනිසාගේ ආහාර උදෙසා
  - පරිසර සමතුලනය උදෙසා
  - පරිසර පවිත්‍රතාවය උදෙසා
- සූරතුල් නහ්ල් හි ජීවීන් පිළිබඳ ව වාක්‍ය රැසක් ඇත.
- ජීවීන්ගේ ප්‍රයෝජන පිළිබඳ ව අවධානය යොමුකොට අප උන්ගේ කාර්යයන්හි ක්‍රියා කළ යුතුය.
- නබි (සල්) තුමා ජීවීන්ගේ හැඟීම් වටහා ගෙන ක්‍රියා කළහ.
- කඳුළු සලන ඔටුවෙකු දැක ඊට හේතුව දැනගත් නබි (සල්) තුමා ඌට දරා ගත නොහැකි බර නොපටවන ලෙස පවසා උගේ හිමිකරුට අවවාද කළහ.
- පිපාසිත සුනඛයකුට ජලය සැපයූ හේතුවෙන් පව්කාර ගැහැනියකු සමාව ලබා ස්වර්ගයට ඇතුළු වූ බවත්, පූසෙකුට ආහාර, ජලය ලබා නොදී ගැට ගසා තැබූ කාන්තාවක් නිරයට ඇතුළු වූ බවත් නබි (සල්) තුමාණෝ පැවැසූහ.
- නබි (සල්) තුමා සේම සහාබිවරු ජීවීන් වෙත සෙනෙහස දැක්වූ බවට බුස්තාද් සිදුවීම කදිම නිදසුනකි.

ඇමුණුම 1

**ඓතිහාසික සිදුවීම**

හස්රත් අම්ර් ඉබ්නු ආස් (රළි) තුමා නබිතුමාගේ යහලුවෙකි. මොහු ශ්‍රේෂ්ඨ සටන්කරුවකු ලෙසත් සේනාධිපතිවරයකු ලෙසත් දිස්වුණේය. කලීෆා උමර් (රළි) තුමාගේ කාලයේ දී මොහුගේ නායකත්වයෙන් ඊජිප්තුව යටත් කර ගත්තේය. එවිට, ඊජිප්තුවේ එක ප්‍රදේශයක කූඩාරම් ගසා ගෙන රැඳී සිටියේය. දින කිහිපයකට පසු වෙනත් ප්‍රදේශයකට යෑමට සිදු වූ බැවින් කූඩාරම ගැලවීමට ගියේය. එහි මුදුනේ පරවියෙකු කූඩු තනා ගෙන සිටින බව දුටුවේය. එම නිසා, පරෙවි කූඩුව නො කඩා කූඩාරම එම ස්ථානයේ ම අතහැර ගියේය. පසු කලෙක එම කූඩාරම අවට සිටි ජනයා එහි පදිංචි වූහ. පසුව එය නගරයක් ලෙසට වර්ධනය විය. ජනයා එම නගරය ''පරවි කූඩු'' යන අදහස ගෙන දෙන 'බූස්තාද්' යන නමින් හඳුන්වන්නට විය. වර්තමානයේ දී බූස්තාද්, ඊජිප්තුවේ වැදගත් නගරවලින් එකක් ලෙස දිස්වේ.

**ගුණාත්මක යෙදවුම්** : පොදු උපදෙස් අනුව ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරුභවතාට නිදහස ඇත.

**කණ්ඩායම් ගවේෂණ උපදෙස් පත්‍රිකාව :**

**කණ්ඩායම 1** : ජීවීන් නිසා අපටත් පරිසරයටත් ලැබෙන ප්‍රයෝජන පහක් උදාහරණ සමඟ ලියන්න.

**කණ්ඩායම 2** : සුරතුන් නහ්ල්හි ජීවීන් පිළිබඳ පවසන පහත සඳහන් දේව වැකි එක් රැස් කරන්න. (5, 6, 7, 8)

**කණ්ඩායම 3** : සුරතුන් නහ්ල් හි ජීවීන් පිළිබඳ පවසන පහත සඳහන් දේව වැකි එක් රැස් කරන්න. (66, 67, 68, 69)

**කණ්ඩායම 4** : පරිසරය තුළ ජීවීන් හා අප කෙසේ හැසිරිය යුතුද යන්න, සාකච්ඡා කර ලියන්න.

**ගෙදර පරිසරයෙන්**

පරිසරය තුළ දක්නට ලැබෙන ජීවීන් ලැයිස්තුගත කරන්න. ඒ අතරින් එක් ජීවියකු හදා වඩා ගන්නා ආකාරය පිළිබඳ ව වැකි දහයක් ලියන්න.

**විවිධ සහය**

**කාර්යාලීය කටයුතු** : එස්. සී. ප්‍රියදර්ශනී මහත්මිය
කළමනාකරණ සහකාර
ජාතික අධ්‍යාපන ආයතනය

ඩයස් අමරසිංහ මහතා
කාර්යාල ආධාරක
ජාතික අධ්‍යාපන ආයතනය